# වාර්ෂික වාර්තාව

# 2011

## ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

# අන්තර්ගතය


| | පිටුව |
|---|---|
| • අධිකාරිය පිහිටුවීම, දැක්ම හා මෙහෙවර | 02 |
| • අධිකාරියේ පරමාර්ථ, බලතල සහ කාර්යභාරය | 02-03 |
| • බල ප්‍රදේශය, අධ්‍යක්ෂ මණ්ඩලය හා පරිපාලන ව්‍යුහය | 04-07 |
| • සභාපති/අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය | 08-12 |
| • විගණන හා කළමණාකරණ කමිටු සභාපතිගේ වාර්තාව | 13-15 |
| • 2011 වසරේ සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය | 16-50 |
| • විගණකාධිපති වාර්තාව | 51-61 |
| • 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව වාර්තාව | 62-63 |
| • 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව | 64 |
| • 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය | 65 |
| • 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 66 |
| • ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් | 67-73 |
| • ගිණුම් පිළිබඳ සටහන් | 74-81 |
| • ගිණුම්වලට අදාල උපලේඛණ | 82-91 |
| • මූල්‍ය සමාලෝචනය 2005-2011 | 92-99 |

# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව - 2011

## අධිකාරිය පිහිටුවීම

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, 1996 අංක 18 දරණ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත නම් වන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලද රාජ්‍ය අධිකාරියකි.

## දැක්ම හා මෙහෙවර

### දැක්ම

අපගේ දැක්ම වනුයේ, "තරුණ තරුණියන්හට ආකර්ශණීය හා අභියෝගාත්මක ඉඩප්‍රස්ථා සළස්වමින්, වේගවත්ව වර්ධනයවන ආසියානු පැසිෆික් කළාපයට, පිවිසුම් මාර්ගයක් ලෙස මෙම ප්‍රදේශය විවෘත කරමින්, පාරිසරික ලෙස ධරණීය සහ සංස්කෘතිකමය වශයෙන් උද්දීපනය වූ පරිසරයක්තුළ, ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වූ දක්ෂිණ ලංකාවක් නිර්මාණය කිරීමයි"

### මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ, "අභියෝගාත්මක ඉඩප්‍රස්ථාවන් ලබාදෙන පරිසරයක් සහ උසස් ජීවන තත්වයක්තුළ, ප්‍රදේශයේ සම්පත් හා අවශ්‍යතා සියුම්ව හඳුනාගනිමින් හා පුද්ගලික අංශයේ හා රේඛීය නියෝජිතායතනවල සම්බන්ධීකරණයෙන්, සැළසුම් කිරීමෙන් හා සංවර්ධනය කිරීමෙන්, ඉලක්කගත මට්ටමේ ඒක පුද්ගල ආදායම් මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වෙමින්, ප්‍රදේශයේ දළ දේශීය නිෂ්පාදනයේ වේගවත් වර්ධනයට දායක වීමයි."

## අධිකාරියේ පරමාර්ථ, බලතල හා කාර්යභාරය

අධිකාරියේ පරමාර්ථ, බලතල සහ කාර්යයන්, පනතේ 12 වන සහ 13 වන වගන්තිවලින් දැක්වෙන ආකාරයට පහත පරිදි වේ.

### අධිකාරියේ පරමාර්ථ (පනතේ 12 වන වගන්තිය ප්‍රකාර)

(අ) නිෂ්පාදනශීලීත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් සහ රැකියා අවස්ථා ජනනය කිරීම අරහයා වූ සංවර්ධන ව්‍යාපෘති, නම්කළ ප්‍රදේශයතුළ සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ආ) නම්කළ ප්‍රදේශයේ සමස්ථ සංවර්ධන සැලැස්මෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘති, ප්‍රමුඛත්ව පදනමක් මත සවිස්තරව අධ්‍යයනය කිරීම.

(ඇ) යම් නිශ්චිත ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා විදේශීය අරමුදල් සපයා ගැනීම සඳහා අදාල අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම.

(ඈ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයනය කිරීම සහ නම්කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, වෙනත් රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රාජ්‍ය සංස්ථාවල සහ පොදු හෝ පෞද්ගලික වෙනත් ආයතන සහ තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම; සහ

(ඉ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයනය කිරීම සහ නම්කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, විදේශීය සහ දේශීය, පෞද්ගලික අංශයේ නියෝජිතායතනවල සහභාගිත්වය ලබා ගැනීම.

## අධිකාරියේ බලතල සහ කාර්යභාරය (පනතේ 13 වන වගන්තිය ප්‍රකාර)

(අ) අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබා ගැනීම.

(ආ) නම්කළ ප්‍රදේශයේ, විශේෂ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයනය කිරීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය සහ විදේශීය සහභාගිත්වය ලබා ගැනීම.

(ඇ) නම්කළ ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සැලසුම් කිරීමේදී, සහයෝගයෙන් ක්‍රියා කරන ලෙස, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් සියළුම නියෝජිතායතනවලින් ඉල්ලා සිටීම.

(ඈ) අධිකාරිය විසින් නිම කරන ලද සංවර්ධන ව්‍යාපෘති භාරගෙන, නඩත්තුකර, ක්‍රියාත්මක කරන ලෙස, ජනාධිපතිවරයාගේ එකගත්වය ඇතිව, ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටීම.

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමට අදාල යම් යම් කටයුතු සම්බන්ධයෙන්, අධිකාරියේම දෙපාර්තමේන්තු හෝ නියෝජ්‍යායතන පිහිටුවීම.

(ඊ) නම්කළ ප්‍රදේශයේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අදාල පර්යේෂණ පැවැත්වීම.

(උ) නම්කළ ප්‍රදේශයතුළ ඇති යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් පිළියෙළ කිරීම.

(ඌ) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සහ සේවා ලබා ගැනීම පිණිස, කලින් කල, ආණ්ඩුව විසින් නියම කරනු ලබන ටෙන්ඩර් පටිපාටියට අනුකූලව ටෙන්ඩර් ප්‍රදානය කිරීම.

(එ) නම්කළ ප්‍රදේශයතුළ, අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා සඳහා, ගාස්තුවක් පැනවීම හෝ අය කිරීම.

(ඒ) යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන යම් කාර්යාල පිරියත, යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ද්‍රව්‍ය මිළට ගැනීම, අත්කර ගැනීම, ඉදිකිරීම, නඩත්තු කිරීම, ප්‍රතිනිර්මාණය කිරීම හෝ සකස් කර ගැනීම.

(ඔ) යම් පොදු හෝ පෞද්ගලික ආයතනයක් මගින් හෝ පොදු හෝ පෞද්ගලික ආයතන සමග හවුලේ හෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඕ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව, ශ්‍රී ලංකාවේ ප්‍රභවයන්ගෙන් මුදල් ණයට ගැනීම, මුදල් ලබා ගැනීම හෝ බැඳීම් අත්කර ගැනීම.

(ක) නිශ්චල දේපළ කිසිවක්, කවරවුවද ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බදු ගැනීම හෝ කුළියට ගැනීම හෝ බදු දීම හෝ කුළියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම සහ

(ග) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ පරමාර්ථ ඉටු කර ගැනීමට හෝ මේ පනත යටතේ වන අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අනුෂාංගිකවන හෝ හිතකර වන වෙනත් සියළු ක්‍රියා කිරීම.

# බලප්‍රදේශය, අධ්‍යක්‍ෂ මණ්ඩලය, පරිපාලන ව්‍යුහය හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මණ්ඩලය

**අධිකාරියේ බලප්‍රදේශය**

අධිකාරියේ පනතේ **3** (1) වගන්තිය අනුව, අධිකාරියේ බල ප්‍රදේශය වශයෙන්, ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයන්ද, රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකද අයත් වේ. මේ අනුව, දක්ෂිණ සංවර්ධන අධිකාරියේ බලප්‍රදේශය වශයෙන් ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික්ක 04 ත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය හා කොලොන්න යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකද ඇතුලත්ව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 60 ක භූමි ප්‍රමාණය අයත් වේ.

**අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය**

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරී පනතේ (04) වන වගන්තිය අනුව, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වන අධ්‍යක්ෂකවරුන් 07 දෙනෙකුගෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වේ.

**ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය සමන්විත වේ.**

(අ) අධිකාරියේ පාලනය භාරවන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්,

(ආ) මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක්,

(ඇ) පත් කරනු ලැබූ සාමාජිකයන් යනුවෙන් සඳහන් කරනු ලබන, තවත් සාමාජිකයන් පස් දෙනෙක්,

## අධිකාරියේ පාලනය භාරව ඇති අමාත්‍යාංශය

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය | - | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |

## අධිකාරියේ පාලනය භාරව ඇති අමාත්‍යවරුන්

| | | |
|---|---|---|
| ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය | - | බැසිල් රාජපක්ෂ මැතිතුමා |
| ආර්ථික සංවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන් | - | ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා<br>මුත්තුශිවලිංගම් මැතිතුමා |
| අමාත්‍යාංශ ලේකම් | - | ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා |

## අධිකාරියේ පරිපාලන ව්‍යුහය හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මණ්ඩලය

### අධ්‍යක්ෂ මණ්ඩලය

**2011 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීම්**

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරි පනතේ (04) වන වගන්තිය අනුව, සංයුක්ත වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය, සම්ප්‍රදානුකූලව මසකට වරක් රුස්විය යුතුය. එහෙත්, ප්‍රායෝගික හේතු මත 2011 වර්ෂය තුළදී රුස්වීම් වාර 08 ක් පමණක් පවත්වා ඇත. අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂක මණ්ඩලයේ ද සභාපති වේ. 2011 වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරු හෙබවූ සාමාජික / සාමාජිකාවන්ගේ නම් හා අධිකාරියේ පරිපාලන ව්‍යුහය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 01. | ඒ. පී. එස්. රංජිත් ගුණසේකර මහතා (නීතිඥ)<br>(2006-06-07 සිට 2011-12-31 දක්වා) | - | සභාපති/අධ්‍යක්ෂ ජනරාල් |
| 02. | සුනිල් සූරියබණ්ඩාර දිසානායක මහතා<br>(2007-09-01 සිට 2011-12-31 දක්වා)<br>ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක - කුඩා තේවතු සංවර්ධන අධිකාරිය | - | සාමාජික |
| 03. | ලලිත් යූ. ගමගේ මහතා (නීතිඥ)<br>(2005-05-19 සිට 2011-07-06 දක්වා) | - | සාමාජික |
| 04. | සරත් අමරවීර මහතා<br>(2010-05-12 සිට 2011-12-31 දක්වා) | - | සාමාජික |
| 05. | චන්දන ප්‍රියලාල් පතිරණ මහතා<br>(2010-05-12 සිට 2011-12-31 දක්වා) | - | සාමාජික |
| 06. | රිස්නා අනිස් මහත්මිය<br>(2010-07-22 සිට 2011-04-08 දක්වා)<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ- සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශයේ නියෝජිත | - | සාමාජිකා |
| 07. | පුෂ්පා රුද්‍රිගු මෙනවිය<br>(2010-07-22 සිට 2011-04-05 දක්වා)<br>අධ්‍යක්ෂ ජනරාල් - ග්‍රාමීය ආර්ථික,ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත | - | සාමාජිකා |

08. ඩී. සී. සිරිබද්දන මහතා - සාමාජික
(2011-04-08 සිට 2011-12-31 දක්වා)
අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශයේ නියෝජිත

## අධිකාරියේ ප්‍රධාන කාර්යාල කළමණාකාරිත්වය

| | | |
|---|---|---|
| ඒ. පී. එස්. රංජිත් ගුණසේකර මහතා (නීතිඥ) | - | සභාපති/අධ්‍යක්ෂ ජනරාල් |
| ජේ. කේ. පද්මසිරි මහතා | - | අධ්‍යක්ෂ (මුදල් හා පාලන) |
| ඩබ්. ජී. බී. එල්. විජයරත්න මහතා | - | අධ්‍යක්ෂ (සැලසුම් ක්‍රියාත්මක කිරීම් හා අධීක්ෂණ) (2011-08-29 දින දක්වා) |
| පී. එන්. විජේරත්න මහතා | - | වැ. බ. අධ්‍යක්ෂ (සැලසුම් ක්‍රියාත්මක කිරීම්) (2011-09-07 සිට 2012-01-04 දක්වා) |
| පී. එන්. විජේරත්න මහතා | - | වැ. බ. අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්) (2010-06-01 සිට 2011-12-31 දක්වා) |
| සුනිල් වන්නිගම මහතා | - | ආංශික කළමණාකරු (කර්මාන්ත) |
| එල්. එම්. ඒ. පෙරේරා මහතා | - | ආංශික කළමණාකරු (සැලසුම්) |
| එච්. කේ. රණවීර මහතා | - | ආංශික කළමණාකරු (ධීවර) |
| එස්. ඩී. කල්‍යානි මිය | - | ආංශික කළමණාකාරිනී (ඉඩම්) |
| ශ්‍රියන්ත ලියනආරච්චි මහතා | - | ආංශික කළමණාකරු (පුහුණු) |
| එස්. ආර්. විජේසේකර මහතා | - | ආංශික කළමණාකරු (යටිතල පහසුකම්) |
| සී. එල්. වේගිරිය මහතා | - | රා. ආ. ආංශික කළමණාකරු (වැවිලි) (2010-10-15 සිට 2011-12-31 දක්වා) |
| ඩබ්. එම්. ඒ. පෙරේරා මහතා | - | රා. ආ. ආංශික කළමණාකරු (කෘෂි) (2010-10-15 සිට 2011-12-31 දක්වා) |
| එස්. සී. වනිගතුංග මහතා | - | අභ්‍යන්තර විගණක |

**අධිකාරියේ දිස්ත්‍රික් කළමණාකාරිත්වය**

| | | |
|---|---|---|
| රංජිත් ද සිල්වා මහතා<br>(2010-08-31 සිට 2011-05-01 දක්වා) | - | දිස්ත්‍රික් අධ්‍යක්ෂ - ගාල්ල දිස්ත්‍රික්කය |
| කේ. අයි. මාසකෝරාල මහතා<br>(2011-05-02 සිට 2011-12-31 දක්වා) | | |
| කේ. අයි. මාසකෝරාල මහතා<br>(2010-06-01 සිට 2011-05-01 දක්වා) | - | දිස්ත්‍රික් අධ්‍යක්ෂ - මාතර දිස්ත්‍රික්කය |
| රංජිත් ද සිල්වා මහතා<br>(2011-05-02 සිට 2011-12-31 දක්වා) | | |
| කේ. ගුණතිලක මහතා<br>(2010-08-31 සිට 2011-12-31 දක්වා) | - | දිස්ත්‍රික් අධ්‍යක්ෂ - හම්බන්තොට දිස්ත්‍රික්කය |
| පී. එම්. කුලතුංග මහතා<br>(2010-06-01 සිට 2011-12-31 දක්වා) | - | දිස්ත්‍රික් අධ්‍යක්ෂ - මොණරාගල දිස්ත්‍රික්කය |

**අධිකාරියේ සේවක මණ්ඩලය**

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | - | 03 |
| තෘතීක මට්ටම | - | 90 |
| ද්විතීයික මට්ටම | - | 95 |
| ප්‍රාථමික මට්ටම | - | 78 |
| **එකතුව** | - | 266 |

# සභාපති/අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

1996 වසරේදී ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිහිටුවීමෙන් අනතුරුව පසු කරනු ලැබූ 15 වැනි වර්ෂයට අදාලව, එනම්, 2011 වර්ෂයට අදාලව, ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවය පරිදි, මෙම අධිකාරියේ සමස්ථ කාර්ය කටයුතු පිළිබඳව සමාලෝචනයක් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම සමාලෝචනය මගින්, අධිකාරිය ආරම්භයේ සිට මේ දක්වා ආ ගමන් මගේ ක්‍රියාකාරිත්වය, 2011 වසරේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, අධිකාරියේ අනෙකුත් අංශවල ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය සහ 2011 වසර තුළදී අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාමේදී අත්විඳි විශේෂ තත්වයන්ද පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙමි.

1996 අංක 18 දරණ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, දක්ෂිණ ප්‍රදේශයතුල නිෂ්පාදනශීලිත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් හා රැකියා අවස්ථා ජනනය කිරීම අරභයා වූ සංවර්ධන ව්‍යාපෘති, හඳුනාගැනීම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, අතීතයේදී, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ආරම්භයේ සිට විවිධ ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාත්මක වී ඇත.

මේ අනුව, ආරම්භක අවධියේදී, රුහුණුපුර සංවර්ධන සංකල්පය ඔස්සේ, මහා පරිමාණ ව්‍යාපෘති පිළිබඳ අවධානය යොමු කොට, දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කරා ළඟාකරවීමට අවශ්‍ය දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පූර්ව ශක්‍යතා සැලසුම් පිළියෙල කොට ඉදිරිපත් කරන ලදී. මෙම සැලසුම් අතරට, හම්බන්තොට ජාත්‍යන්තර වරාය ඉදිකිරීම, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම, දක්ෂිණ ප්‍රදේශ අන්තර් දක්ෂිණ අන්තර්ජාතික ගුවන් තොටුපල ඉදිකිරීම, මාතර සිට කතරගම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීම සහ ආදර්ශ ප්‍රවාහන ජාලය හඳුන්වාදීම, යන ව්‍යාපෘතිවලට අදාල සැලසුම් ඇතුළත් විය.

ඉන් අනතුරුව, මෙම අධිකාරියේ අධීක්ෂණය භාර අමාත්‍යාංශවල උපදෙස් අනුව, ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. එවැනි එක් වැදගත් කාර්යයක් නම්, දේශීය හා විදේශීය ආයෝජනයන් දක්ෂිණ ප්‍රදේශයට රැගෙන ඒමට විශාල කාර්යභාරයක් ඉටුකරමින්, විවිධ කර්මාන්ත ස්ථානගත කිරීමට ආයෝජකයින්ට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීමයි. මේ අතරින්, මිදිගම ලෝඩ්ස්ටාර් ටයර් කර්මාන්ත ශාලාව (1996), ඇඹිලිපිටිය ව්‍යවසායක කේන්ද්‍රය (1997), මාතර, තිහගොඩ, ඔලියගොඩවත්ත තාප බලාගාරය (1998), මාතර, කුඹල්ගම, ඉසුරු සෙරමික් නිෂ්පාදන ආයතනය (1999), මාතර, කඹුරුපිටිය, රටලංකාවත්ත ඔටෝ ලංකා ටයර් කර්මාන්ත ශාලාව (2001) , කඹුරුපිටිය රටලංකාවත්ත ඩ්‍රැගන් ෆෲට් වගා ව්‍යාපෘතිය (2009) ප්‍රධාන හා වැදගත් ව්‍යාපෘති වේ. මෙම ව්‍යාපෘති මගින් දේශීය ආර්ථිකයට ජවයක් ලබාදීමට හැකිවීම මෙන්ම, සමහර ව්‍යාපෘති මගින් විදේශ විනිමය රටතුලට රැගෙන ඒමටද හැකියාව උදාවීම අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

එමෙන්ම, වසර කීපයක් තිස්සේ අක්‍රියව පැවති තේ කර්මාන්ත ශාලා නැවත නගාසිටුවා, දක්ෂිණ ප්‍රදේශයේ තේ ආර්ථිකයට විශාල මෙහෙයක් සිදුකිරීමට හැකිවීමද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ලබාගත් තවත් ජයග්‍රහණයකි. මේ අතරට, පෞද්ගලික, දේශීය ආයෝජකයින්ට පහසුකම් සැලසීම තුලින් නගා සිටුවන ලද, පනිල්කන්ද තේ කර්මාන්තශාලාව (1999), මාතර, අකුරැස්ස ගලගාව තේ කර්මාන්ත ශාලාව (2001), ගාල්ල, තවලම, ජස්මින්වැලි තේ කර්මාන්ත ශාලාව (2001) හා 2009 වර්ෂයේ ආරම්භ කල වලස්මුල්ල හඳුගල තේ කර්මාන්ත ශාලාවද ඇතුළත් වේ.

ඉහත සංවර්ධන කාර්යන්ට අමතරව, 1998 සිට 2007 දක්වා කාලයතුළදී ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණි. ඒ තුලින්, ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා හඳුනාගනිමින්, ඔවුන්ගේ ආර්ථික හා සාමාජීය අවශ්‍යතා සහ ගැටලුවලට විසඳුම් ලබා දීමට, කර්මාන්ත, වැව්, ධීවර, කෘෂිකර්ම, සත්ව පාලන, ඉඩම්, පුහුණු හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, නොදියුණු ගම්මාන සංවර්ධන වැඩසටහන් තුලින්ද ග්‍රාමීය ආර්ථිකයට විශාල මෙහෙවරක් කිරීමට හැකියාව ලැබුණි. අනතුරුව, 2007 වර්ෂයේ සිට, “මහින්ද චින්තන” ජාතික ප්‍රතිපත්තියට අනුගත වෙමින්, ජාතික සවිය - ගමනැගුම සංවර්ධන වැඩසටහන යටතේ, ග්‍රාමීය ආර්ථිකයට නව පුනර්ජීවයක් ලබා දෙමින්, ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ගම්මාන 47 ක සංවර්ධන කාර්යයන් සිදුකිරීමේ වගකීම මෙම අධිකාරිය වෙත පැවරුණි. (එනම්, ගාල්ල දිස්ත්‍රික්කයේ ගම්මාන 18, මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 12, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මාන 17)

2008 වර්ෂයේ ජාතික සවිය - ගමනැගුම සංවර්ධන වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කරමින් දක්ෂිණ ප්‍රදේශයේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල දිස්ත්‍රික්ක හා රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න හා ඇඹිලිපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකද ඇතුලත් ප්‍රදේශයතුල, නව ගම්මාන 103 ක මෙම වැඩසටහන දියත් කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, මහා භාණ්ඩාගාරය විසින් මෙම අධිකාරිය වෙත ලබා දෙන ලදි. ඒ අනුව, 2010 වසර වන විට, මුළු වශයෙන්, දක්ෂිණ ප්‍රදේශයේ ගම්මාන 150 ක් සංවර්ධනය කිරීමේ කාර්යය මෙම අධිකාරිය වෙත පැවරී තිබුණි. (එනම්, ගාල්ල දිස්ත්‍රික්කයේ ගම්මාන 43, මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 45, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගාම්මාන 37 හා මොණරාගල දිස්ත්‍රික්කයේ ගම්මාන 25 ක් ද වශයෙන්.)

එම ව්‍යාපෘති, ප්‍රමුඛතා පදනමින් තෝරාගෙන, ගම්මාන සංවර්ධන සැලසුම් යටතේ අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබීමද විශේෂවේ. ජාතික සවිය - ගමනැගුම සංවර්ධන වැඩසටහනේ ඇතුලත් ප්‍රධාන සංරචක 03 ක් යටතේ, එනම්, ආර්ථික හා ජීවනෝපාය සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනය යනුවෙන් හඳුනාගත් වැඩසටහන්, ඉහත පරිදි තෝරාගත් සියලුම ගම්මානවල ක්‍රියාත්මක කරන ලදි. මේ අනුව, මෙම අධිකාරිය ආරම්භ කළ 1996 වසරේ සිට 2009 වසරේ අවසානය දක්වා, දක්ෂිණ ප්‍රදේශයේ විශේෂ ව්‍යාපෘති වැයද ඇතුළත්ව සමස්ථ සංවර්ධනය වෙනුවෙන් රු. මි. 1,701 ක් වැය කරන ලදි.

මීට අමතරව, ජාතික සවිය ගම නැගුම සාමාන්‍ය ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා, 2010 වර්ෂයේදී රුපියල් මිලියන 280 ක මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් මෙම අධිකාරිය වෙත වෙන්කර දෙන ලදි. එම මූල්‍ය ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 201.1 ක්, අදාල ව්‍යාපෘති වෙනුවෙන් වැය කිරීමට හැකි විය. මෙලෙස, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව 71.8% ක මූල්‍ය ඉලක්කයක් සපුරාගැනීමට හැකිවීම සතුටට කරුණක් වන අතර, ඉතිරි ප්‍රතිපාදන ද ලැබුණි නම්, මූල්‍ය ඉලක්කය 100 % සපුරාගැනීමට හැකියාව තිබුණි. එසේම, 2010 වසරේ භෞතික ප්‍රගතිය 80.5% ක් වන අතර, එය සතුටුවිය හැකි තත්වයකි. මෙම ව්‍යාපෘති මගින් උත්පාදනය කරන ලද ආර්ථික ප්‍රතිලාභයන්හි ඇස්තමේන්තු අගය රු. මි. 300 ක් පමණ වේ.

ඊට අමතරව, ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ගම්මානවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, 2010 වර්ෂයේදීද, ජාතික සවිය ගම නැගුම දෙවන අදියර යටතේ, විශේෂ වශයෙන් රුපියල් මිලියන 159.8 ක මුදලක් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් අප අධිකාරිය වෙත ලැබුණි. එම මුදලින් රු.මි. 96.7 ක් උපයෝගි කර ගනිමින්, එම ගම්මානවල කඩිනමින් කල යුතුව තිබූ ආර්ථික යටිතල පහසුකම් ව්‍යාපෘති 215 ක් නිම කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව, විශේෂ ව්‍යාපෘතිවලට අදාලව ළගාකර ගත් මූල්‍ය ප්‍රගතිය 69% කි. භෞතික ප්‍රගතිය 90% කි.

2011 වසරට අදාලව පිළියෙල කළ අධිකාරියේ සංවර්ධන සැලැස්මට අනුව, ප්‍රධාන වැඩසටහන් තුනක් සඳහා රු. මි 300.5 ක වැය දැරීමට අපේක්ෂා කරන ලදි. එනම්, දිවි නැගුම ජාතික වැඩසටහන යටතේ, ගම්මාන 150 තුල, ගෘහස්ථ ආර්ථික ඒකක 15,000 ක් ස්ථාපිත කිරීම සහ ඊට අදාල කෘෂි සංවර්ධන, ගෘහස්ත කර්මාන්ත සංවර්ධන සහ ධීවර සහ පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මි. 215 ක මුදලක්ද, ජාතික සවිය ගම නැගුම ඉතිරිව තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 73 ක මුදලක්ද සහ, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට අදාල රුදවුම් මුදල් ගෙවීම ප්‍රධාන වශයෙන් ඇතුලත් වෙනත් වැය සඳහා රු. මි. 12.5 ක මුදලක්ද වශයෙනි.

ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා මුළු වශයෙන් රු. මි. 152.3 ක් වැය කොට, 51% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. එනම්, සැලැස්මේ අන්තර්ගත ඉහත දැක්වූ ප්‍රධාන වැඩසටහන් තුන වශයෙන් ගත්කල, ඊට අදාලව පහත පරිදි වැය දරන ලදි. එනම්, දිවි නැගුම ජාතික වැඩසටහන සඳහා රු. මි. 77.4 ක්, ජාතික සවිය ගම නැගුම ඉතිරිව තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 62.6 ක් සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට අදාල රුදවුම් මුදල් ගෙවීම ප්‍රධාන වශයෙන් ඇතුලත් වෙනත් වැය සඳහා රු. මි. 12.3 ක් වශයෙනි.

ඉහත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භෞතික වශයෙන් ව්‍යාපෘති 1048 ක් හඳුනාගනු ලැබූ අතර, එම ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 529 ක් මුළුමනින්ම නිමකොට, 51% භෞතික ප්‍රගතියක් 2011 වසරේදී අත්කරගත හැකි විය.

අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල හතරට අදාලව එනම්, ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික් කාර්යාල අනුව සළකන විට, ඉහත පරිදි ළගා කරගෙන ඇති ප්‍රගතිය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කළ හැක.

**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය**
**දිස්ත්‍රික්ක අනුව 2011 සංවර්ධන සැලැස්මේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | සැලසුම් කළ ව්‍යාපෘති ගණන | නිමකළ ව්‍යාපෘති ගණන | % | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල් ප්‍රතිපාදන ය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | % |
|---|---|---|---|---|---|---|---|
| ගාල්ල | 296 | 123 | 42 | 60,574 | 79,500 | 33,468 | 42 |
| මාතර | 308 | 178 | 58 | 62,421 | 87,500 | 45,338 | 52 |
| හම්බන්තොට | 270 | 164 | 61 | 49,252 | 71,200 | 41,680 | 58 |
| මොණරාගල | 174 | 64 | 37 | 28,566 | 49,300 | 19,482 | 39 |
| ප්‍රධාන කාර්යාලය | | | | | 12,500 | 12,300 | 98 |
| **එකතුව** | **1,048** | **529** | **51** | **200,813** | **300,500** | **152,268** | **51** |

ඉහත පරිදි අත්කරගත් සමස්ථ ප්‍රගතියට අමතරව, එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථිකයට ඇතිකළ යහපත් බලපෑමේ ප්‍රතිඵලයක් ලෙසින් සමස්ත වශයෙන් රු. මි. 280 ක පමණ ආර්ථික වටිනාකමක් ජාතික දළ දේශීය නිශ්පාදිතයට එකතු කළ හැකි විය. එනම්, දිවි නැගුම ව්‍යාපෘති මගින් රු. මි. 154 ක් සහ ජාතික සවිය ගම නැගුම ව්‍යාපෘති මගින් රු. මි. 126 වශයෙනි. එම වටිනාකම, භෞතික ව්‍යාපෘති ප්‍රගතිය අනුසාරයෙන් ගණනය කළ හැකි වටිනාකමට සීමාවන අතර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාස රහිත පුද්ගලයින් 398 දෙනෙකුට නිවාස ලබා දීමෙන් එම ප්‍රතිලාභීන්ට අත්කර දුන් දෘෂ්‍ය නොවන ආර්ථික හා සාමාජීය සේවා බලපෑම වැනි 2011 වසරේදී මෙම අධිකාරිය විසින් ප්‍රතිලාභී ජනතාවට සැපයූ අනෙකුත් සේවා සැපයීම්වල අගය ඊට එකතු නොවන බවද සටහන් කරමි. කැපීපෙනෙන සාමාජීය මෙහෙවරක් මෙන්ම ප්‍රධාන ජාතික ගැටළුවක කොටසකට දෙනු ලැබූ විසඳුමක් වශයෙන් ක්‍රියාත්මක කළ මෙම නිවාස ව්‍යාපෘතියට, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙතින් ලැබුණ රු.මි. 44.1 ක් 2011 වසෙර්දි වැය කරන ලදි.

ඉහතින් දැක්වූ දිවි නැගුම වැඩසටහනට අයත් ව්‍යාපෘති, ජාතික සවිය ගම නැගුම වැඩසටහනට අයත් ව්‍යාපෘති සහ හම්බන්තොට දිස්ත්‍රික්කය මූලික කරගත් නිවාස ව්‍යාපෘතිය මගින් අධිකාරියට අයත් දක්ෂිණ බල ප්‍රදේශයේ දෙලක්ෂය (200,000) ඉක්මවූ, මෙවැනි සේවා ලැබීමට යෝග්‍ය වූ ජනකොටසකට ප්‍රතිලාභ ලබාදීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහනයකි. ඒ තුළින්, ඔවුන්ගේ ආහාර නිෂ්පාදන හැකියාවන්, ආදායම් මට්ටම් මෙන්ම පෝෂණ මට්ටම්ද ඉහළ නැංවිය හැකිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම ප්‍රතිලාභී ජනතාව, ජාතික ආර්ථිකයේ සක්‍රිය කොටස්කරුවන් කළ හැකි විය. එසේම, ඒතුලින් රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඉහතින්ද දැක්වූ පරිදි රු.මි. 280 ක පමණ දායකත්වයක් එකතු කළ හැකි විය. මෙමගින්, මෙම අධිකාරිය පිහිටුවා ඇති පනතේ 12 වන ජේදයේ සඳහන් අරමුණු සැලකිය යුතු මට්ටමකට ළගාකර ගැනීමට හැකිවිය.

එම තත්වය වඩාත් කැටි කොට දක්වන්නේ නම්, මෙම අධිකාරිය 1996 වසරේ පිහිටවූ දින සිට එහි පැවැත්මේ 15 වැනි වසර වන, 2011 දෙසැම්බර් 31 දින දක්වා, දක්ෂිණ ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ සාමාන්‍ය හා විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් සමුච්චිතව රු. මි. 2300 ක් පමණ වැය කරන ලදී. එමෙන්, කිප ගුණයක දායකත්වයක් රටේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු කරලීමට මෙම අධිකාරියට හැකිවිය. එමෙන්ම, දක්ෂිණ ප්‍රදේශයේ ප්‍රතිලාභී ජනතාවගේ ආර්ථික හැකියාවන් හා ජීවන මට්ටම් ඉහළ දැමීමටත්, තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උත්පාදනය කරදීමෙනුත්, ඒවායේ ප්‍රතිඵල ලෙසින්, ප්‍රතිලාභී ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමටත්, සාමාජීය තත්වය ඉහළ දැම්මටත් මෙම අධිකාරියට හැකිවිය. මෙම සියළු සාධනීය පියවරයන් මගින් දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථික සමෘද්ධියට සැලකිය යුතු මෙහෙයක් ඉටුකිරිමටද මෙම අධිකාරියට හැකිවිය.

ඉහතින් සාකච්ඡා කළ, මෙම අධිකාරියේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අංශයට අමතරව, ප්‍රධාන ශ්‍රිතයන් ලෙස ගැනෙන සැලසුම් අංශය, ගිණුම් හා පරිපාලන අංශය හා විගණන අංශය, 2011 වසරේදී ක්‍රියාත්මක වූ ආකාරය හා එම අංශ අත්කරගත් ප්‍රගතිය පිළිබඳව සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්) යටතේ පාලනය වන සැලසුම් අංශය ප්‍රධාන කාර්යාලයේ ස්ථානගතව පවතී. එම ශ්‍රිතය, ආංශික අටක් යටතේ ව්‍යුහගතව ඇත. එනම්, සැලසුම්, ධීවර, කර්මාන්ත, ඉඩම්, මානව සම්පත් පුහුණු, කෘෂිකර්ම, වැව්ලි හා අධ්‍යාපන හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අංශය වශයෙනි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් හා මගපෙන්වීම පරිදි මෙන්ම, ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීන්දුවලට අනුව, මෙම අංශ අට මගින්, ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්ක හතරෙහි සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න හා ඇඹිලිපිටිය යන ප්‍රාදේශීය ලේකම් වසම් දෙක ඇතුළත් දක්ෂිණ බලප්‍රදේශයතුළ තෝරාගත් ගම්මාන 150 ක් තුළ ජාතික සවිය ගම නැගුම හා දිවි නැගුම සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මනාව සැලසුම් කරන ලදී. මෙහිදී, ප්‍රදේශයේ දේශපාලන නායකත්වයේ අදහස් හා යෝජනාද, අදාල ගම්මානවල ප්‍රතිලාභීන්ගේ අදහස් යෝජනා මෙන්ම, මූලික අවශ්‍යතාද සැලසුම් සඳහා මූලික කරගන්නා ලදී. විසි දෙනෙකුගෙන් පමණ යුත් සීමිත කාර්ය මණ්ඩලයක් මගින් වර්ෂය පුරාම නිසි පසුවිපරම් සහිතව, අවශ්‍ය අවස්ථාවලදී ක්ෂේත්‍ර පරීක්ෂාවන්ද සිදුකරමින් එම අංශයේ රාජකාරි සැහීමට පත්විය හැකි මට්ටමින් පවත්වාගෙන යන ලදී.

තවද, දිස්ත්‍රික් කාර්යාල හතරද ඇතුළු සමස්ථ ආයතනික ගිණුම් හා පරිපාලන කටයුතු පවත්වාගෙන යාමේ සහ අදාල කාලීන තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට සම්පාදනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ (මුදල් හා පාලන) ගේ මූලිකත්වයෙන් යුතු එම අංශයේ කාර්ය මණ්ඩලය විසින් මනාව ඉටුකරන ලදී. කලට වේලාවට භාණ්ඩාගාර ප්‍රේෂණ ලබාගැනීම, අධිකාරියේ සෙසු ආදායම් එකතු කර ගැනීම සහ අභ්‍යන්තර හා බාහිර ගණුදෙනුකාර පාර්ශවයන්ට කලට වේලාවට ගෙවීම් කරමින් සකසුරුවමින් වියදම් දැරීම මෙන්ම, අන්තර් කාලීනව සහ  වාර්ෂිකව නියමිත කාලයට වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම මෙම අංශය මගින් සාර්ථකව ඉටුකරන ලදී. මීට අමතරව, 266 කින් සමන්විත අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලයේ පාලන කටයුතු සහ වාහන 44 කින් යුත් වාහන බලඇණිය මනාව නඩත්තු කොට පවත්වාගෙන යමින් සහ එම සම්පත් මෙන්ම අනෙකුත් සම්පත්ද ආයතනික අරමුණු මනාව ලගාකරගත හැකි වන ආකාරයට අනෙකුත් සියළු අංශවලට ප්‍රශස්ථව විභාජනය කිරීමේ කාර්යයද ඉහළ කළමණාකාරිත්වයේ ඉහළම තෘප්තියට හේතුවන පරිදි, මෙම අංශය මගින් ඉටුකරන ලදී.

මීට අමතරව, සුපුරුදු පරිදි, සාමාන්‍ය සේවක සහ කළමණාකරණ ධාරිතාවයන් වැඩිදියුණු කිරීම සඳහා සහ සේවක අභිප්‍රේරණයද ඉලක්ක කර ගනිමින්, 2011 වසරේදීද හඳුනාගත් සේවක කණ්ඩායම්වලට සේවක පුහුණුව ලබාදුන් අතර, මහා භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ලද සීමිත ප්‍රතිපාදනවලින්, මෙම පුහුණුව වෙනුවෙන් රු. 352,865/- ක් 2011 වසරේදී වැය කරන ලදී.

එමෙන්ම, හත් දෙනෙකුගෙන් යුත් සීමිත කාර්ය මණ්ඩලයක් මගින් සැලසුම්ගතව අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව පවත්වාගෙන යාමේ වගකීම අභ්‍යන්තර විගණක ඇතුළු එම අංශයේ සෙසු කාර්ය මණ්ඩලය  සාර්ථකව ඉටුකරන ලදී. කාර්යාල මෙන්ම ක්ෂේත්‍ර විගණන කටයුතු සැලසුම් කළ ආකාරයටම පවත්වාගෙන යාමත්, ඉහළ කළමණාකරණයට අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන කටයුතු පවත්වාගෙන යාමත් එම අංශය මගින් ඉටුකරන ලදී. අධිකාරියේ එක් එක් අංශ හා ක්ෂේත්‍රයේ අඩුපාඩු දුර්වලතා ඉහළ කළමණාකාරිත්වයට පෙන්වා දීමට අමතරව, අධිකාරියේ පවතින පද්ධති හා පාලන ක්‍රම ඇගයීම් කොට, අවශ්‍ය තැන්හිදී ඒවා වැඩිදියුණු කිරීමට අදාල යෝජනා  ඉදිරිපත් කිරීමද එම අංශය මගින් ඉටුකරන ලදී. මෙම සියළු කටයුතු, අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටුවේ දැනුවත්භාවය හා උපදෙස් හා

මගපෙන්වීම් අනුව කාර්යක්ෂමව කරගෙන යාමද විශේෂිත වේ. ඒ අනුව, අභ්‍යන්තර විගණන අංශය සැබෑ ලෙසින්ම කළමණාකාරිත්වයට ආධාරයක් වන ලෙසින් ක්‍රියාත්මක විය.

ඉහතින් දැක්වූ සියළු සුභවාදී ජයග්‍රහණ අත්කර ගැනීමට අමතරව, 2011 වසරේදී යම් යම් අභියෝග සහ ගැටළුවලට මෙන්ම කළමණාකරන දුර්වලතා කිහිපයකටද මුහුණදීමට සිදුවූ බව මෙහිලා සඳහන් කරමි. එනම්, එවකට ජාතික වශයෙන් පැවති අත්‍යවශ්‍යතාවය සලකා, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, දිවි නැගුම වැඩසටහනට අයත් කාර්යයන්ද 2011 වසර ආරම්භයේ පිළියෙල කළ මූල් සැළැස්මට ඇතුලත් කළ යුතුවූ හෙයින්, 2011 වසරේ සංවර්ධන සැලැස්ම අමාත්‍යාංශය මගින් අනුමත කිරීම 2011 වසරේ මැද භාගයේදී සිදුවීම, 2011 මුල් මාස කිහිපය තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික කටයුතු බිම් මට්ටමට ගෙනයාමට නොහැකි වීම මෙන්ම, සැලසුම්කළ පරිද්දෙන්ම සමහර අංශවල ක්‍රියාකාරිත්වයක් දැකිය නොහැකිවීම එම අභියෝග, ගැටළු සහ දුර්වලතා අතර ප්‍රමුඛ වේ. ඒවා, ඉදිරි වර්ෂවල සාර්ථකත්වයට පාදක කරගත හැකි වටිනා අත්දැකීම් බවට පත්කර ගැනීමටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, ඉදිරි වර්ෂවලදීද, මෙම අධිකාරිය මගින් විශේෂයෙන් දක්ෂිණ ප්‍රදේශයටත්, පොදුවේ. අප රටටත් ඉහතින් දැක්වූවාටත් වඩා කැපී පෙනෙන සේවාවක් ඉටුකිරීමට මා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයත්, අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලයත් අදිටන් කරගෙන සිටින බවද සතුටින් සඳහන් කරනු කැමැත්තෙමි.

**ඒ. පී. එස්. රංජිත් ගුණසේකර**
**සභාපති/අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය**

# විගණන හා කළමනාකරණ කමිටු සභාපතිගේ වාර්තාව - 2011

## විගණන හා කළමණාකරණ කමිටුවේ කාර්යයන්

**ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටුවේ 2011 වසරේ සමස්ථ කාර්යභාරය පිළිබඳ සාරාංශගත වාර්තාවක් පහත දක්වා ඇත.**

### කමිටුව විසින් ඉටු කළ ප්‍රධාන කාර්යයන්

- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය තීරණය කිරීම.
- මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු වාර්තා කරමින් තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම.
- විගණන හා කළමණාකරණ කමිටුවේ නිර්දේශ ඇතුළත් සාරාංශගත කාලීන වාර්තා තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීම.
- අධිකාරියේ අභ්‍යන්තර පාලනය සහ අවධානම් කළමණාකරණය පිළිබඳව විශ්ලේෂණය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්ය භාරයේ සඵලදායීත්වය පිළිබඳව අධීක්ෂණය කිරීම.
- අධිකාරියේ කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම්, ව්‍යවස්ථාපිත හා අභ්‍යන්තර නීතිරීති සහ රෙගුලාසිවලට අනුගත වීම් පිළිබඳව විමර්ශනය කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා තුළින් මතුවන කරුණු ගිණුම්කරණමය, මූල්‍යමය සහ මෙහෙයුම් දෘෂ්ටිකෝණවලින් විශ්ලේෂණය කොට, අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර වාර්තා කිරීම.
- සේවක විනය, සම්පත් නාස්තිවීම සහ දූෂණ පිළිබඳව වන විගණන වාර්තා විශ්ලේෂණය කර, අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් කිරීම.
- පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක වීම පිළිබඳ සමාලෝචනය හා පසු විපරම් කිරීම.

### කමිටුවේ සංයුතිය

ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටුව, පංච පුද්ගල සාමාජික මඩුල්ලකින් සමන්විත අතර, එය පහත පරිදි වේ.

## කමිටුවේ සාමාජිකයින්

01. ඩී.සී.සිරිබද්ධන මහතා - සභාපති
අධ්‍යක්ෂ - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

02. නුර් රිස්නා අනීස් මිය - සභාපති
අධ්‍යක්ෂ - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාශය
(2010.11.04 සිට 2011.04.06 දක්වා)

03. ලලිත් යූ.ගමගේ මහතා - නීතිඥ - කමිටු සාමාජික
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය.

04. ජේ.කේ.පද්මසිරි මහතා - කමිටු සාමාජික
අධ්‍යක්ෂ (මුදල් හා පාලන)
ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය.

05. එච්.ඩී.ආරියරත්න මහතා - නිරීක්ෂණ මට්ටමින් සහභාගිත්වය
විගණන අධිකාරි
විගණකාධිපති දෙපාර්තුමේන්තුව - මාතර

06. එස්.සී.වනිගතුංග මහතා - කමිටුවේ කැඳවුම්කරු
අභ්‍යන්තර විගණක
ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය.

අධිකාරියේ විගණන හා කළමණාකරණ කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. එනම්, නුර් රිස්නා අනීස් මිය 2010.11.04 සිට 2011.04.06 දින තෙක් මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් කමිටුවේ සභාපතිත්වය දරණ ලදී. පසුව, 2011.04.08 දින සිට ඩී.සී.සිරිබද්ධන මහතා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් කමිටුවේ සභාපතිත්වය සඳහා පත්වන ලදී.

## කමිටු රැස්වීම්

විගණන හා කළමණාකරන කමිටුව, 2011 වසරේ ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් සහ දෙසැම්බර් යන මාසවලදී පස් වතාවක් රැස්වන ලද අතර, මෙම කමිටු රැස්වීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී, අධිකාරියේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්), අධ්‍යක්ෂ (සැලසුම් ක්‍රියාත්මක කිරීම) සහ වෙනත් අදාළ නිලධාරීන් ද සහභාගි කරගන්නා ලදී. ඒ අනුව, ඉහත කාර්යභාරයන් ඔස්සේ අවශ්‍ය ක්‍රියාමාර්ග අදාළ අවස්ථාවලදීම ගන්නා ලදී.

## මූල්‍ය තත්වය වාර්තා කිරීම

අධිකාරියේ මූල්‍ය තත්වය වාර්තා කිරීමේ ක්‍රියාවලිය කමිටුව විසින් විමර්ශනය කරනු ලබන අතර, අදාළ වාර්ෂික ගිණුම් හා මූල්‍ය වාර්තා නිකුත් කිරීමට ප්‍රථම, එහි අඩංගු කරුණු සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට දක්වන අනුකූලත්වය පිළිබඳව කළමණාකාරිත්වය සමග සාකච්ඡා කොට සුදුසු තීරණවලට එළඹීමද සිදුකරන ලදි.

## අවධානම සහ පාලනය

අධිකාරියේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයෙහි ඵලදායිත්වය පිළිබඳව විමර්ශනය කිරීම සහ දුර්වල පාලන ක්‍රම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ද විගණන හා කළමණාකරණ කමිටුව විසින් අදාළ වර්ෂය තුළදී සිදුකරන ලදි.

## අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ ස්වාධීනත්වය සහ විගණන ක්‍රමවේදයේ ඵලදායිත්වය පිළිබඳව විගණන හා කළමණාකරණ කමිටුව වාර්ෂිකව ඇගයීමක් සිදුකරනු ලැබේ. එමෙන්ම, අභ්‍යන්තර විගණන වාර්තා, විගණනය සඳහා වන ප්‍රවේශය, විගණන ක්‍රමවේදය, විෂය පථය සහ විගණන වාර්තා සම්බන්ධයෙන් කළමණාකාරිත්වය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳවද කමිටුව විසින් සළකා බලන ලදි. අභ්‍යන්තර විගණක විසින් කමිටුව වෙත සහභාගි වන ලෙස සාමාජිකයන් වෙත ආරාධනය කරනු ලබන අතර, ඔහු විසින් අභ්‍යන්තර විගණනයේදී හඳුනාගනු ලබන ප්‍රධාන කරුණු කාලීනව කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## නීතිරීතිවලට අනුකූලනොවීම

කළමණාකාරිත්වය විසින් ස්ථාපිත කොට ඇති පාලන ක්‍රියාවලීන්හි ප්‍රමාණාත්මක භාවය සහ අධිකාරියේ කටයුතුවලට බලපාන ව්‍යවස්ථාපිත හා අභ්‍යන්තර නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇද්ද යන්න කමිටුව විසින් විමර්ශනය කරනු ලැබේ. අභ්‍යන්තර විගණක විසින් අධිකාරියේ මූල්‍ය හා පරිපාලන, මෙහෙයුම් ක්‍රමවේදයන් සහ ගණුදෙනු හා සිද්ධීන්වල විනිවිධභාවය පිළිබඳ සෑම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකටම වාර්තා කරන ලදි.

## වැරදි හා වංචා පිළිබඳ ලැබෙන පැමිණිලි

අධිකාරියේ සේවකයින් විසින් ආචාර ධර්ම කඩකිරීම, වංචා සිදුකිරීම පිළිබඳව ලැබෙන සේවක පැමිණිලි කමිටුව විසින් විමර්ශනය කොට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන අතර, අධිකාරිය විසින් ස්ථාපිත කොට ඇති පාලන ක්‍රම මගින් වැරදි හා වංචා හෙළිදරව් වීමට හා ඒවා වළක්වා ගැනීමට කරනු ලබන විමර්ශනවල ස්වාධීනත්වය තහවුරු කරන ලදි.

ඩී.සී. සිරිබද්ධන මහතා
සභාපති - විගණන හා කළමණාකරණ කමිටුව
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාශය

# 2011 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතිකමය සංවර්ධනය අරමුණු කොටගෙන, 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරි පනත මගින් ස්ථාපිත කරනු ලැබ ඇත. ඒ අනුව, 1996 සිට මේ දක්වා වසර 15 ක් තිස්සේ මෙම අධිකාරිය විසින් ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්ක හතර සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් වසම් දෙකද ආවරණය වන සමස්ථ භූගෝලීය බල ප්‍රදේශයතුල ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා දැවැන්ත මෙහෙවරක් ඉටුකරමින් සිටී. එවැනි පසුබිමක් තුල, 2011 වසර සඳහා වන මෙම කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේ, මෙම අධිකාරිය මගින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ කාර්ය සාධනය විවිධ පැතිකඩ ඔස්සේ, අධිකාරිය පිළිබඳ ඇල්ම ඇති විවිධ පාර්ශවයන්ගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමයි. ඒ තුළින්, මෙම අධිකාරියට මූල්‍ය ප්‍රතිපාදන සළසා දෙනු ලබන, මහා භාණ්ඩාගාර විසින් සපයනු ලබන ප්‍රතිපාදන, අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, දක්ෂිණ ප්‍රදේශයේ ජනතාවගේ අභිලාශයන් ඉටුකරලීම සඳහාත් කොතෙක් දුරට ඵලදායීව යොදාගෙන ඇත්ද යන්න පිළිබඳව විග්‍රහයක් මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

ඉහත දැක්වූ අරමුණින් ඉදිරිපත් කෙරෙන මෙම වාර්තාව, පරිච්ඡේද පහකින් සමන්විත වන අතර, එහි පළමු පරිච්ඡේදයෙන් හැඳින්වීමද, දෙවන පරිච්ඡේදය තුලින් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිළිබඳ හැඳින්වීමද දක්වා ඇත. එහි අන්තර්ගතය මගින්, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ නෛතික තත්ත්වය, භූගෝලීය බලප්‍රදේශය, අධිකාරියේ පරමාර්ථ, බලතල සහ කාර්යභාරය, සංස්ථාපිත තොරතුරුද දක්වා ඇත. එමෙන්ම, තුන්වන පරිච්ඡේදයෙන්, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මේ දක්වා වන අතීත ගමන්මග දක්වා ඇත. ඒ තුලින්, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමෙන් පසු, ක්‍රමිකව, දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට දක්ෂිණ ප්‍රදේශයතුල අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති සහ ඒවායේ බලපෑම් ප්‍රධාන යුග තුනක් යටතේ විස්තර කරනු ලබයි . එමෙන්ම, හතරවන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ එක් එක් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ කාර්යසාධනය පැතිකඩ කිහිපයකින් දක්වා ඇත. අවසානයේදී, පස්වන පරිච්ඡේදයතුලින්, 2011 වසරේ සමස්ථ කාර්යසාධනය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරනු ලබයි.

මෙම වාර්තාවේ පහසු අවබෝධය සඳහා, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ආරම්භය හා එහි ව්‍යුහය මෙන්ම, කාර්ය කටයුතු පිළිබඳ අවබෝධයක් දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරනු ඇත.

## 2. ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමට අදාල නෛතික තත්ත්වය, අධිකාරියේ බලප්‍රදේශය, අධිකාරියේ පරමාර්ථයන්, බලතල සහ කාර්යභාරය පිළිබඳ අවධානය යොමුකිරීමේදී එම විස්තර පහත පරිදි දැක්විය හැකිය.

### 2.1 ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ නෛතික තත්ත්වය

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, 1996 අංක 18 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය අරමුදල් යොදාගනිමින් ක්‍රියාත්මක වන අධිකාරියකි.

## 2.2 භූගෝලීය බලප්‍රදේශය

අධිකාරියේ පනතේ 3 (1) වගන්තිය අනුව, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ බලප්‍රදේශයට ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කද, රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකද අයත් වේ. ඉහත පරිදි, දක්ෂිණ සංවර්ධන අධිකාරියේ බලප්‍රදේශයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 60 ක භූමි ප්‍රමාණයක් අයත් වේ. එම බල ප්‍රදේශය දැක්වෙන සිතියම, අධිකාරියේ ලාංඡනයද සමග පහත දක්වා ඇත.




## 2.3 අධිකාරියේ පරමාර්ථ, බලතල, කාර්ය සහ කර්තව්‍යයන්

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ පරමාර්ථ, බලතල, කාර්ය සහ කර්තව්‍යයන්, පනතේ 12 වන සහ 13 වන වගන්තිවල දැක්වෙන අතර, ඉන් උපුටාගත් විස්තරයක් පහත දක්වා ඇත.

### 2.3.1 අධිකාරියේ පරමාර්ථ - (පනතේ 12 වන වගන්තිය අනුව)

(අ) නිෂ්පාදනශීලිත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් සහ රැකියා අවස්ථා ජනනය කිරීම අරභයා වූ සංවර්ධන ව්‍යාපෘති, නම්කළ ප්‍රදේශයතුළ සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ආ) නම්කළ ප්‍රදේශයේ, සමස්ථ සංවර්ධන සැලැස්මෙන් හඳුනාගන්නාලද ව්‍යාපෘති, ප්‍රමුඛත්ව පදනමක් මත සවිස්තරව අධ්‍යයනය කිරීම.

(ඇ) යම් නිශ්චිත ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා විදේශීය අරමුදල් සපයා ගැනීමට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම.

(ඈ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයනය කිරීම සහ නම්කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රාජ්‍ය සංස්ථාවල සහ පොදු හෝ පෞද්ගලික වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ

(ඉ) (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයනය කිරීම සහ නම්කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, විදේශීය සහ දේශීය, පෞද්ගලික අංශයේ නියෝජිතායතනවල සහභාගීත්වය ලබා ගැනීම.

### 2.3.2. අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය - (පනතේ 13 වන වගන්තිය අනුව)

(අ) අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් තාක්ෂණික හා මූල්‍ය ආධාර ලබා ගැනීම.

(ආ) නම්කළ ප්‍රදේශයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයනය කිරීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දේශීය සහ විදේශීය සහභාගිත්වය ලබා ගැනීම.

(ඇ) නම්කළ ප්‍රදේශයේ කරගෙන යනු ලබන්නාවූ යම් ව්‍යාපෘති සැළසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සහයෝගයෙන් ක්‍රියා කරන ලෙස, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් සියළුම නියෝජිතායතනවලින් ඉල්ලා සිටීම.

(ඈ) අධිකාරිය විසින් කරවන ලද සංවර්ධන ව්‍යාපෘති භාරගෙන, නඩත්තුකර, ක්‍රියාත්මක කරන ලෙස, ජනාධිපතිවරයාගේ එකගත්වය ඇතිව, ආණ්ඩුවේ අමාත්‍යාංශවලින්, දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් බලධාරීන්ගෙන් ඉල්ලා සිටීම.

(ඉ) අධිකාරියේ කර්තව්‍ය කිරීමට අදාළ යම් කටයුතු සම්බන්ධයෙන්, අධිකාරියේම දෙපාර්තමේන්තු හෝ නියෝජ්‍යායතන පිහිටුවීම.

(ඊ) නම්කළ ප්‍රදේශයේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අදාළ පර්යේෂණ පැවැත්වීම.

(උ) නම්කළ ප්‍රදේශයතුළ වූ යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් පිළියෙළ කිරීම.

(ඌ) සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සහ සේවා ලබාගැනීම පිණිස, කලින් කල, ආණ්ඩුව විසින් නියම කරනු ලබන ටෙන්ඩර් පටිපාටියට අනුකූලව ටෙන්ඩර් ප්‍රදානය කිරීම.

(එ) නම්කළ ප්‍රදේශය තුළ, අධිකාරිය විසින් ඉටු කරනු ලබන සේවා සඳහා, ගාස්තුවක් පැනවීම හෝ අය කිරීම.

(ඒ) යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන යම් කාර්යාල පිරියත, යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ද්‍රව්‍ය මිළට ගැනීම, අත්කර ගැනීම, ඉදිකිරීම, නඩත්තු කිරීම, ප්‍රතිනිර්මාණය කිරීම හෝ සකස් කර ගැනීම.

(ඔ) යම් පොදු හෝ පෞද්ගලික ආයතනයක් මගින් හෝ පොදු හෝ පෞද්ගලික ආයතන සමග හවුලේ හෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඕ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව, ශ්‍රී ලංකාවේ ප්‍රභවයන්ගෙන් මුදල් ණයට ගැනීම, මුදල් ලබා ගැනීම හෝ බැදීම් අත්කර ගැනීම.

(ක) නිශ්චල දේපළ කිසිවක්, කවරවුවද ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බදු ගැනීම හෝ කුලියට ගැනීම හෝ බදු දීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම සහ

(ච) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ පරමාර්ථ ඉටු කර ගැනීමට හෝ මේ පහත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට ආනුෂාංගික වන හෝ හිතකර වන වෙනත් සියළු ක්‍රියා කිරීම.

## 2.4 සංස්ථාපිත තොරතුරු

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූලික සංස්ථාපිත තොරතුරුවල කොටසක් ලෙසින් එහි දැක්ම, මෙහෙවර හා වටිනාකම් පහත දක්වා ඇත.

### 2.4.1 දැක්ම

අධිකාරියේ දැක්ම වන්නේ, "තරුණ තරුණියන්හට ආකර්ශණීය හා අභියෝගාත්මක ඉඩප්‍රස්ථා සලස්වමින්, වේගවත්ව වර්ධනය වන ආසියානු පැසිෆික් කලාපයට, පිවිසුම් මාර්ගයක් ලෙස මෙම ප්‍රදේශය විවෘත කරමින්, පාරිසරික ලෙස ධරණීය සහ සංස්කෘතිකමය වශයෙන් උද්දීපනය වූ පරිසරයක් තුළ, ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වූ දක්ෂිණ ලංකාවක් නිර්මාණය කිරීමයි"

### 2.4.2 මෙහෙවර

අධිකාරියේ මෙහෙවර වන්නේ, "අභියෝගාත්මක ඉඩප්‍රස්ථාවන් ලබාදෙන පරිසරයක් සහ උසස් ජීවන තත්වයක් තුළ, ප්‍රදේශයේ සම්පත් හා අවශ්‍යතා සියුම්ව හඳුනාගනිමින් හා පුද්ගලික අංශයේ හා රේඛීය නියෝජිතායතනවල සම්බන්ධීකරණයෙන්, සැලසුම් කිරීමෙන් හා සංවර්ධනය කිරීමෙන්, ඉලක්කගත මට්ටමේ දළ දේශීය නිෂ්පාදන මට්ටම සාක්ෂාත් කරගැනීම සඳහා සහාය වෙමින්, ප්‍රදේශයේ දළ දේශීය නිෂ්පාදනයේ වේගවත් වර්ධනයට දායක වීමයි."

## 2.4.3 වටිනාකම්

අධිකාරියේ වටිනාකම් වන්නේ,

- ගණුදෙනුකරුවන් උදෙසා වන කැපවීම සහිත සේවය
- දායකත්වයට හා විශිෂ්ඨත්වයට පත්වීමට අදාලව සැමට දිරිදීම
- ආචාරශීලීබව
- අන් අයට ගරු කිරීම
- සවන්දීම, සිතීම, අභියෝග භාරගැනීම හා කඩිම ලෙස වැඩ කිරීම

2011 වසරට අදාල මෙම කාර්ය සාධන වාර්තාව පරිශීලනය කරන්නන්ට අධිකාරියේ ආරම්භක ගමන් මග හා එය ක්‍රමිකව විකාශනය වූ ආකාරය පිළිබඳ අවබෝධය ලබාගැනීමේ පහසුව සඳහා, ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරියේ ආරම්භයේ සිට 2011 වර්ෂය දක්වා අධිකාරිය විසින් සිදුකල කාර්ය කටයුතු පිළිබඳ පැහැදිලිකිරීමක් තුන්වන පරිච්ඡේදයතුලින් ඉදිරිපත් කර ඇත.

## 3. 1996 සිට 2010 දක්වා කාලයතුල සංවර්ධන ක්‍රියාවලිය

ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරිය ආරම්භ කිරීමෙන් පසු, පසුගිය වසර 15 ක කාලය තුල, විවිධ ප්‍රවේශයන් ඔස්සේ, දකුණු ප්‍රදේශයතුල, සිය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී. එලෙස දකුණු ප්‍රදේශයේ උන්නතිය හා පුනර්ජීවය වෙනුවෙන්, ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක වූ ආකාරය පහත පරිදි වන යුග තුන යටතේ දැක්විය හැක.

| | |
|---|---|
| 3.1 | 1996 සිට 1998 දක්වා යුගය |
| 3.2 | 1999 සිට 2006 දක්වා යුගය |
| 3.3 | 2007 සිට 2011 දක්වා යුගය |

ඉහත යුග තුන අතුරින් අධිකාරියේ ආරම්භක යුගය වන, 1996 සිට 1998 දක්වා යුගය, දකුණු ප්‍රදේශය තුල, නව පුනර්ජීවයක් ලබාදීම අපේක්ෂාවෙන් මහා පරිමාණ ව්‍යාපෘති සැලසුම් කල යුගය ලෙස දැක්විය හැක. එම යුගයතුලදී ක්‍රියාත්මක කරන ලද කාර්ය කටයුතු පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

## 3.1 1996 සිට 1998 දක්වා යුගය

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ආරම්භ කල මුල් වකවානුවතුල එනම්, 1996 සිට 1998 දක්වා වූ කාලයතුල, එවකට පැවති රජයේ උපදෙස් හා මගපෙන්වීම් අනුව, දක්ෂිණ ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ඉතාමත් ඵලදායිවූ, ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සැලසුම් ඉදිරිපත් කරන ලදී.

මේ අනුව, ආරම්භයේ රුහුණුපුර සංවර්ධන සංකල්පය ඔස්සේ හා දකුණු ද්වාරය සංකල්පය යටතේ, දක්ෂිණ ප්‍රදේශය ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට යෝග්‍ය භෞතික හා මානව සම්පත්වලින් යුත් ප්‍රදේශයක් බව හඳුනාගෙන, ඊට ගැලපෙන ව්‍යාපෘති සම්බන්ධව මූලික පූර්ව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකොට, ඒ අනුව සැලසුම් සකස් කරන ලදී. ඒ අනුව, එම සැලසුම් තුලින් හඳුනාගත් ව්‍යාපෘති මේ වන විට අදාල රේඛීය ආයතන මගින් ක්‍රියාත්මක කිරීම අරඹා ඇති අතර, එලෙසින් දකුණු ප්‍රදේශයේ සංවර්ධනයට දායකවීමට හැකිවීම ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය එක් අතකින් ලබාගත් ජයග්‍රහණයකි. එම සැලසුම් පහත පරිදි වේ.

- හම්බන්තොට ජාත්‍යන්තර වරාය ඉදිකිරීම,
- දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම,
- දක්ෂිණ ප්‍රදේශ අන්තර් ආදර්ශන ප්‍රවාහන ජාලය සම්බන්ධ යෝජනාව,
- ගාලු වරාය වැඩිදියුණු කිරීම,
- දක්ෂිණ අන්තර්ජාතික ගුවන් තොටුපල ඉදිකිරීම,
- මාතර කතරගම දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීම

ඉහත මූලික කාර්යයන්ට අමතරව, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ආරම්භක ගමන් මගෙහි දෙවන කඩඉම ලෙස 1999 සිට 2006 දක්වා යුගය දැක්විය හැකිය. මෙම කාලය තුල සිදුකරන ලද කාර්ය කටයුතු පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

## 3.2 1999 සිට 2006 දක්වා යුගය

ඉහත දැක්වූ පරිදි, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූලික මෙහෙවර ඉටුකිරීමෙන් පසු, 1999 සිට ප්‍රධාන අංශ අටක් යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. එම අංශ ලෙස, කර්මාන්ත, වැවිලි, ධීවර, පුහුණු, කෘෂිකර්ම, ඉඩම්, අලෙවි හා සේවා දැක්විය හැකිය. මෙම අංශ යටතේ ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදි. තවද, දේශීය හා විදේශීය ආයෝජන දක්ෂිණ ප්‍රදේශයට රැගෙන ඒමටද කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරන ලදි. එමෙන්ම, එම ආයෝජනවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ කර්මාන්ත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීමද මෙම අධිකාරිය මගින් සිදුකරන ලදි. එවැනි කර්මාන්ත අතරින් ප්‍රධාන කර්මාන්ත කිහිපයක් පිළිබඳ සාරාංශගත විස්තර පහත දක්වා ඇත.

### 3.2.1 මාතර තිහගොඩ ඔලියගොඩවත්ත තාප බලාගාරය

කර්මාන්ත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීම සිදුකරන ලද ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුන්වාදිය හැකිය. එම කර්මාන්තය ස්ථානගත කිරීම සඳහා අක්කර 50 පමණ භූමි භාගයක් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මැදිහත්වීම මත ඒස් පවර් ජෙනරේෂන් පුද්ගලික සමාගමට ලබාදෙන ලදි. මේ වන විට, මෙම තාප විදුලි බලාගාරය මගින් මසකට මෙගාවොට් 480 සිට 576 දක්වා වන විදුලිය ධාරිතාවක් ජාතික විදුලි පද්ධතියට එකතු කරනු ලබයි.

### 3.2.2 මාතර මිදිගම ලෝඩ්ස්ටාර් කර්මාන්ත ශාලාව

කර්මාන්ත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීම සිදුකරන ලද තවත් ව්‍යාපෘතියක් ලෙස මෙම කර්මාන්ත ශාලාව හඳුන්වාදිය හැකිය. එනම්, මෙම කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීමට අවශ්‍ය ඉඩම් ලබාදීමට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් සහ කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක කිරීමට අදාල බලපත්‍ර ලබාගැනීමේ දී අදාල අනෙකුත් සියළු ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකොට ඊට සහායවීමද මෙම අධිකාරිය මගින් සිදුකරන ලදි. එමගින් උත්පාදනයවී ඇති සෘජු රැකියා ප්‍රමාණය 5700 පමණ වන අතර, මෙම කර්මාන්තය ස්ථාපිත කිරීම තුලින්, ප්‍රදේශයේ රබර් කිරි සපයන ගොවීන් 2000 කගේ පමණ ආර්ථික මට්ටම ඉහළ ගොස් ඇත. මෙම ව්‍යාපෘතියේ ඇති ප්‍රධාන වැදගත්කමක් වන්නේ, මෙම කර්මාන්තශාලාවේ නිපදවන ටයර් විදේශවලට අපනයනය කිරීමෙන් වාර්ෂිකව අප රටට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් උපයාදීමයි.

### 3.2.3 කුඹල්ගම ඉසුරු සෙරමික් නිෂ්පාදන ආයතනය

මෙම කර්මාන්තය, පිගන් මැටි යොදාගෙන විසිතුරු පිගන් භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවකි. මෙහි ආයෝජනය රු. මිලියන 3 ක් පමණ වේ. මෙය දේශීය හා විදේශීය වෙළඳපොළ මුල්කරගත් නිෂ්පාදන කර්මාන්ත ශාලාවකි. මෙහි දෛනික නිෂ්පාදනය ඒකක 500 ක් පමණ වන අතර, එම ව්‍යවසායකයාගේ මාසික ආදායම රු 100,000 - රු. 200,000 අතර වේ. මේ තුලින් සෘජු රැකියා 11 ක් සහ වක්‍ර රැකියා 4 ක් උත්පාදනය වී ඇත. දේශීය හා විදේශීය වශයෙන් පවතින ඉල්ලුමට සරිලන නිමැවුමක් සිදුකිරීම සඳහා, අධිකාරිය විසින් අදාල ආයෝජකයාට සෑම විටම අදාල දිරිය ලබාදීම සිදුකරනු ලබයි.

### 3.2.4 ඇඹිලිපිටිය ව්‍යවසායක කේන්ද්‍රය

මෙම ව්‍යවසායක කේන්ද්‍රය, කර්මාන්ත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් අධිකාරිය මගින් සපයා දීම සිදුකරන ලද, තවත් සාර්ථක ව්‍යාපෘතියකි. මෙය පුද්ගලික ආයෝජන දිරිගැන්වීමේ අරමුණින් ආරම්භ කර ඇති අතර, මෙමගින්, අත්හැර දමන ලද ගොඩනැගිලි 6 ක් ප්‍රතිසංස්කරණය කොට, සාර්ථක ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සපයාදී ඇත. මෙම ස්ථානයේ ආරම්භ කර ඇති කර්මාන්ත සහ ව්‍යවසායයන් ලෙස, බේකරි නිෂ්පාදන, වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, කාර්යාලීය උපකරණ නිෂ්පාදන, මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රචාරණ කටයුතු කිරීම, අභ්‍යාස පොත් නිෂ්පාදනය, පරිගණක ආශ්‍රයෙන් මුද්‍රණ කටයුතු සිදුකිරීම දැක්විය හැක. මෙමගින්, සෘජු රැකියා අවස්ථා 120 ක් හා වක්‍ර රැකියා අවස්ථා 200 ක් පමණ උත්පාදනය වී ඇත. එමෙන්ම, මෙම ව්‍යවසායයන් මගින්, වාර්ෂිකව දළ ජාතික නිෂ්පාදිතයට රු. මිලියන 05 ක පමණ දායකත්වයක් ලබාදීමට හැකියාව ලැබී ඇත.

### 3.2.5 මාතර කඹුරුපිටිය රටලංකාවත්ත ඔටෝ ලංකා ටයර් කර්මාන්ත ශාලාව

මෙයද, කර්මාන්ත ස්ථානගත කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයා දීම සිදුකරන ලද තවත් ව්‍යාපෘතියකි. මෙම කර්මාන්තය සඳහා රු. මිලියන 96 ක පමණ අයෝජනයක් සිදුකොට ඇති අතර, ටයර් නිෂ්පාදනයට අවශ්‍ය බෙල්ට් සැකසීම හා එයට අදාල ගම් නිෂ්පාදනය (මෙය කලින් ඉන්දියාවෙන් ආනයනය කරන ලදි) මෙහිදී සිදු කරනු ලබයි. මේ සඳහා අක්කර 05 ක භූමි ප්‍රමාණයක් අධිකාරිය විසින් ලබා දී ඇත . මෙම ව්‍යාපෘතිය මගින්, පුද්ගලයින් 80 දෙනෙකුට පමණ රැකියා සපයා ඇත. මෙමගින්, රුපියල් මිලියන 400 කින් පමණ විදේශ විනිමය ඉතිරි කරගැනීමට හැකිවී ඇති අතර, මෙම නිෂ්පාදනයේ මූලික අමුද්‍රව්‍යය වන රබර් සඳහා පවතින දේශීය ඉල්ලුම සපුරාලීමට හැකිවීමෙන්, ප්‍රදේශයේ කුඩා රබර් වතු හිමියන් 2000 ක ගේ පමණ ආදායම ඉහල නංවාලීමට හැකිවී ඇත.

### 3.2.6 අක්‍රියව පැවති තේ කර්මාන්ත ශාලා නැවත නගාසිටුවීම

අතීතයේ වසර කීපයක් තිස්සේ, දකුණු ප්‍රදේශයේ අක්‍රියව පැවති තේ කර්මාන්තශාලා කිහිපයක් නැවත නගාසිටුවාලීම මගින්, දක්ෂිණ ප්‍රදේශයේ තේ ආර්ථිකයට විශාල මෙහෙයක් සිදුකිරීමට හැකිවීම ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය ලබාගත් තවත් ජයග්‍රහණයකි. මේ අතරට, මාතර, ගලගාව තේ කර්මාන්ත ශාලාව, ගාල්ල, තවලම ජස්මින්වැලි තේ කර්මාන්ත ශාලාව, වලස්මුල්ල, හඳුගල, තේ කර්මාන්තශාලාව හා කොලොන්න, පනිල්කන්ද තේ කර්මාන්තශාලාව ද ඇතුලත් වන අතර, මෙම සියලු ව්‍යාපෘතිතුලින්, සැලකියයුතු විදේශ විනිමය ප්‍රමාණයක් රටතුලට රැගෙන ඒමට හැකියාව උදාවීමද අප ලද ජයග්‍රහණයකි.

එමෙන්ම, සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා මූලික යටිතල පහසුකම් ලබාදීමට අමතරව, මෙම වකවානුවතුල, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් සමස්ථ බල ප්‍රදේශයතුල, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි, සකස් කරන ලද, කෙටි කාලීන සංවර්ධන සැලසුම් තුලින්, ග්‍රාමීය යැපුම් මට්ටමේ ආර්ථිකය සැලකියයුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීම සඳහා දායකත්වයක් සපයන ලදී. විශේෂයෙන් මේ යටතේ ග්‍රාමීය කෘෂි ආර්ථිකයට මෙන්ම වැවිලි ආර්ථිකයටද විශාල දායකත්වයක් ලබාදෙමින්, වඩාත් තිරසාර වූ සංවර්ධන ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කරන ලදි.

කෙටි කාලීන සංවර්ධන සැලසුම් තුලින්, දක්ෂිණ ප්‍රදේශයතුල, නිෂ්පාදනශීලීත්වය ඉහළ නැංවීමට විශාල දායකත්වයක් ලබාදෙනු ලබන හා ඉතා දරිද්‍රතාවයෙන් පෙළෙනු, දුෂ්කර ගම්මානවල වෙසෙන ජනතාවගේ මූලික යටිතල පහසුකම් අවශ්‍යතා හඳුනාගනිමින්, ඒවා සපුරාලීම හා ඔවුන්ගේ ජීවනෝපායන් නංවාලීම සඳහා, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි, දුෂ්කර ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහනක් බැගින් ක්‍රියාත්මක කරන ලදි. ඒ තුලින්ද, නගරයෙන් ඈත්ව සිටි බොහෝ ජනකොටසකගේ ජීවන මට්ටම උසස් කර ගැනීමට හා ඔවුන්ගේ ආර්ථික කටයුතු ශක්තිමත් කරගැනීමට හැකිවිය. මීට අමතරව, අධිකාරියේ මූලික අරමුණු ඉටුකරගැනීම සඳහා, ඒකාබද්ධ සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යනුවෙන් නව සංකල්පයක් යටතේ, තෝරාගත් ගම්මානයන්හී සමාජ, ආර්ථික හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම අරඹයා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ඉන් අනතුරුව, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ආරම්භක ගමන් මගෙහි තෙවන කඩඉම පසුකරමින්, සංවර්ධනයේ නව මාවත්වලට අවතීර්ණ වීමට අධිකාරියට හැකිවිය. ඒ අනුව, 2007 සිට 2010 දක්වා වන කාලය තුල සිදුකරන ලද කාර්ය කටයුතු පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

## 3.3 2007 සිට 2010 දක්වා යුගය

මෙම කාලසීමාව තුළදී, දුෂ්කර ගම්මාන සංවර්ධන සංකල්පයෙන් ඔබ්බට ගොස්, නව දැක්මක් යටතේ සංවර්ධන කටයුතු වඩාත් අර්ථාන්විතව සිදුකිරීමේ අවස්ථාව අධිකාරියට උදාවිය. එනම්, 2007 වර්ෂයේ සිට, "මහින්ද චින්තන" ජාතික ප්‍රතිපත්තියට අනුගත වෙමින්, ජාතික සවිය - ගමනැගුම සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථිකයට නව පුනර්ජීවයක් ලබාදීමේ වගකීම ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය වෙත පැවරුනි. මේ අනුව, "ජාතික සවිය - ගමනැගුම" සංවර්ධන වැඩසටහන ප්‍රධාන සංරචක 03 ක් යටතේ, එනම්, ආර්ථික හා ජීවනෝපාය සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාත්මික හා සදාචාර සංවර්ධනය යනුවෙන් ප්‍රමුඛතා පදනමින් හඳුනාගත් වැඩසටහන්, තෝරාගත් සියලුම ගම්මානයන්හි ක්‍රියාත්මක කරන ලදි. ජනතාවගේ සහභාගීත්වය පදනම් කරගත් සංකල්පයක් අනුව යමින්, ඔවුන්ගේ මූලිකම අවශ්‍යතා සපුරාලීම තහවුරු කෙරෙන, ඔවුන්ගේ අදහස් හා යෝජනා ඇතුළත්ව සකස් කරන ලද ගම්මාන සංවර්ධන සැලැස්ම (VDP) යටතේ මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මකවීම මෙහි ඇති විශේෂත්වයයි.

මේ අනුව "ජාතික සවිය - ගම නැගුම" සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 හි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට 01 බැගින් වන සේ ගම්මාන 47 ක් සංවර්ධනය කරන ලදි. එනම්, ගාල්ල දිස්ත්‍රික්කයේ ගම්මාන 18 ක්, මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 12 ක් හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගම්මාන 17 ක් වශයෙනි. 2007 වර්ෂයේ තෝරාගත් ගම්මානද ඇතුළත් වන පරිදි, 2008 හා 2009 වර්ෂවලදී, ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවල ගම්මාන 150 ක් තෝරාගෙන, ප්‍රමුඛතා පදනමින් එම වසම්වල තෝරාගත් ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, 2008 සිට 2010 දක්වා තෙවසරක කාලය තුලදී, ජාතික සවිය ගම නැගුම සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය මගින් වැයකරන ලද මුළු මුදල රු. මි. 694 කි. එමගින්, පැහැදිලිවම අධිකාරියේ මූලික පරමාර්ථ සැලකිය යුතු දුරකට සාක්ෂාත් කරගත හැකි විය.

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් ආරම්භයේ සිට මේ දක්වා සිදුකරන ලද සංවර්ධන කාර්‍යයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් මෙම පරිච්ඡේදය තුළින් ලබාදීමට අපේක්ෂා කල අතර, 2011 වර්ෂයේ කාර්ය කටයුතු පිළිබඳ අවබෝධයක් හතරවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරනු ඇත.

## 4. 2011 වර්ෂයේ කාර්යසාධනය

2011 වර්ෂයේදී දක්ෂිණ සංවර්ධන අධිකාරි බලප්‍රදේශයතුල තෝරාගත් ගම්මාන 150 තුළ, වත්මන් රජයේ නවතම වැඩසටහන වූ "දිවිනැගුම" හා මෙතෙක් ක්‍රියාත්මක වූ "ජාතික සවිය - ගමනැගුම" සංකල්පය තවදුරටත් ඉදිරියට ගෙනයමින් ඊට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. වත්මන් රජයේ නව දැක්ම වන ජීවනෝපාය සංවර්ධනය හා සමාජ සංවර්ධනය තුලින් වර්ෂ 2016 වන විට සමෘද්ධිමත් ගමක් නිර්මාණය කිරීමේ භාරදූර්ය කාර්යය යථාර්තයක් බවට පත්කරලීමට අධිකාරිය එලෙස සක්‍රියව දායකවන ලදි. ඒ සඳහා, 2011 වර්ෂය තුළදී, ප්‍රධාන වශයෙන් පස්වැදෑරුම් ආකාරයක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. එනම්, දිවි නැගුම ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන ව්‍යාපෘති, දිවි නැගුම ශක්තිමත් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති, ජාතික සවිය ගම නැගුම අඩු ආදායම් ලාභී නිවාස ව්‍යාපෘතිය, ආදායම් උත්පාදන ව්‍යාපෘති සහ පස් අවුරුදු සංස්ථාපිත සැලැස්ම යටතේවන ව්‍යාපෘති වශයෙනි.

ඒ අනුව, 2011 වර්ෂය තුළදී, සමස්ථ සංවර්ධන ඉලක්ක කරා ලගාවීමට "දිවිනැගුම වැඩසටහන", ජාතික සවිය - ගමනැගුම ජාතික වැඩසටහන හා ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල රැඳවුම් මුදල් ගෙවීම ඇතුලත් වෙනත් වැය යටතේ, මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 300.5 ක මුදලක් වෙන්කර ලබාදෙන ලදී. මීට අදාලව පිළියෙල කළ සැලැස්මට මූල් අවස්ථාවේ පදනම් වූයේ, ජාතික සවිය ගම නැගුම වැඩසටහනට අදාල ව්‍යාපෘතීන්ය. එහෙත්, පසුව අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, ඊට, දිවි නැගුම නව ජාතික වැඩසටහනේ ව්‍යාපෘතිද ඇතුළත් කොට, මූල් සැලැස්ම සංශෝධනය කොට ඉදිරිපත් කිරීමෙන් පසු එය අනුමත වීමෙන් පසු, මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම ආරම්භ වූයේ 2011 ජූලි මාසයේදීය. මෙලෙස තරමක් ප්‍රමාදව සැලැස්ම අනුමතවීම හා මුදල් ලැබීම හේතුකොටගෙන, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද රුපියල් මිලියන 300.5 කින් සමන්විත වූ සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධිකාරියට විශාල අභියෝගයක් විය. එනම්, බලප්‍රදේශයතුල, අදාල සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කොට, මෙම වර්ෂය තුළම නිමකිරීමේ කාර්යයයි.

මෙවන් තත්ත්වයක් යටතේ, වෙන්කරන ලද රුපියල් මිලියන 300.5 න්, රුපියල් මිලියන 152.26 ක් වැය කරමින්, වසර අවසාන වන විට 51% ක මූල්‍ය ප්‍රගතියක් හා භෞතික වශයෙන් ව්‍යාපෘති 1048 කින් ව්‍යාපෘති 529 ක් සම්පූර්ණයෙන්ම නිමකරමින් 51% ක භෞතික ප්‍රගතියක් ලබාගැනීමට හැකිවීම අධිකාරිය ලැබූ ජයග්‍රහණයකි. මීට අදාල තොරතුරු පැහැදිලි කෙරෙන ප්‍රස්තාරමය රූපසටහනක් පහත දක්වා ඇත.

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
2011 සංවර්ධන වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය (රු.මි.)




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය දත්ත පද්ධතිය

මෙම සංවර්ධන වැඩසටහන්තුලින්, 2011 වසරේදී රටේ දළ දේශිය නිෂ්පාදනයට රුපියල් මිලියන 280 ක පමණ දායකත්වයක් ලබා දීමටද අධිකාරියට හැකියාව ලැබුණි. එනම්, දිවි නැගුම ගෘහ ආර්ථික ඒකක වැඩසටහනට අදාළ ව්‍යාපෘතිවලින් රු. මි. 154 ක් පමණද, ජාතික සවිය ගම නැගුම වැඩසටහනට අදාළ ව්‍යාපෘතිවලින් රු. මි. 126 ක් පමණ ද වශයෙනි.

මේ ආකාරයට 2011 වර්ෂයේ දී, ඉහතින් දැක්වූ පස්වැදෑරුම් ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර, එම එක් එක් ව්‍යාපෘතිවලට අදාළ විස්තර පහත දක්වා ඇත.

## 4.1. දිවි නැගුම ගෘහ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන

ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීම වත්මන් රජයේ "මහින්ද චින්තනයේ" එක් මූලික අරමුණකි. ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගාසිටුවා, සුභසාධන සංකල්පයෙන් බැහැර විය යුතුය යන්න එහි ගැඹුරු අදහසයි. ඒ අනුව, දිවිනැගුම ගෘහ ආර්ථික ඒකක දශලක්ෂයේ වැඩසටහන යටතේ, ගෘහ ඒකක 15000 ක ආර්ථික තත්ත්වය නගාසිටුවීම අරමුණු කොටගෙන, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, දක්ෂිණ බලප්‍රදේශයතුළ 2011 වසරේදී, ආර්ථික සංවර්ධන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. එනම්, මේ යටතේ වන ප්‍රධාන සංරචක තුනවන, ගෘහ කර්මාන්ත සංවර්ධන, කෘෂිකර්ම සංවර්ධනය, ධීවර හා පශු සම්පත් සංවර්ධනය යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙම සෑම වැඩසටහනක්තුලින්ම දක්ෂිණ ප්‍රදේශයේ ආහාර නිෂ්පාදනයේ අතිරික්තයක් සිදුවන අතර, එතුලින්, ජනතාවගේ පෝෂණ මට්ටම ඉහලයෑමක් මෙන්ම, අතිරික්තය අලෙවි කොට අමතර ආදායමක් උපයා ගැනීමේ අවස්ථාවද ප්‍රතිලාභී පවුල්වලට උදාවී ඇත.

ඉහතින් දැක්වූ සංවර්ධන කාර්යයන් ආංශික 06 ක් යටතේ ක්‍රියාත්මක කරන ලදී. එනම්, කර්මාන්ත සංවර්ධන, වැව්ලි සංවර්ධන, කෘෂි හා පශු සම්පත් සංවර්ධන, මානව සම්පත් හා පුහුණු සංවර්ධන, ධීවර හා පශු සම්පත් සංවර්ධන හා ඉඩම් ඵලදායිතා සංවර්ධන ව්‍යාපෘති යනුවෙනි. එම එක් එක් ආංශික සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

### 4.1.1. කර්මාන්ත අංශය මගින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

කර්මාන්ත අංශය මගින්, 2011 වර්ෂයතුළ, තෝරාගත් ගම්මාන 150 තුළ, පදිංචි ප්‍රතිලාභී පවුල් අතරින් විවිධ ව්‍යවසායකත්ව හැකියාවන් ඇති පවුල් තෝරාගෙන, ඔවුන්ගේ ව්‍යවසායයන් හා කර්මාන්ත තව තවත් වැඩිදියුණු කරලීමටත්, එමගින්, එම පවුල්වල ජීවනෝපාය හැකියා වර්ධනය කරලීමටත් කටයුතු කරන ලදී. ඊට අදාල විස්තර පහත දක්වා ඇත.

- **ව්‍යාවසායකත්ව සංවර්ධන සහ තාක්ෂණික හුවමාරු වැඩසටහන**

මේ යටතේ, තෝරාගත් ගම්මාන 150 ක් තුළ, තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා කර්මාන්ත, ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ මූලික දැනුවත් කිරීම සිදුකිරීම හා ව්‍යවසායකත්ව සංවර්ධන සහ තාක්ෂණික හුවමාරු වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන්වලට සහභාගීවූ ප්‍රතිලාභීන්ගේ දක්ෂතා සහ අවශ්‍යතා සැලකිල්ලට ගෙන ප්‍රතිලාභීන් 422 ක් වෙනුවෙන් රු.මි. 2.9 ක වියදමින් ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය උපකරණ බෙදාදෙන ලදී.

මීට අමතරව, දිවිනැගුම විශේෂ ව්‍යාපෘතියක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ පලොල්පිටිය ගම්මානයේ බට කර්මාන්තකරුවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා ඔවුන්ගේ පොදු සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට විදුලිය ලබාදීම සඳහා රු. 50,000/-ක වියදමක් දරන ලදී. මෙම ගොඩනැගිල්ලට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් රු. ලක්ෂ දෙකක් පමණ වටිනා යන්ත්‍ර උපකරණද ලබාදී ඇත.

ඉහත සඳහන් ව්‍යාපෘති ඇසුරෙන් තමන්ගේ ජීවනෝපාය සංවර්ධනය සළසා ගෙන ඇති එක් ව්‍යවසායෙකුගේ සාමාන්‍ය මාසික ආදායම රු. 35,000/- ක් වන අතර, මාසික ලාභය රු. 7,000/- ක් පමණ වේ.






**ඇඳුම් මසුරුදුව ගම්මානයේ ප්‍රතිලාභීන්**

- **ග්‍රාමීය කාන්තාවන්ගේ ආහාර නිෂ්පාදන, ව්‍යවසායයන් සංවර්ධනය කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහන, සාර්ක් අරමුදලේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන්නකි. 2011 වසර තුළදී මෙම වැඩසටහන සඳහා දකුණු ප්‍රදේශයෙන් ප්‍රතිලාභීන් 350 දෙනෙකු තෝරා ගන්නා ලදී. මේ අතරින්, 120 දෙනෙකු සඳහා ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ දේශීය තාක්ෂණික පුහුණුවීම් ද, 48 දෙනෙකු සඳහා ඉන්දියාවේ දී විදේශීය තාක්ෂණික පුහුණුවීම් ද ලබාදෙන ලදී.





**දේශීය රසකැවිලි නිෂ්පාදන තාක්ෂණික පුහුණු වැඩසටහනක් පැවැත්වීම - කතරගම**

තවද, දේශීය සහ විදේශීය අලෙවි ප්‍රදර්ශන සහ වෙළඳපොළ සඳහා ව්‍යවසායිකාවන් 35 දෙනෙකු සහභාගී කරවන ලදී. ඔවුන් අතරින්, පස් දෙනෙකු සඳහා අඛණ්ඩව විදේශීය ඇණවුම් ලැබෙමින් පවතී. සමස්ථ වැඩසටහනේ එක් ප්‍රතිලාභියෙකුගේ සාමාන්‍ය මාසික ආදායම රු. 50,000/- ක් පමණ වන අතර, එක් අයෙකුගේ මාසික ලාභය රු. 10,000/- පමණ වේ. මීට අමතරව, මෙම වැඩසටහන යටතේ දකුණු සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන් 10 දෙනෙක්ද ඉන්දියාවේ කාන්තා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ අධ්‍යයන චාරිකාවක් සඳහා යවන ලදී. වැඩසටහනේ සමස්ථ වියදම රු. මිලියන 10 ක් පමණ වන අතර, එම සියළු වියදම් සාර්ක් සංවර්ධන අරමුදල් යටතේ ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය විසින් දරන ලදී.

- **ග්‍රාමීය කර්මාන්ත ව්‍යාපාර සඳහා බැංකු මූල්‍ය පහසුකම් ලබාදීමේ වැඩසටහන**

ශ්‍රී ලංකා මහ බැංකුව සමග ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපාදන යටතේ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන් 28 ක් පැවැත්වූ අතර, ඒ සඳහා රු. 140,000/- ක වියදමක් දරන ලදී. මෙම වැඩසටහන්වලට සහභාගී වූ ව්‍යවසායකයින් 66 දෙනෙකුගේ විවිධ කර්මාන්ත ව්‍යාපාර සඳහා රු. මිලියන 6.84 ක ණය මුදල් ලබාදී ඇත. එම එක් ව්‍යාපාරිකයෙකුගේ සාමාන්‍ය මාසික ආදායම රු. 50,000/- ක් පමණ වන අතර, මාසික ලාභය රු. 10,000/- ක් පමණ වේ.

- **දක්ෂිණ ප්‍රදේශයේ කොහු නිෂ්පාදන ඒකක සංවර්ධන වැඩසටහන**

ඔක්ස්ෆෑම් (Oxfam) සහ රුහුණු ආර්ථික සංවර්ධන කාර්යාංශයේ අරමුදල් යටතේ, දක්ෂිණ ප්‍රදේශයේ කොහු නිෂ්පාදන ඒකක 30 ක් මෙම වැඩසටහන යටතේ සංවර්ධනය සඳහා තෝරා ගන්නා ලදී. මෙම ඒකක සඳහා ලුණුවිල සහ දුන්කන්නාව ප්‍රදේශයේ දී තාක්ෂණික පුහුණුවීම් සහ ක්ෂේත්‍ර පුහුණු චාරිකාද, කලමණාකරණ සංවර්ධන පුහුණුවීම් ද ලබාදෙන ලදී. ඊට අදාල වියදම රු. 180,000/- ක් පමණ විය. මෙම පුහුණුවීම් හේතුකොටගෙන, කොහු නිෂ්පාදන ඒකකවල නිෂ්පාදන ධාරිතාවය වැඩි කරගැනීමට ද, නිෂ්පාදන වියදම් අඩු කරගැනීමටද හැකි වී ඇත. එමගින්, එක් ඒකකයක මාසික ලාභය රු. 5,000/- කින් පමණ වැඩි කරගෙන ඇත. දැනට මෙම ව්‍යාපෘති සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා අදාල බැංකු ආයතනවලට යොමු කරනු ලැබ ඇත.

### 4.1.2. වැවිලි අංශය මගින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

වැවිලි අංශය මගින්, 2011 වර්ෂයතුළ, පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සෘජුව හා විවිධ රේඛීය ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදී. ඊට අදාල සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

- **තේ පැළ තවාන් සංවර්ධන වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදී. "දිවිනැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය තේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙමින්, ගෙවතු වගා සංවර්ධනය සඳහා අවශ්‍ය වන තේ පැළ, ගම්මාන තුලින් සපයාගැනීමට තේ වගාකරුවන්ට අවස්ථාව ලබාදෙමින්, තේ පැළ තවාන් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන තුලින් වැඩි නිෂ්පාදනයක් සහිත තේ ක්ලෝනවලින් යුක්ත තේ පැළ නිෂ්පාදනය කරගැනීමට අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදෙස්ද තේ තවාන්කරුවන්ට ලබාදීමද, රෝපණ ද්‍රව්‍ය සඳහා අවශ්‍ය තේ රිකිලි සහ තේ පැළ සකස් කිරීම සඳහා අවශ්‍ය පොලිතින් බෑග් (එක් ප්‍රතිලාභියෙක් සඳහා බෑග් 3,000 බැගින්) සැපයීමද සිදු කරන ලදී.

මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 101 කගේ පමණ ආදායම ඉහල නැංවීමට අවස්ථාව උදාවන අතර, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තාක්ෂණික දැනුම ලබාදීම හා උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සපයාගැනීමට ක්‍රියාකාරීව දායකත්වය සපයන ලදී. එමෙන්ම, මේ තුලින් වැඩි නිෂ්පාදනයක් සහිත උසස් තත්ත්වයේ තේ ක්ලෝන පැළ 303,000 ක් නිෂ්පාදනය කිරීමද අපේක්ෂිතය. එමෙන්ම, මෙම පැළ, ගම්මානයේ කුඩා තේ හිමියන් විසින් වගාකරවීම තුලින් වසර 03 කින් පමණ තේ දළු නිෂ්පාදනය ආරම්භ වීමත් සමග දළ වශයෙන් රු. මිලියන 01 කින් පමණ කුඩා තේ වතුහිමියන්ගේ ආදායම ඉහල නැංවීමට අපේක්ෂා කරන අතර, එම අගය වසර 05 කින් පමණ මිලියන 16 පමණ දක්වා ඉහල නැංවීමට අපේක්ෂා කරයි.



**අතුරලිය තලහගම තේ පැල තවාන**

- **නව තේ වගා වැඩසටහන**

දිවිනැගුම වැඩසටහන යටතේ ග්‍රාමීය තේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙමින් අඩු ආදායම්ලාභී කුඩා ඉඩම් හිමියන් (තේ වගාවට සුදුසු පර්. 20 හෝ ඊට අඩු ඉඩමක් හිමි) තේ වගාව සඳහා යොමු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ වැඩි නිෂ්පාදනයක් සහිත උසස් වර්ගයේ තේ පැල 230,015 ක් ප්‍රතිලාභීන් 415 ක් සඳහා ලබාදීම සිදුකරන ලදි. මෙහිදී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම, වගාව සඳහා සුදුසු පැල ලබාගැනීමට තවාන් නම් කිරීම හා සුදුසු පැල සපයාගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි. එමෙන්ම, මෙම වැඩසටහන තුළින් කෙටිකාලීනව වසර 03 කින් පමණ රු. මිලියන 1.5 ක පමණ වාර්ෂික ආදායමක් ලබාගත හැකි වන අතර, එය ක්‍රමයෙන් වැඩිවී වසර 05 කින් පමණ එය රු. මිලියන 25 ක් දක්වා වර්ධනය කරගැනීමට අපේක්ෂා කරයි.

- **තේ වගා පුනරුත්ථාපනය**

"දිවිනැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය තේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදීමේ අරමුණින් තේ වගා පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙහි අරමුණ, කුඩා තේ වතු සංවර්ධනය කොට, ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමයි. මේ සඳහා ඉඩම්වල වල් පැළෑටි මර්ධනය, පාංශු සංරක්ෂණය, අවශ්‍ය සෙවන සැපයීම, පාළු පැල සිටුවීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදෙමින් දීර්ඝකාලීන ලෙස ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි. මෙහිදී, පාළු පැල සිටුවීම සඳහා අවශ්‍ය පැල සැපයීමත්, ඉඩම් ශුද්ධ කිරීම පාංශු සංරක්ෂණය හා පාළුසිටුවීම සඳහා මූල්‍ය ආධාර සැපයීමත් සිදුකරන ලද අතර, ප්‍රතිලාභීන් 337 දෙනෙක් ප්‍රතිලාභ ලබාගන්නා ලදි. එමෙන්ම, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම, වගාව සඳහා සුදුසු පැල ලබාගැනීමට තවාන් නම් කිරීම හා සුදුසු පැල සපයාගැනීමට අවශ්‍ය මැදිහත්වීම ලබා දෙන ලදී. මෙමගින්, වාර්ෂික තේ දළු නිෂ්පාදනය වැඩිවීම දළ වශයෙන් කිලෝ ලක්ෂ 3 ක් පමණ වෙතැයිද, රු. මිලියන 01 කින් පමණ ආදායම් වැඩිවේයැයිද, වසර 05 කින් පමණ එම තත්වය මිලියන 04 ක පමණ ආදායම් ඉපයීම දක්වා වැඩිකළහැකි වෙතැයිද යනුවෙන් අපේක්ෂා කෙරේ.

- **කුරුඳු තැළුම් පුහුණුව හා උපකරණ සැපයීම**

"දිවිනැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙමින් කුරුඳු වගාකරුවන්ගේ ආදායම ඉහළ නැංවීමේ අරමුනින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ උසස් තත්ත්වයෙන් සකස් කල කුරුඳු නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොළට යොමු කිරීමෙන් වැඩි ආදායමක් ලබාගැනීමට අවස්ථාව උදාකරවීම සඳහා, කුරුඳු වගාකරුවන්ට කුරුඳු තැළීම පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබාදීමත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමත් සිදුකරන ලදි එමෙන්ම, මෙම වැඩසටහන තුළින් ප්‍රතිලාභීන් 83 කගේ පමණ ආදායම ඉහළ නැංවීමට අවස්ථාව උදාවන අතර, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මේ සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීමට අවශ්‍ය සහාය ලබාදෙනු ලබයි.

- **ගෙවතු පොල් සඳහා රසායනික පොහොර ලබාදීම**

දකුණු පළාතතුළ පොල් ඉඩම්හිමියන් මුහුණදුන් පොල් කොළ මැලවීමේ හා පොල් කොළ කුණුවීමේ රෝගයට කෙටිකාලීන විසඳුමක් ලෙස රසායනික පොහොර යෙදීමට ගොවීන් යොමු කරවීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මෙම රෝගය හේතුකොටගෙන පොල් ගස් ලක්ෂ 03 කට අධික ප්‍රමාණයක් ඉවත් කිරීමට සිදුව ඇති අතර, දකුණු පළාතතුළ පොල් නිෂ්පාදනය වැඩිකිරීම සඳහා කෙටිකාලීන පියවරක් ලෙස ගොවීන් සඳහා රසායනික පොහොර ලබාදීමත්, එම රසායනික පොහොර යෙදීමට ගොවීන් යොමු කිරීමත් සිදුකරන ලදි. මීට අමතරව, පොල් ගස් නඩත්තුව, පොහොර යෙදීම, ලෙඩ රෝග හඳුනාගැනීම හා ඒ සඳහා පිළියම් යෙදීම පිළිබඳව ගෙවීන්ට, පොල් සංවර්ධන මණ්ඩලය මගින් තාක්ෂණික දැනුම ලබාදීමත් සිදුකරන ලදි. එමෙන්ම, මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 5,563 දෙනෙකු ප්‍රතිලාභ ලබාගත් අතර, මෙමගින්, වාර්ෂික පොල් නිෂ්පාදනය 10% කින් පමණ වැඩිකිරීමත්, ඒ අනුව, රු. මිලියන 12 ක පමණ වාර්ෂික ආදායමක් ලැබීමත්, වර්ෂයක්තුළදී පොල් නිෂ්පාදනය ගෙඩි ලක්ෂ 06 කින් පමණ වැඩිකිරීමටත් අපේක්ෂා කරනු ලැබේ.

- **කුරුඳු වගා පුනරුත්ථාපනය**

"දිවිනැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදීමේ අරමුණින් කුරුඳු වගා පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ ප්‍රතිලාභීන් 64 දෙනෙකුගේ කුඩා කුරුඳු ඉඩම් සංවර්ධනය කොට, ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ඉඩම්වල වල් පැලැටි මර්ධනය, පාංශු සංරක්ෂණය, අවශ්‍ය සෙවන සැපයීම, පාළු පැළ සිටුවීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම සඳහා මූල්‍ය ආධාර ලබාදෙන ලදි. මෙහිදි, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම, වගාව සඳහා සුදුසු පැළ ලබාගැනීමට තවාන් නම් කිරීම හා සුදුසු පැළ සපයාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. මේ තුළින්, කුරුඳු නිෂ්පාදනයේ වැඩිවීමක් අපේක්ෂා කරන අතර, ඒ අනුව, දීර්ඝකාලීන ලෙස ප්‍රතිලාභීන්ගේ වාර්ෂික ආදායම මිලියන 0.5 සිට මිලියන 2 දක්වා වැඩි වෙතැයිද අපේක්ෂිතය. මෙම නිෂ්පාදන විදේශ වෙළඳපොළට යැවීම මගින් රටට විදේශ විනිමය උපයාගත හැකිවනු ඇත.



**හක්මණ කුරුඳු තැළුම්කරුවන්**

- **කුරුඳු නව වගාව**

"දිවිනැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙමින් අඩු ආදායම්ලාභී කුඩා ඉඩම් හිමියන් (කුරුඳු වගාවට සුදුසු පර්. 20 හෝ ඊට අඩු ) කුරුඳු වගාවට යොමු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ, උසස් තත්ත්වයේ කුරුඳු පැළ 16,175 ක්, ප්‍රතිලාභීන් 22 ක් අතර බෙදා දෙන ලදී. මෙහිදී, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම, වගාව සඳහා සුදුසු පැළ ලබාගැනීමට තවාන් නම් කිරීම හා සුදුසු පැළ සපයාගැනීමට අවශ්‍ය මැදිහත් වීම ලබාදෙන ලදී. මෙමගින්, ප්‍රතිලාභීන්ට දළ වශයෙන් වසර 03 කින් පමණ, වාර්ෂිකව රු. මිලියන 0.2 ක පමණ ආදායමක් ලබාගත හැකිවන අතර, වසර 05 කින් පමණ ක්‍රමයෙන්, එය රු. මිලියන 0.6 ක පමණ මට්ටමකට වැඩිවනු ඇතැයි අපේක්ෂිතය.

- **කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන**

මේ යටතේ කිතුල් බහුලව පවතින ගම්මානවල සිටින ප්‍රතිලාභීන්ට, ඔවුන්ගේ පාරම්පරික කර්මාන්ත වැඩිදියුණු කර ගැනීම සඳහා තාක්ෂණික දැනුම ලබාදී, නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම හා නිෂ්පාදන තත්ත්ව වැඩිදියුණු කිරීමත්, ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමත්, තාක්ෂණික පුහුණුව හා මල් පදම් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබාදීමත් සිදුකරන ලදී. මේ යටතේ, ප්‍රතිලාභීන් 101 දෙනෙක් ප්‍රතිලාභ ලබාගත් අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් ඔවුන්ට තාක්ෂණික පුහුණුව ලබාදෙන ලදී. මේ තුලින් නිෂ්පාදන ධාරිතාව හා නිෂ්පාදන තත්ත්ව වැඩිදියුණු වීම අපේක්ෂා කෙරේ.

- **ගම්මිරිස් වගා ව්‍යාපෘතිය**

පොල් ඉඩම්වල ඵලදායිතාව වැඩිකොට අමතර ආදායමක් ලබාගැනීමේ අරමුණින්, පොල් ඉඩම්වල අතුරු භෝග වැඩසටහන හඳුන්වා දී ඇත. මෙහිදී, තෝරාගත් පොල් ඉඩම්වල, අතුරු බෝග වගාවක් ලෙස ගම්මිරිස් වගා කොට, අමතර ආදායමක් ලබාගැනීමට ගොවීන් උනන්දු කරමින්, තෝරාගත් ප්‍රතිලාභීන් 109 දෙනෙකුට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා ගම්මිරිස් පැළ ලබාදීම සිදුකරන ලදී. මෙහිදී, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා අත්පොත් ලබාදීම සහ වගාව සඳහා සුදුසු පැළ සපයාගැනීමට අවශ්‍ය මැදිගත්වීම ලබා දෙන ලදී. මේතුලින්, වසර 03 කින් පමණ, වාර්ෂිකව රු. මිලියන 0.3 ක පමණ ආදායමක් ලබාගත හැකි වෙතැයි අපේක්ෂිතය. වසර 05 ක් පමණවන විට, එම තත්වය, රු. මිලියන 0.5 දක්වා වැඩි වෙතැයිද අපේක්ෂිතය.

- **බුලත් වගා ව්‍යාපෘතිය**

මේ යටතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා බුලත් සපයාගැනීමේ අරමුණින් බුලත් වගාව හඳුන්වාදීම සිදුකරන ලදි. මෙහිදී, ගොවීන්ට අමතර ආදායම් ලබාගැනීම සඳහා ප්‍රතිලාභීන් 100 දෙනෙකුට බුලත් පැළ ලබාදීම සිදුකරන ලදි. එමෙන්ම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවීන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම හා ගොවීන්ට වගාව සඳහා සුදුසු පැළ සපයාගැනීමට අවශ්‍ය මැදිහත්වීම ලබාදෙන ලදි. මෙතුලින්, වසර 02 කින් පමණ සිට, වසරකට රු. මිලියන 0.06 පමණ ආදායමක් ලබාගත හැකි වන අතර, එමගින් ප්‍රදේශයේ ජනතාවගේ දෛනික බුලත් අවශ්‍යතාවයද සපිරෙනු ඇත.

- **තැඹිලි වගා ව්‍යාපෘතිය**

මොණරාගල දිස්ත්‍රික්කයේ අදාළ ගම්මානවල ප්‍රතිලාභීන්ගේ පරිභෝජනය සඳහා අවශ්‍ය තැඹිලි සපයා ගැනීමටත්, එමගින් ගොවීන්ට අමතර ආදායමක් ලබාගැනීම සඳහාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ, ප්‍රතිලාභීන් 120 දෙනෙකුට තැඹිලි පැළ ලබා දෙන ලදි. එමෙන්ම, පැළ සපයාගැනීම සඳහා පොල් සංවර්ධන මණ්ඩලය සහායවන ලදි.

### 4.1.3 කෘෂි හා පශුසම්පත් අංශය මගින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

කෘෂි අංශය මගින්, 2011 වර්ෂයතුළ, පශු සම්පත්ද ඇතුළුව පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සෘජුව හා විවිධ රේඛීය ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදි. ඊට අදාල සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

- **කෘෂිකාර්මික ගොවිපල ඇති කිරීම**

"දිවිනැගුම" ව්‍යාපෘතියේ තවත් සුවිශේෂී අරමුණක්වන, පවුලේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් වාණිජ කෘෂිකාර්මික ගොවිපල ඇතිකිරීමට විශේෂ අවධානයක් යොමු කරන ලදි. එහිදි, විශේෂයෙන් එළවළු පළතුරු වගාව හා අතිරේක බෝග වගාව කෙරෙහි අවධානය යොමුකරමින්, ප්‍රතිලාභීන් 462 දෙනෙක් සඳහා අවශ්‍ය එළවළු හා පළතුරු පැළ ලබා දෙන ලදි. මෙමගින්, ප්‍රතිලාභීන්ගේ ආදායම රුපියල් මිලියන 49.8 කින් පමණ වැඩිකිරීමට අපේක්ෂිතය. එමෙන්ම, පවුල් ඒකකයන්ගේ ආදායම වැඩි කිරීමේ අරමුණින්, මී මැසි පාලන වැඩසටහන සහ බිම්මල් වගා වැඩසටහනද ක්‍රියාත්මක කරන ලද අතර, මේ තුලින්, ප්‍රතිලාභීන් 314 දෙනෙකුට අවශ්‍ය උපකරණ සහ ද්‍රව්‍ය ලබා දෙන ලදි.

- **බීජ හා පැළ සැපයුම් ඒකක**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, දිවිනැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මකවන ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය වන බීජ හා පැළ නිෂ්පාදනය කිරීමයි. මේ යටතේ, බීජ හා පැළ සැපයුම් ඒකක 100 ක් ඇති කිරීමට, ප්‍රතිලාභීන් 462 දෙනෙක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයන ලද අතර, අදාළ ප්‍රතිලාභීන් හඳුනාගෙන බීජ සහතික කිරීමේ සේවය හා දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හරහා අවශ්‍ය පුහුණුවීම් ලබාදෙන ලදි. මෙමගින්, ප්‍රතිලාභීන්ගේ වාර්ෂික ආදායම රුපියල් මිලියන 3.6 කින් පමණ වැඩිවනු ඇතැයි අපේක්ෂිතය.

- **ආරක්ෂිත ගෘහ/ හරිතාගාර ඇතිකිරීම**

මෙමගින්ද, ගම්මාන සඳහා අවශ්‍යවන බද්ධ පළතුරු පැළ හා මල් පැළ නිෂ්පාදනය අපේක්ෂා කරන ලද අතර, ආරක්ෂිත ගෘහ/ හරිතාගාර 48 ක් ඇතිකිරීමේ අරමුණින්, බද්ධ පළතුරු පැළ තවාන් 48 ක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයන ලදි. තවද, අදාළ ප්‍රතිලාභින් හඳුනාගෙන බීජ සහතික කිරීමේ සේවය හා දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන හරහා අවශ්‍ය පුහුණුවීම් ලබාදෙන ලදි. මෙමගින්, ප්‍රතිලාභින්ගේ වාර්ෂික ආදායම රුපියල් මිලියන 6 කින් පමණ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 4.1.4 මානව සම්පත් හා පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

මානව සම්පත් සංවර්ධන හා පුහුණු අංශය මගින්, 2011 වර්ෂයතුළ, පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ඍජුව හා විවිධ රේඛීය ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදී. ඊට අදාළ සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

- **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම**

ගාල්ල සමුපාකාර රෝහල සමග එක්ව පසුගිය වසරවල පුහුණු කරන ලද හෙද සහ හෙදි සහායක පුහුණුලාභීන් 20 දෙනෙකු පෞද්ගලික ආයතනවල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කරන ලදී. එමගින්, පෞද්ගලික ආයතනවල රැකියා සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින් සැපයීම මෙන්ම, මෙම පුහුණුලාභී තරුණ තරුණියන්ට මාසික වේතනයක් ලැබිය හැකි රැකියා සඳහා යොමුවීමට අවස්ථාව ලැබී ඇත.

- **විදේශ රැකියා සඳහා පුහුණුලාභීන් යොමු කිරීම සඳහා පුහුණු ආයතන සහ රැකියා ආයතන අතර සම්බන්ධීකරණය කිරීම .**

ශ්‍රී ලංකා විදේශ සේවා කාර්යාංශයේ අනුමැතිය ලද ආයතන මගින් විදේශ රැකියා සඳහා යාමට පුහුණු ශ්‍රමිකයින්ට අවස්ථාව සැලසීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, විශේෂයෙන් රාජ්‍ය ආයතනවල පුහුණුව ලද පුහුණුලාභීන් විදේශ රැකියා ලබාදෙන ආයතනවලට සම්බන්ධ කරදීම මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලදී. එමගින්, දකුණේ පුහුණු ශ්‍රමිකයින්ට විදේශ රැකියා සඳහා යොමුවීමට අවස්ථාව සළසා ඇති අතර, විදේශ විනිමය රට තුළට ලබාගැනීමද හැකියාව ලැබී ඇත. මේ යටතේ විශේෂයෙන් දකුණු පළාතේ පිහිටි වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා කාර්මික විද්‍යාලවල ප්‍රාදේශීය ශාඛා දැනුවත් කොට, එම ආයතන මගින් පුහුණු කරන ලද පුහුණුලාභීන් 300 දෙනෙකු පමණ විදේශ රැකියා ලබාදෙන ආයතන හා සම්බන්ධීකරණය කොට, ඔවුන්ට රැකියා අවස්ථා ලබාදීමට අදාළ පහසුකාරක සේවා සපයන ලදී.

- **සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා ආධුනිකයන් යොමු කිරීම**

මෑතකදී රජය විසින්ද විශේෂ අවධානයක් යොමුකර ඇති සංචාරක කර්මාන්තයේ විවිධ රැකියා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම සඳහා, විශේෂයෙන් කොග්ගල සහ තංගල්ල අවට ප්‍රදේශවල තරුණ තරුණියන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථානවලට යොමු කිරීම මෙම වැඩසටහන් මගින් ක්‍රියාත්මක කරන ලදී. එමගින්, පුහුණු ආයතනවලට අවශ්‍ය පුහුණුලාභීන් සොයා ගැනීමට සහාය වීමත්, දක්ෂිණ ලංකාවේ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා සඳහා අනාගතයේදී තරුණ තරුණියන්ට යොමු වීමට අවස්ථාව සැලසීමත් මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, සූපවේදී, පිළිගැනීමේ නිලධාරී, භෝජනාගාර සේවක, කාමර සේවක වැනි කෙටි කාලීන සහ දිගු කාලීන පුහුණු පාඨමාලා සඳහා හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්කවලින් ආධුනිකයන් 35 දෙනෙකු පමණ පුහුණුවට යොමු කරන ලදී.

- **අතුරුලිය – තලහගම වෘත්තීය පුහුණු ආයතනය පවත්වාගෙන යාම**

මෙය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමග දැනට වසර කිහිපයක සිට ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියකි. මෙම පුහුණු ආයතනයේ වසරකට සිසුන් 150ක් පමණ පුහුණු කර වැඩිදුර පුහුණුව සඳහා සේවා ස්ථාන වෙත යොමු කරනු ලැබේ. මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, අප අධිකාරියේ සැළසුම් සහ යෝජනා අනුව, අධිකාරියේ රු 700,000/- ක පමණ මූල්‍ය දායකත්වයෙන් සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මුදල්ද වැයකර 2008 - 2009 වසරවල ඉදිකරන ලදි. ඉන් අනතුරුව, ආරම්භයේ සිට මේ දක්වා, මෙම පුහුණු ආයතනයේ පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් යොමු කිරීම අප අධිකාරියේද සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වසරේද විවිධ පාඨමාලා 03ක් යටතේ, ආධුනිකයන් 150 දෙනෙකු පුහුණුකර රැකියා සඳහා යොමුකිරීමට අවශ්‍ය පදනම සළසා ඇත. මෙම මධ්‍යස්ථානය පිටිසර ප්‍රදේශයක පිහිටුවා තිබීම හේතුකොටගෙන, එමගින් ග්‍රාමීය ප්‍රදේශවල තරුණ තරුණියන්ට පුහුණු අවස්ථා සැලසිය හැකිවීම හේතුවෙන්, මෙම පුහුණු ආයතනයේ වැදගත්කම සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතී.

- **"දිවිනැගුම" වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව විස්තරාත්මක දත්ත පද්ධතියක් සකස් කිරීම**

අධිකාරිය මගින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කළ දිවි නැගුම වැඩසටහනේ ප්‍රගතිය ඇතුළත් සවිස්තරාත්මක දත්ත පද්ධතියක් සකස් කොට පවත්වා ගෙන යනු ලබයි. එමගින්, අවශ්‍ය විටෙක මෙම වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳ පුළුල්ව අවබෝධ කරගැනීමට පහසුකම් සළසා ඇත. මෙම දත්ත පද්ධතියේ, දිවි නැගුම වැඩසටහනේ, දකුණු ප්‍රදේශයේ සියලුම ප්‍රතිලාභීන් පිළිබඳ අදාල සියලු විස්තර ඇතුළත් කර ඇත.

## 4.1.5. ධීවර හා පශු සම්පත් අංශය මගින් ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

ධීවර අංශය මගින්, 2011 වර්ෂයතුළ, පශු සම්පත් ව්‍යාපෘතිද ඇතුළුව පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ඍජුව හා විවිධ රේඛීය ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලදි. ඊට අදාල සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

2011 වර්ෂයේ අනුමත ආයෝජන සැලැස්මට අනුව, මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින් පොකුණු තුල ආහාර පිණිස මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම, කාලීන ජලාශවල මත්ස්‍ය නිෂ්පාදන ඉහළ දැමීමේ අරමුණින් ප්‍රශස්ථ මට්ටමින් මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කිරීම මූලික කොටගත් ධීවර ව්‍යාපෘති ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පහත පරිදි ක්‍රියාත්මක කරන ලදි. තවද, දිවි නැගුම සංවර්ධන ව්‍යාපාරයේ මූලික පරමාර්ථය ලගාකර ගැනීමේ අරමුණින්, ගෙවතු වගා සැලසුම්කරණය පිළිබඳව මූලික අවධානයද යොමුකරන ලදි.

- **පොකුණුතුළ මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම**

2011 දිවිනැගුම සංවර්ධන වැඩසටහන යටතේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක දෙක තුළ විවිධ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි. ගාල්ල දිස්ත්‍රික්කයේ ආහාර පිණිස පොකුණුතුළ මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීමේ අරමුණින්, ප්‍රතිලාභීන් 06 දෙනෙකුගේ මත්ස්‍ය පොකුණුවලට අවශ්‍ය ආරක්ෂක ආවරණ දැල් ලබාදීම වෙනුවෙන් රු. 40,996.32 ක මුදලක් වැයකරන ලදි. එමෙන්ම, මාතර දිස්ත්‍රික්කයේ එවැනිම ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙනුවෙන් පොකුණු ආරක්ෂක ආවරණ දැල් ලබාදීම වෙනුවෙන් රු. 20,126.16 ක මුදලක් වැයකරන ලදි. ඒ අනුව, ප්‍රතිලාභීන්ගේ ඒක පුද්ගල මාසික අමතර ආදායම අවම වශයෙන් රු. 500/- ක පමණ ප්‍රමාණයකින් ඉහළ දැමීමට හැකිවනු ඇත.

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කරන ලද නව ව්‍යාපෘතියක් වන ඉපිලෙන කුඩු තුළ විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් ලෙස අක්මීමණ යටගම විසිතුරු මත්ස්‍ය වගාව සඳහන් කළ හැකි අතර, එහි නව වගාකරුවන් 06 දෙනෙකු සඳහා නව ඉපිලෙන කුඩු තනාදීමට කටයුතු කළ අතර, එම ව්‍යාපෘති ඉතිරි කොටස් අඛණ්ඩ ලෙස ඉදිරි වර්ෂ තුළදීද ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ වෙනුවෙන් වෙන්වන උපරිම මුදල රු. 54,000/- කි. එමගින්, එක් මසක් තුළ ප්‍රතිලාභියෙකුගේ ආදායම අවම වශයෙන් රු. 4,000/- ක ප්‍රමාණයකින් ඉහළ දැමීමට හැකිවනු ඇත.

මෙම සියළුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රයේ අදාළ රේඛීය ආයතනවල සහයෝගය ලබාගන්නා ලදී.

- **ජලාශතුළ මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම**

විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරාගන්නා ලද, කැටැන්වැව, ගොන්නොරුව වැව, කොකැන්ආර වැව සහ පොල්ගහ වැව යන ජලාශ හතරෙහි මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ දැමීමේ අරමුණින්, මත්ස්‍ය ඇඟිල්ලන් 59,000 ක් තැන්පත් කළ අතර, මින් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව පවුල් 60 කි. ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය රු. 10,000/- ක මුදලක්ද, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය රු. 118,000/- ක මුදලක් ද මේ සඳහා වැයකර ඇති අතර, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහයෝගය ද මෙම ව්‍යාපෘතියට ලබාගන්නා ලදී. එක් වගා කන්නයක්තුළ මත්ස්‍ය අලෙවිය තුලින් ප්‍රතිලාභී එක් පවුලක ආදායම අවම වශයෙන් රු. 7,000/- ක ප්‍රමාණයකින් ඉහළ දැමීමට හැකිවනු ඇත.

- **ගෙවතු සැලසුම්කරණය**

දිවිනැගුම සංවර්ධන වැඩසටහනේ මූලික අංගය වන ගෙවතු වගා සංවර්ධනය මූලික කරගෙන අප අධිකාරියේ ගම් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන කලාප කළමණාකරුවන්, ව්‍යාපෘති සම්බන්ධීකාරකවරු ඇතුළු සමස්ථ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් 117 දෙනෙකු ඉලක්ක කරගෙන සමෝධානික ගෙවත්තක් සැලසුම්කරණය, ගෙවතු පාළනය, රෝග සහ පළිබෝධ පාළනය, පාංශු සංරක්ෂණය ආදී සියළුම කරුණු ඇතුළත් වන පරිදි වැඩමුළුවක් පවත්වන ලද අතර, ඒ සඳහා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය රු. 16,900/- ක මුදලක් වැයකරන ලදී. වැසිවනාන්තර සුරැකීමේ ජාත්‍යන්තර සංසදය නම් වූ රාජ්‍ය නොවන සංවිධානය මේ වෙනුවෙන් සම්පත් දායකත්වය ඇතුළු අනෙකුත් පහසුකම් සපයන ලද අතර, ඒ වෙනුවෙන් ඔවුන් රු. 46,400/- ක මුදලක් වැයකරන ලදී.





**හම්බන්තොට තිස්සමහාරාමයේ දිවිනැගුමෙන් සරුකරගත් ගෙවතු**

- **කුකුළන් ඇඩි කිරීමේ ව්‍යාපෘතිය**

මේ යටතේ, ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික් හතරෙහි දැනට කුකුල් පාලනය සිදුකරන හා ඒ සම්බන්ධ දැනුම හා පළපුරුද්ද ඇති ව්‍යවසායකයින් 18 දෙනෙක තෝරාගෙන, එක් ව්‍යවසායෙකුට, දිනක් වයසැති වැඩි දියුණු කරන ලද ගම් කුකුළු පැටවුන් 150 දෙනෙකු බැගින් ලබාදී, මාසයක් දක්වා වැඩීමට සලස්වා, එම කුකුළු පැටවුන් නැවත ඔවුන්ගෙන් මිළට ගෙන ගෘහස්ථ කුකුල් පාලන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් 270 දෙනෙකුට ලබාදෙන ලදි. මේ සඳහා රු. 405,000/- ක් වැයකරන ලදි. මෙමගින්, ප්‍රතිලාභී පවුල්වල ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහළ යාමත්, ඔවුන්ගේ පෝෂණ තත්වය වැඩිදියුණුවීමත් අපේක්ෂා කෙරේ.



**දෙවිනුවර කුකුල් පාලන ව්‍යාපෘතිය**

- **සත්ව අභිජනන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය තුලින් එළු හා ගව අභිජනන ව්‍යාපෘති දෙකක් ආරම්භ කළ අතර, එමගින්, දැනට සිටින සතුන්ගේ ආරය වැඩි දියුණු කිරීම හා එලෙස ලැබෙන පැටවුන් ඉදිරියේදී දිවිනැගුම ගම්මානවල ප්‍රතිලාභීන් සඳහා ලබාදීම අරමුණු කර ගන්නා ලදි. මේ අනුව, එළු අභිජනන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 10 දෙනෙකු තෝරා, එම ව්‍යාපෘති 10 ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා දෙන ලදි. එමෙන්ම, ගව අභිජනන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 24 දෙනෙකු තෝරා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා දෙන ලදි. ඉහත සඳහන් සත්ව පාලන ව්‍යාපෘති දෙකකදී අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ නොකල, එහෙත් ඉදිරියේදී ඒ සඳහා යොමුකර ගත හැකි ප්‍රතිලාභීන්ද හඳුනාගෙන, ඔවුන්ගේ ගොවිපළ වාණිජ ගොවිපළ ලෙස සංවර්ධනය කරන ලදි.

මෙම සියළු ප්‍රතිලාභීන් සඳහා, කැකණදුර සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණුව ලබාදුන් අතර, තාක්ෂණික පොත්පත් සහ පත්‍රිකා ද ලබාදෙන ලද අතර, මඩු සාදා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, ජල හා ආහාර බඳුන් මෙන්ම සතුන්ද ලබාදීම සිදුකරන ලදි. මෙමගින්, එම ප්‍රතිලාභීන්ගේ වාර්ෂික ආදායම රුපියල් මිලියන 1.76 කින් පමණ වැඩිකිරීමට අපේක්ෂිතය.

- **ගෘහස්ථ සත්ව පාලන වැඩසටහන**

මෙම වැඩසටහන පවුලේ පෝෂණය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ, එක් පවුලක් සඳහා, දේශීයව වැඩිදියුණු කරන ලද මසක් වයසැති කිකිලි පැටවුන් 10 දෙනෙක් බැගින්, වර්ග අඩි 25 ක පමණ කුඩුවක් තනා ගැනීම සඳහා සෙවිලි තහඩු 03 ක් බැගින්

සහ කුකුල් දැල් වර්ග අඩි 45 බැගින් ප්‍රතිලාභී පවුල් 462 දෙනෙකු වෙත එම ප්‍රතිලාභ ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘතියට අදාළ ප්‍රතිලාභීන් තේරීමේදී හා පුහුණු කිරීමේදී, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍ය නිළධාරීන්ගේ සහ සත්ව සංවර්ධන නිළධාරීන්ගේ සහාය ලබා ගන්නා ලදී.

### 4.1.6 ඉඩම් අංශය මගින් ක්‍රියාත්මක කළ ඉඩම් ඵලදායිතා වැඩසටහන

ඉඩම් අංශය මගින්, 2011 වර්ෂයතුළ, පහත සඳහන් ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ඍජුව ක්‍රියාත්මක කරන ලදී. ඊට අදාළ සාරාංශගත විස්තරයක් පහත දක්වා ඇත.

2010 වර්ෂයේ ආරම්භ කරන ලද ඉඩම් ඵලදායිතා වැඩසටහන, 2011 වර්ෂයේ මාර්තු මස වනවිට අවසන් කළ හැකි විය. මෙම ව්‍යාපෘතිය මගින්, ප්‍රතිලාභීන්ගේ ඉඩම් සහ ගෙවතු වසර පුරා ආදායම් ලබන වගා බිම් බවට පත්කිරීම අපේක්ෂා කරන ලදී. "ජාතික සවිය ගමනැගුම" වැඩසටහන යටතේ, අධිකාරිය මගින් සංවර්ධනය කෙරෙන ගම්මාන 150 හි ගොවි පවුල් 600 ක ඉඩම් මෙලෙස ඵලදායී ලෙස සංවර්ධනය කිරීමට ප්‍රතිලාභීන් සක්‍රියව යොමු කරවන ලදී.






**ඉඩම් ඵලදායිතා වැඩසටහන - ගාල්ල**

මෙම වැඩසටහන තුළින්, තමන්ගේ ගෙවත්ත වගාවට යොමු කරවීමටත්, ඔවුන් දිරිමත් කිරීම සඳහා එක් දිස්ත්‍රික්කයකින් හොඳම ගොවීන් තිදෙනෙක් බැගින් තෝරා, ඔවුන්ට ත්‍යාග සහ සහතික පිරිනැමීමත් 2011 වර්ෂයේ සිදුකරන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ ගොවි පවුල්වල ආදායම 10% කින් පමණ වැඩිවී ඇත.

## 4.2 දිවිනැගුම ශක්තිමත් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

තවද, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් මෙම වසර තුළ "දිවිනැගුම" වැඩසටහනට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පාදක වන වැඩසටහක් වන, ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනක්ද ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, 2010 වර්ෂයේ "ජාතික සවිය - ගමනැගුම" වැඩසටහන යටතේ ආරම්භ කොට නිමකිරීමට නොහැකිවූ ව්‍යාපෘති රාශියක්ද 2011 වර්ෂය තුළදී නිමකරන ලදී.

මේ යටතේ, ග්‍රාමීය කෘෂි කාර්මික මාර්ග සංවර්ධනය, ග්‍රාමීය වාරිමාර්ග පද්ධති නවීකරණය කිරීම, පොදු පහසුකම් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම, පොදු අලෙවිසැල් හා ක්‍රීඩාපිටි සංවර්ධනය, උස්සාන ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ග්‍රාමීය පානීය ජල ව්‍යාපෘතිද ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

මීට අමතරව, හම්බන්තොට දිස්ත්‍රික්කයතුළ පමණක් අඩු ආදායම්ලාභී, ස්ථිර නිවාස නොමැති පවුල් ඒකක 400 ක් තෝරාගෙන, 2011 වසර තුළදී ඉන්, නිවාස **373** ක් සම්පූර්ණ වශයෙන් ඉදිකරදීමද සිදුකරන ලදි. එමගින්, හිසට වහලක් නොමැති පවුල් 400 ක අනාගතය සෑම අතින්ම දීප්තිමත් කරලීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලබාදිය හැකි විය.

තෝරාගත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ඡායා රූප පහත දක්වා ඇත.



**මොණරාගල පල්ලේගම තැන්නයාය කෘෂි මාර්ගය**



**තෙළුල්ල වැව ප්‍රතිසංස්කරණය**



**සියඹලාණ්ඩුව පහතඅරාව අමුණ ඉදිකිරීම**

ඉහත සඳහන් ව්‍යාපෘතිවලට අදාලව, ඒ ඒ දිස්ත්‍රික් මට්ටමින් පහත සඳහන් පරිදි මූල්‍ය හා භෞතික ප්‍රගතියත්, මෙම වසර තුළ ළගාකරගැනීමට හැකිවිය.

### දිස්ත්‍රික්ක අනුව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2011

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | භෞතික ප්‍රගතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2011-12-31 දිනට වියදම (රු.මි.) | ප්‍රජා දායකත්වය (රු.මි.) |
|---|---|---|---|---|---|
| ගාල්ල | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. 6.09 ක් දුර කොන්ක්‍රීට් කිරීම (මාර්ග 43) | 43957 | 24.213 | 11.634 |
| | ඇල මාර්ග ප්‍රතිසංස්කරණය | ඇල මාර්ග 08 | 1066 | 1.245 | 0.6 |
| | පොදු පහසුකම් ප්‍රජාශාලා | 02 | 1765 | 2.394 | 0.9 |
| මාතර | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. 4.7 (මාර්ග 25) | 37762 | 25.861 | 12.194 |
| | ඇල මාර්ග, පැති බැමි, ඇනිකට් | කි.මී. 1.2 (ව්‍යාපෘති 15) | 6772 | 1.382 | 2.653 |
| | බස්රථ නැවතුම් අංගන හා ක්‍රීඩාපිටි සංවර්ධනය | 02 | 3701 | 10.415 | 2.462 |
| මොණරාගල | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. 22 ක් දුර සංවර්ධනය කිරීම (මාර්ග 17) | 17116 | 13.784 | 7.081 |
| | ඇල මාර්ග, පැති බැමි හා පාලම් | ඇල මාර්ග 03<br>සපත්තු පාලම් 1<br>පැති බැමි 1 | 1405 | 2.91 | 0.61 |
| | සංචාරක බංගලාව | ගොඩනැගිලි 01 | 750 | - | 0.08 |
| | සුළු වාරිමාර්ග ව්‍යාපෘති | ව්‍යාපෘති 17 | 2232 | 3.844 | 2.631 |
| හම්බන්තොට | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. 2.01 ක් දුර කොන්ක්‍රීට් කිරීම (මාර්ග 21) | 13630 | 13.582 | 5.618 |
| | ඇල මාර්ග, පෙට්ටි බෝක්කු හා පැති බැමි | ඇල මාර්ග 21(දුර 6.1)<br>පෙට්ටි බෝක්කු හා පැති බැමි 05 | 7130 | 14.632 | 6.233 |
| | පොළ සංවර්ධනය | 01 | 1500 | 0.739 | 0.204 |
| | උස්සාන ජල ව්‍යාපෘති | 03 | 140 | 1.115 | 0.281 |
| | වැව් ප්‍රතිසංස්කරණය | 04 | 527 | 1.522 | 0.165 |
| | පානීය ජල ව්‍යාපෘති | 01 | 45 | 0.5 | 0.1 |
| **එකතුව** | | | | **118.138** | **53.446** |

**මූලාශ්‍රය :- ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය දත්ත පද්ධතිය**

ග්‍රාමීය කෘෂිකාර්මික මාර්ග සංවර්ධනය යටතේ, තෝරාගත් ගම්මානවල ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඍජුව දායකත්වය සපයන හා කෘෂිකාර්මික ඉඩම්, ග්‍රාමීය කුඩා කර්මාන්ත ආදිය සඳහා ප්‍රවේශය පහසු කරවන, එමෙන්ම, ග්‍රාමීය දරු දැරියන්, තරුණ තරුණියන් හා වැඩිහිටියන්, සංවර්ධනය වන ලෝකයේ නව මංපෙත්කරා අනලස්ව යොමුකරවීම සඳහා පහසුකම් සළසන, එම අර්ථයෙන් ඉහළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ග, සපත්තු පාලම්, අබලන් බෝක්කු හා කුඩා පාලම් හා පැති බැම්ම් ආදිය සංවර්ධනය කිරීම සිදුකරන ලදි.

මෙමගින්, ජාතික ආර්ථිකයට දකුණේ දුෂ්කර ගම්මානවලින් එකතුවන නිෂ්පාදන ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව මෙන්ම ක්‍රමිකව වැඩිවීමත්, එම ජනතාවගේ අධ්‍යාපන හා ජීවන මට්ටම ඉහළ නැංවීමත් සිදුවේ. ග්‍රාමීය වාරිමාර්ග පද්ධතීන් නවීකරණය යටතේ ජල බස්නා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමත්, කුඩා වැව් ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණයත්, විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඩා වැව් සම්බන්ධිත නව ඇළ මාර්ග පද්ධතීන් ඉදිකිරීමත් හා උස්සාන ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සිදුකරන ලදි. මෙමගින්, කුඹුරු අක්කර 1310 ක් පමණ ඉදිරි කන්නවලදී එළදායි වගාව සඳහා යෙදවීමට අවස්ථාව සැලසී ඇත. එසේම, මීට අමතරව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද නව ඇළ මාර්ග පද්ධති සංවර්ධනය මගින් ගොඩ ඉඩම් අක්කර 120 ක් පමණ නව වගාව සඳහා යෙදවීමේ අවස්ථාව හිමිව ඇත.

## 4.3. ජාතික සවිය - ගමනැගුම අඩුආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය (විශේෂ ව්‍යාපෘති)

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතිය මගින්, තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස 398 ක් ඉදිකිරීම් ආරම්භ කරන ලදි. අදාල පවුල් ඒකකවල සියළු සාමාජිකයන් සම්බන්ධ කරගනිමින්, අදියර වශයෙන් නිවාස ඉදිකිරීම් මෙම ව්‍යාපාතිය යටතේ සිදුකරන ලද අතර, වර්ෂය අවසාන වන විට රු. 44,106,000.00 ක මූල්‍ය ප්‍රගතියක් ලබාගනිමින්, නිවාස 373 ක වහළ ගැසීම අවසන් කොට, මුළු සංඛ්‍යාවෙන් නිවාස 373 ක ඉදිකිරීම් නිමකරන ලදි. ව්‍යාපෘතියේ අනෙකුත් නිවාසවල සියළු ඉදිකිරීම් 2012 මාර්තු මාසය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

ස්ථිර නිවහනක් නොමැතිවීමත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් විදුලිය වැනි අනෙකුත් මූලික අවශ්‍යතා ලබාගැනීමට නොහැකිවීමත්, උපයන ආදායමින් වැඩිකොටසක් වාර්ෂිකව තාවකාලික නිවාස අළුත්වැඩියාව සඳහා යෙදවීමට සිදුවීමත් හේතුකොටගෙන, ආර්ථික හා මානසික යන දෙඅංශයෙන්ම හෙම්බත්ව සිටි මෙම ප්‍රතිලාභී ජනතාව, තම නිවාස ඉදිකරදීමත් සමග ලබාගත් ජයග්‍රහන බොහෝය. එනම්, ස්ථිර නිවහනක හිමිකරුවන් වීමේ මානසික හා කායික ප්‍රබෝධය ඇතිවීමත්, ඔවුන්ගේ ආර්ථික හා සමාජයීය තත්වය ඉහළයාමත්, දරුවන්ගේ අධ්‍යාපනික පසුබිම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වීමත්, එම ජයග්‍රහන අතර විශේෂ වේ. එසේම, ස්ථිර නිවාස ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් තම නිවෙස් සඳහා විදුලිබලය ලබාගත හැකි වීම තුළින්, නව ගෘහස්ථ කර්මාන්ත ආරම්භ කළ හැකි වීමෙන් ඔවුන්ගේ කුටුම්බ ආදායමද ඉහළයාම අපේක්ෂා කළ හැක.

තවද, කිසිවෙකුගේ අවධානයට ලක් නොවී, වාසයට නුසුදුසු, මූලික පහසුකම හෝ නොමැතිව ජීවත්වූ ආබාධිත සාමාජිකයන් සහිත පවුල්වලට, මෙම නිවාස වැඩසටහන යටතේ ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදීම මගින්, බොහෝ කලක් නොවිසඳී ඉතිරිවිය හැකිව තිබූ ආබාධිත පුද්ගලයින්ගේ නිවාස ගැටළුවට ද මෙ නිවාස ව්‍යාපෘතිය මගින් විසඳුම් ලබාදීමට හැකියාව ලැබුණි.

 

**මහඅථත්ගම්ආර වම්ඉවුර ලුණුගම්වෙහෙර එස්.එස්.ජයලත් මහතාගේ නිවස**

### 4.4. 2011 වර්ෂයේ ආදායම් උත්පාදන ව්‍යාපෘති

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරි පනතේ ප්‍රධාන අරමුණ වන නිෂ්පාදනශීලීත්වය ඉහළ නැංවීම, ආදායම් උත්පාදනය සහ රැකියා උත්පාදනය අරමුණු කොටගෙන, තේ කර්මාන්ත සහ අනෙකුත් කර්මාන්ත සහ ව්‍යවසායයන් මූලික කොටගත් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. එනම්, ජස්මින්වැලි, ගලගාවවත්ත, පතිල්කන්ද, හඳුගල තේ කර්මාන්ත ශාලා, ඔලියගොඩවත්ත විදුලි බලාගාරය, කඹුරුපිටිය රටලංකාවත්ත ටයර් පිරවීමේ කම්හල, කුඹල්ගම ඉසුරු සෙරමික් ව්‍යාපෘතිය, පිටබැද්දර දංකොළුවවත්ත කළුගල් ව්‍යාපෘතිය, ඇඹිලිපිටිය හා බුත්තල ව්‍යවසායක ව්‍යාපෘති සහ කඹුරුපිටිය, රටලංකාවත්ත ඩැගන් ෆෘට් ව්‍යාපෘතිය එම ව්‍යාපෘති වේ. එම ව්‍යාපෘතිවලින් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය 2011 වසරේදී උපයාගත් ආදායම රු. 2,851,292 කි. එම සියළු ව්‍යාපෘතිවලින් දක්ෂිණ ප්‍රදේශයේ උත්පාදනය කළ හැකි වූ මුළු සෘජු රැකියා ප්‍රමාණය 1000 ක් පමණ වේ. මීට අමතරව, මෙම ව්‍යාපෘති හේතුකොටගෙන දක්ෂිණ ප්‍රදේශයේ දොලොස්දහසක් පමණ පිරිසකට වක්‍ර වශයෙන් ප්‍රතිලාභ අත්වී ඇත. ඒ තුලින් ඔවුන්ගේ ජීවනෝපාය මට්ටම ඉහළ ගොස් ඇත. මෙම සියළු ව්‍යාපෘතිවලට අදාල කර්මාන්ත ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලිකම නිෂ්පාදන සාධකය වන ඉඩම් හා ගොඩනැගිලි සපයාදීම මෙම අධිකාරිය මගින් සිදුකරන ලදී.

## 5. සමස්ථ කාර්යසාධනය

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘතිවල සමස්ථ කාර්යසාධනය පිළිබඳ විග්‍රහ කිරීමේදී, වත්මන් රජයේ ප්‍රමුඛතම සංවර්ධන වැඩසටහන් වන "දිවිනැගුම" ගෘහස්ථ ආර්ථික ඒකක නංවාලීමේ වැඩසටහනට හා "ජාතික සවිය - ගමනැගුම" වැඩසටහනට මෙම වසරේ මූලිකත්වය ලබාදෙමින් සියලු වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම ගෙනහැර දැක්විය හැක. අතීතයේ ආරම්භ කළ ජාතික සවිය ගම නැගුම ව්‍යාපෘති කාර්යයන් තවදුරටත් ඉටුකිරීම සඳහා මෙන්ම, දිවි නැගුම නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහ ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල රැඳවුම් මුදල් ඇතුලත් වෙනත් වියදම් සඳහා, මහා භාණ්ඩාගාරය විසින්, 2011 වර්ෂයේ රුපියල් මිලියන 300.5 ක මූල්‍ය ප්‍රතිපාදන මෙම අධිකාරිය වෙත වෙන්කර දෙන ලදී. එම මූල්‍ය ඉලක්කයෙන්,සැලසුම්ගත කාර්යයන් සඳහා රුපියල් මිලියන 152.26 ක් 2011 වර්ෂයතුල වැය කිරීමට හැකි විය (විස්තර ඇමුණුම් - 01 හි දැක්වේ.) ඒ අනුව, 50.67% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගැනීමට හැකිවිය.

මීට අමතරව, දිස්ත්‍රික් හතරෙහි සමස්ථ ව්‍යාපෘති 1048 කින්, ව්‍යාපෘති 529 ක් මුළුමනින්ම නිම කළ හැකි විය. ඒ අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව 51% ක භෞතික ප්‍රගතියක් ලබාගැනීමටද හැකිවිය. (දිස්ත්‍රික් වශයෙන් මීට අදාල ප්‍රගතිය ඇමුණුම් - 02 ,03 ,04 හා 05 හි දැක්වේ.) මීට අමතරව, දිස්ත්‍රික්ක අනුව මූල්‍ය ප්‍රගතිය ප්‍රස්ථාර අනුසාරයෙන් පෙන්නුම් කිරීම ඇමුණුම - 06 හි දැක්වේ.

ඉහත ආකාරයට ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගනිමින්, 2011 වසරේද, "දිවිනැගුම" ගෘහස්ථ ආර්ථික ඒකක නංවාලීමේ වැඩසටහන හා "ජාතික සවිය - ගමනැගුම" වැඩසටහනතුලින් අධිකාරියේ මූලික අරමුණු ලගාකරගැනීම සඳහා, ප්‍රතිලාභී පවුල් දෙලක්ෂයකට පමණ අවශ්‍ය ආර්ථික ශක්තිය ලබාදෙමින්, දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, සදාචාර සංවර්ධනය මෙන්ම ආයෝජන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සිදුකරන ලදී.

තවද, එම සංවර්ධන ව්‍යාපෘති මගින් "අඳුරෙන් එළියට" යන සංකල්පය යටතේ, දක්ෂිණ ප්‍රදේශයතුල සැලකියයුතු ආර්ථික හා සාමාජීය පුනර්ජීවනයක් ඇතිකිරීමට අධිකාරියට හැකිවිය. මෙම සංවර්ධන ව්‍යාපෘතිවල දෘශ්‍යමාන සහ සංඛ්‍යාත්මක වශයෙන් ගණනය කළ හැකි අංශවලින් අප රටේ දළ දේශීය නිෂ්පාදිතයට, රු. මි. 280 ක පමණ දායකත්වයක් ලබාදීමට හැකි ආර්ථික බලපෑමක් 2011 වර්ෂය තුලදී සිදුකල හැකිවූ බවද සටහන් කළ හැක. එනම්, දිවි නැගුම ගෘහ ආර්ථික ඒකක වැඩසටහනට ඇතුලත් ව්‍යාපෘති මගින් රු. මි. 154 ක්ද, ජාතික සවිය ගම නැගුම වැඩසටහනට ඇතුලත් ව්‍යාපෘති මගින් රු. මි. 126 ක් ද වශයෙනි.

ඉහත පරිදි දැක්වූ ප්‍රගතිය ලගා කර ගැනීමේදී විවිධ වූ අභ්‍යන්තර සහ බාහිර බාධක සහ අභියෝග රැසකටද මුහුණදීමට සිදුවූ අතර, අධිකාරියේ ප්‍රතිපත්ති සම්පාදක මඬුල්ලේ සිට අධිකාරියේ පහළම ශ්‍රේණියේ කාර්ය මණ්ඩල සාමාජිකයා දක්වා වන සමස්ථ කාර්ය මණ්ඩලයේ කණ්ඩායම් හැගීමෙන් ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, එම බාධක හා අභියෝග සැලකිය යුතු මට්ටමකට සමනය කර ගැනීමටත්, ඉහතින් දැක්වූ ප්‍රගතිය අත්කරගැනීමටත් හැකි විය.

ඇමුණුම - 01

# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
## සංවර්ධන වැඩසටහන
### ( 2011-12-31 වන දිනට මූල්‍ය සාරාංශය )

| වැඩසටහන | | ගාල්ල | | මාතර | | හම්බන්තොට | | මොණරාගල | | ප්‍රධාන කාර්යාලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) |
| **1. " දිවිනැගුම" වැඩසටහන** | | | | | | | | | | | | | |
| **1.1 නව** | | | | | | | | | | | | | |
| 1.1.1 | ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන | 21,500,000.00 | 4,521,793.44 | 22,500,000.00 | 4,705,052.63 | 18,500,000.00 | 5,545,746.97 | 12,500,000.00 | 705,636.00 | | | 75,000,000.00 | 15,478,229.04 |
| 1.1.2 | ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීමේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන | 21,227,000.00 | 1,490,049.75 | 10,316,000.00 | 298,936.86 | 31,850,561.82 | 1,590,396.41 | 16,382,386.00 | 722,371.93 | | | 79,775,947.82 | 4,101,754.95 |
| 1.1.3 | ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීමේ යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන | 16,678,031.13 | 9,726,654.62 | 28,398,189.92 | 16,145,948.96 | 10,870,314.65 | 24,499,411.67 | 4,248,000.00 | 7,453,823.63 | | | 60,194,535.70 | 57,825,838.88 |
| **උප එකතුව** | | **59,405,031.13** | **15,738,497.81** | **61,214,189.92** | **21,149,938.45** | **61,220,876.47** | **31,635,555.05** | **33,130,386.00** | **8,881,831.56** | **-** | **-** | **214,970,483.52** | **77,405,822.87** |

| වැඩසටහන | | ගාල්ල | | මාතර | | හම්බන්තොට | | මොණරාගල | | ප්‍රධා/කාර්යාලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) |
| **2. ජාතික සවිය ගම නැගුම වැඩසටහන** | | | | | | | | | | | | | |
| **2.1 රුදවුම්** | | | | | | | | | | | | | |
| 2.1.1 | ආර්ථික හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 97,573.35 | 14,090.87 | 701,231.58 | 650,040.78 | 1,727,587.96 | 1,723,856.25 | 49,371.03 | 49,371.01 | | | 2,575,763.92 | 2,437,358.91 |
| 2.1.2 | යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 3,954,053.61 | 3,601,634.79 | 2,650,329.23 | 2,383,296.31 | 2,030,586.07 | 2,186,872.95 | 1,424,099.37 | 2,192,690.73 | | | 10,059,068.28 | 10,364,494.78 |
| උප එකතුව | | **4,051,626.96** | **3,615,725.66** | **3,351,560.81** | **3,033,337.09** | **3,758,174.03** | **3,910,729.20** | **1,473,470.40** | **2,242,061.74** | - | - | **12,634,832.20** | **12,801,853.69** |
| **2.2 උපචිත** | | | | | | | | | | | | | |
| 2.2.1 | ආර්ථික හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | - | - | - | - | 174,000.00 | 156,000.00 | - | - | | | 174,000.00 | 156,000.00 |
| 2.2.2 | යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 3,208,121.17 | 2,653,941.23 | - | 6,000.00 | 294,000.00 | 264,000.00 | 183,251.91 | 529,596.03 | | | 3,685,373.08 | 3,453,537.26 |
| උප එකතුව | | **3,208,121.17** | **2,653,941.23** | - | **6,000.00** | **468,000.00** | **420,000.00** | **183,251.91** | **529,596.03** | - | - | **3,859,373.08** | **3,609,537.26** |
| **2.3 අවිච්ජේද** | | | - | | - | | - | | - | | | | - |
| 2.3.1 | ආර්ථික හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 57,500.00 | 40,932.50 | 8,037,218.02 | 7,679,156.62 | 1,114,315.77 | 1,014,178.85 | 1,011,724.91 | 199,123.42 | | | 10,220,758.70 | 8,933,391.39 |
| 2.3.2 | යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන | 12,913,551.24 | 11,418,913.96 | 14,943,548.55 | 13,469,732.67 | 5,202,599.89 | 4,661,983.71 | 13,544,837.69 | 7,630,306.57 | | | 46,604,537.37 | 37,180,936.91 |
| එකතුව | | **12,971,051.24** | **11,459,846.46** | **22,980,766.57** | **21,148,889.29** | **6,316,915.66** | **5,676,162.56** | **14,556,562.60** | **7,829,429.99** | - | - | **56,825,296.07** | **46,114,328.30** |
| මුළු එකතුව | | **79,635,830.50** | **33,468,011.16** | **87,546,517.30** | **45,338,164.83** | **71,763,966.16** | **41,642,446.81** | **49,343,670.91** | **19,482,919.32** | - | - | **288,289,984.87** | **139,931,542.12** |

| වැඩසටහන | | ගාල්ල | | මාතර | | හම්බන්තොට | | මොණරාගල | | ප්‍රධා/කාර්යාලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) | මුදල් වෙන්කිරීම (රු.) | වියදම (රු.) |
| **3 වෙනත්** | | | | | | | | | | | | | |
| 3.1 | ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම (රුදවුම් හා අවිච්ඡේද ) | | | | | | | | | 6,633,078.44 | 7,438,051.82 | 6,633,078.44 | 7,438,051.82 |
| 3.2 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | | | | | 1,000,000.00 | 905,164.32 | 1,000,000.00 | 905,164.32 |
| 3.3 | අභ්‍යන්තර සේවක පුහුණුව | | | | | | | | | 500,000.00 | 299,425.00 | 500,000.00 | 299,425.00 |
| 3.4 | පරිපාලන වියදම් ( 1.5 % ) | | | | | | | | | 4,076,936.69 | 2,178,301.69 | 4,076,936.69 | 2,178,301.69 |
| **එකතුව** | | | | | | | | | | **12,210,015.13** | **10,820,942.83** | **12,210,015.13** | **10,820,942.83** |
| **මුළු එකතුව** | | **79,635,830.50** | **33,468,011.16** | **87,546,517.30** | **45,338,164.83** | **71,763,966.16** | **41,642,446.81** | **49,343,670.91** | **19,482,919.32** | **12,210,015.13** | **10,820,942.83** | **300,500,000.00** | **150,752,484.95** |
| 2010 රදවා ගැනීම් බදු නිදහස් කිරීම් | | | | | | | | | | | 1,511,606.05 | | 1,511,606.05 |
| 2011.12.31 දිනට වියදම | | | | | | | | | | | | | **152,264,091.00** |

## ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
## සංවර්ධන සැලැස්ම - 2011
## 2011-12-31 දිනට ප්‍රගති සාරාංශය

**ගාල්ල දිස්ත්‍රික්කය**

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල් වෙන්කිරීම (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | ව්‍යාපෘති ගණන | භෞතික ප්‍රගතිය (%) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | i 0-10 | ii 11-25 | iii 26-50 | iv 51-75 | v 76-100 | vi වැඩ නිම |
| ගෘහ ආර්ථික සංවර්ධන වැඩසටහන | 4300 | 21,500,000.00 | 4,521,793.44 | 43 | 0 | 2 | 10 | 24 | 7 | 0 |
| ව්‍යවසායකත්ව වැඩසටහන් ( කණ්ඩායම් පර්ෂද පිහිටුවීම/මූල්‍ය පහසුකම් සැපයීම) | 6463 | 645,000.00 | 825,129.33 | 129 | 122 | 0 | 1 | 0 | 0 | 6 |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 2151 | 215,000.00 | - | 43 | 43 | 0 | 0 | 0 | 0 | 0 |
| කෘෂි ප්‍රවේශ මාර්ග ඉදිකිරීම | 43957 | 45,675,628.57 | 23,766,588.38 | 45 | 14 | 0 | 0 | 0 | 4 | 101 |
| වෘත්තීය පුහුණු පාඨමාලා (හෝටල්/මුද්‍රණ කර්මාන්ත) | 3 | 23,000.00 | - | 3 | 3 | 0 | 0 | 0 | 0 | 0 |
| සුළු වාරිමාර්ග (ඇළ/පාලම්/පිටවාන) | 1066 | 3,612,999.44 | 1,244,972.75 | 8 | 3 | 0 | 0 | 1 | 1 | 8 |
| පොදු පහසුකම් (ප්‍රජාශාලා සහ ක්‍රීඩාපිටි) | 1765 | 3,613,702.49 | 2,393,674.34 | 3 | 0 | 0 | 0 | 0 | 1 | 4 |
| වෙනත් | 340 | 642,000.00 | 16,000.00 | 5 | 4 | 0 | 0 | 0 | 0 | 2 |
| දිවි නැගුම ශක්තිමත් කිරීමේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් | 529 | 3,708,500.00 | 699,852.92 | 17 | 10 | 0 | 0 | 0 | 7 | 2 |
| **එකතුව** | **60574** | **79,635,830.50** | **33,468,011.16** | **296** | **199** | **2** | **11** | **25** | **20** | **123** |

# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
## සංවර්ධන සැලැස්ම - 2011
## 2011-12-31 දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

**මාතර දිස්ත්‍රික්කය**

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල් වෙන්කිරීම (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | ව්‍යාපෘති ගණන | භෞතික ප්‍රගතිය (%) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | i 0-10 | ii 11-25 | iii 26-50 | iv 51-75 | v 76-100 | vi වැඩ නිම |
| ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන | 4500 | 22,500,000.00 | 4,798,761.13 | 45 | 0 | 0 | 0 | 0 | 45 | 0 |
| ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම/ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් | 6750 | 675,000.00 | 147,042.00 | 135 | 92 | 0 | 0 | 0 | 4 | 36 |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 2251 | 230,000.00 | - | 46 | 45 | 0 | 0 | 0 | 0 | 1 |
| කෘෂි ප්‍රවේශ මාර්ග ඉදිකිරීම | 37762 | 40,595,499.41 | 27,638,533.66 | 43 | 13 | 1 | 0 | 0 | 0 | 113 |
| සුළු වාරිමාර්ග (ඇළ/පිටවාන/වැව්) | 6772 | 7,671,157.22 | 1,381,689.44 | 22 | 9 | 2 | 0 | 0 | 2 | 15 |
| පොදු පහසුකම් (ප්‍රජාශාලා/ක්‍රීඩා පිටි) | 3701 | 11,851,532.77 | 10,415,897.41 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 13 |
| දිවි නැගුම ශක්තිමත් කිරීමේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් | 239 | 3,260,500.00 | 902,483.33 | 9 | 2 | 8 | 0 | 0 | 1 | 0 |
| වෙනත් | 446 | 800,000.00 | 53,757.86 | 3 | 2 | 0 | 0 | 0 | 1 | 0 |
| **එකතුව** | **62421** | **87,583,689.40** | **45,338,164.83** | **308** | **163** | **11** | **0** | **0** | **53** | **178** |

## ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
## සංවර්ධන සැලැස්ම - 2011
## 2011-12-31 දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛාව | මුදල් වෙන්කිරීම (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | ව්‍යාපෘති ගණන | භෞතික ප්‍රගතිය (%) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | i 0-10 | ii 11-25 | iii 26-50 | iv 51-75 | v 76-100 | vi වැඩ නිම |
| ගෘහස්ථ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන | 3700 | 18,500,000.00 | 5,545,746.97 | 37 | 0 | 37 | 0 | 0 | 0 | 0 |
| ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම/ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් | 5363 | 550,000.00 | 49,174.48 | 110 | 72 | 3 | 1 | 0 | 34 | 0 |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 1851 | 190,000.00 | 68,110.03 | 38 | 33 | 2 | 0 | 0 | 3 | 0 |
| සුළු වාරිමාර්ග (ඇල/පිටවාන/වැව්) | 7130 | 25,370,197.89 | 15,089,967.00 | 36 | 22 | 2 | 8 | 2 | 2 | 25 |
| කෘෂි ප්‍රවේශ මාර්ග ඉදිකිරීම | 13630 | 16,289,381.50 | 15,558,176.15 | 22 | 8 | 0 | 8 | 1 | 6 | 46 |
| ධීවර වැඩසටහන් | 45 | 680,000.00 | - | 3 | 2 | 1 | 0 | 0 | 0 | 0 |
| උස්සාන ජල ව්‍යාපෘති සහ ජල සැපයුම් ව්‍යාපෘති | 875 | 3,647,047.50 | 2,429,532.33 | 6 | 5 | 0 | 1 | 0 | 0 | 6 |
| විදුලිය සැපයුම් ව්‍යාපෘති | 475 | 385,480.46 | 60,136.30 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 2 |
| පොදු පහසුකම් (ප්‍රජාශාලා/ක්‍රීඩා පිටි) | 3925 | 906,247.11 | 824,304.59 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 8 |
| නාමපුවරු සවිකිරීම | 11676 | 592,613.70 | 544,612.70 | 0 | 5 | 1 | 0 | 0 | 0 | 72 |
| දිවි නැගුම ශක්තිමත් කිරීමේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් | 582 | 4,657,000.00 | 1,510,401.90 | 15 | 11 | 0 | 4 | 0 | 0 | 5 |
| **එකතුව** | **49252** | **71,767,968.16** | **41,680,162.45** | **270** | **158** | **46** | **24** | **3** | **45** | **164** |

**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය**

**සංවර්ධන සැලැස්ම - 2011**

**2011-12-31 දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය**

**මොණරාගල දිස්ත්‍රික්කය**

| වැඩසටහන /ව්‍යාපෘතිය | ව්‍යාපෘති ගණන | ප්‍රතිලාභීන් සංඛාව | මුදල් වෙන්කිරිම (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | ව්‍යාපෘති ගණන | භෞතික ප්‍රගතිය (%) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | i 0-10 | ii 11-25 | iii 26-50 | iv 51-75 | v 76-100 | vi වැඩ නිම |
| ගෘහ ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන | 25 | 2500 | 12,500,000.00 | 705,636.00 | 25 | 12 | 9 | 0 | 1 | 2 | 2 |
| ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම | 50 | 2500 | 250,000.00 | 40,967.00 | 50 | 37 | 0 | 1 | 0 | 5 | 7 |
| ව්‍යසායකයින්ගේ කුඩා කණ්ඩායම් පර්ෂද පිහිටුවීම | 25 | 1250 | 125,000.00 | 18,467.00 | 25 | 20 | 0 | 0 | 0 | 2 | 3 |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 25 | 1250 | 125,000.00 | 17,949.00 | 25 | 21 | 0 | 1 | 0 | 1 | 2 |
| කෘෂි ප්‍රවේශ මාර්ග ඉදිකිරිම | 17 | 17116 | 19,431,329.08 | 14,077,490.54 | 17 | 4 | 2 | 0 | 0 | 16 | 37 |
| සුළු වාරිමාර්ග (වැව්/අමුණු/පාලම්/පැතිබැමි) | 20 | 2352 | 11,500,008.38 | 3,938,673.68 | 20 | 9 | 3 | 0 | 1 | 6 | 10 |
| පොදු පහසුකම් (ක්‍රීඩා පිටි) | 0 | 400 | 35,920.00 | - | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| දිවි නැගුම ශක්තිමත් කිරිමේ ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් | 10 | 903 | 2,876,414.45 | 683,736.10 | 10 | 3 | 5 | 0 | 5 | 2 | 2 |
| වෙනත් | 2 | 295 | 2,500,000.00 | - | 2 | 0 | 2 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | **174** | **28566** | **49,343,671.91** | **19,482,919.32** | **174** | **106** | **21** | **2** | **7** | **34** | **64** |

**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය**
**ජාතික සවිය - ගමනැගුම සංවර්ධන වැඩසටහන**
**2011 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය - දිස්ත්‍රික් අනුව**



2012 අගෝස්තු 24

එස්එන්/ එම්ආර්/බී/ශ්‍රී ලං.ද.සං.අධි/අ.ගි/2011

සභාපති
ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනතේ 21 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධි විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ **13** (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සභාපති වෙත 2012 අප්‍රේල් 26 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තිරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ . මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගනකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය

(අ) සම්පූර්ණ වටිනාකම ක්ෂය කර ඇතත් භාවිතයෙන් බැහැර නොකල මෝටර් රථ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 පරිදි ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 42 ප්‍රකාරව පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදිත අරමුදල් ආයෝජනය කිරීම් හා එයින් ලැබෙන ප්‍රතිලාභ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම් කළයුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදිත මුදල රු 34,808,657 ක් වුවත් සේවකයන්ගේ පාරිතෝෂික ගෙවීම් සඳහා පැන නගින අනාගත බැරකම් පියවීමට අදාල අරමුදල ගොඩනැගීම සඳහා රු. 162,204/- ක් වටිනා ගිණුමක් පමණක් ආරම්භ කර තිබුණි.

#### 2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

බත්තරමුල්ල පැලවත්ත රුහුණු පොල ව්‍යාපෘතිය සඳහා වූ ඉඩමේ පස් පිරවීම සඳහා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු. 1,731,183 ක මුදල හා නාගරික සංවර්ධන අධිකාරියට හිග බදු හා වැට් බද්ද සඳහා ගෙවිය යුතු රු.368,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.3 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

(අ) 2011 වර්ෂයේ සංවර්ධන සැලැස්ම අනුව ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවල " දිවිනැගුම '' වැඩ සටහනහි ගෘහස්ත ආර්ථික ඒකක සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීමේ ජීවනෝපාය හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල රු. 214,970,484 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තත්‍ය වියදම රු. 51,921,998 ක් වුවද ප්‍රගති වාර්තාව අනුව රු. 77,405,823 ක් වූයෙන් වෙනස රු. 24,483,825 ක් විය.

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂ නිවාස ව්‍යාපෘතිය සඳහා අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව තත්‍ය වියදම රු. 58,638,447 ක් වුවද ප්‍රගති වාර්තාව අනුව වියදම රු. 44,106,000 ක් වූයෙන් වෙනස රු. 14,532,447 ක් විය.

(ඇ) ඉඩම් අංශයෙන් හා ගිණුම් අංශයෙන් ලද තොරතුරු අනුව ඉඩම් බදු ආදායම හා ඉඩම් වටිනාකම රු. 19, 123,777 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අතර වටිනාකම රු. 18,783,254 ක් වූයෙන් වෙනස රු. 340,523 ක් විය.

### 2.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු. 2,776,827 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවා නොතිබුණි.

(ආ) ආංශික අත්තිකාරම් වශයෙන් 1999 වර්ෂයේ සිට 2001 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයතුල ලබාදී තිබූ රු. 2,493,173 ක් වූ මුදල සමාලෝචිත වර්ෂයේද නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) ඉඩම අත්පත් කර ගැනීමේ කාර්ය සඳහා වර්ෂ කිපයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තැන්පත් ලෙස ඉඩම් 05 කට ගෙවා තිබූ රු. 3,225,000 ක් සම්බන්ධයෙන් පසු විපරම් කර නිරවුල් කිරීමට හෝ එම ඉඩම් අපේක්ෂිත කාර්යයන්හි යෙදවීමට ක්‍රියාකර නොතිබුණි.

(ඈ) වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතු මුදල් ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 58,199 ක් වූ ණය හිමි ශේෂ සමාලෝචිත වර්ෂයේද නිරවුල් කර නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් වර්ෂ ගණනාවකට පෙර ලබාදී තිබූ රු. 1,424,409 ක් වූ ණය හා අත්තිකාරම් ශේෂ 08 ක් ආපසු අයකර ගැනීමට 2011 දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.

(ඊ) විවිධ ව්‍යාපෘති සඳහා විවිධ ආයතන හා පුද්ගලයන් 13 ක් වෙත ගෙවා තිබූ රු. 1,326,151 ක් වූ මුදලක් 2012 පෙබරවාරි 28 දින වන විටද ආපසු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පිරිවැය රු. 2,146,652 ක් වූ සන්නිවේදන උපකරණ සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකල හෙයින්, එකී විෂයය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 2.2.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| මු.රෙ. 371 | අත්තිකාරම් මුදල් අදාල කාර්යය නිමවූ විගස පියවිය යුතු වුවත් 1999 වර්ෂයේ අවසානය දක්වා ගෙවන ලද රු.6,585,888 ක අත්තිකාරම් 2011 දෙසැම්බර් 31 දිනවන විටත් පියවා නොතිබුණි. |
| (ආ) අංක 41/90 සහ 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | මාස 06 කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2011 මැයි 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 8/24 ට අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 11/04/25 | රු. 24,053,809 ක් වටිනා ශේෂ 51 ක් වසර 10 ට වැඩි කාලයක් තිස්සේ නොලැබී පවතින හෙයින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වන අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගෙන පොත්වලින් ඉවත් කිරීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එය සිදුව නොතිබුණි. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මෙම මුදල් අයකරගන්නා ලෙස හෝ අදාල ලියවිලි සොයාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලපුම් කරන ලෙස දැනුම් දී නොතිබුණි. |

## 03. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵලය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයතුල අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය ර . 26,406,382 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු. 8,672,824 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. 20,878,761 කින් වැඩිවී තිබීම සමාලෝචිත වර්ෂයේ ඌණතාව වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයතුල දිවිනැගුම වැඩ සටහන හා ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල දිස්ත්‍රික්ක 04 සඳහා ව්‍යාපෘති 1448 ක් වෙනුවෙන් රු 348,331,160 ක මුදලක් වෙන්කර ඉන් ව්‍යාපෘති 902 ක් නිම කිරීම වෙනුවෙන් රු 184,075,257 ක් වැය කර තිබුණි. ව්‍යාපෘති 546 කට අදාල ප්‍රතිපාදනය වූ රු. 164,255,903 ක මුදල වැය නොකර ඉතිරි වී තිබුණි. ඉතිරියේ ප්‍රතිශතය සියයට 47.1% ක් විය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබ් තිබුණේ 2011 ජූලි 19 දින වන අතර දිවිනැගුම වැඩ සටහනට අදාල ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණේ **2011** සැප්තැම්බර් **27** දිනදීය.

(ii) අධිකාරිය පනතේ මූලික කාර්යයන්ගෙන් පරිබාහිර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවිනැගුම හා ජාතික සවිය ගමනැගුම වැඩ සටහන් මූලික කාර්යයන් සේ සළකා රු. 300,500,000 ක වියදම් ඉලක්කයක් සහිත සංවර්ධන සැලැස්මක් 2011 වර්ෂයේ පිළියෙල කර තිබූ අතර, එකී වැඩ සටහනේ නව වැඩ හා උපචිත, අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු . 119,102,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණි. එකී ලැබීමේ ප්‍රතිශතය 39.6% ක් තරම් සුළු අගයක් විය.

(iii) දිවිනැගුම වැඩ සටහන සඳහා ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්ක 04 හි 04 හි ගෘහස්ථ ආර්ථික ඒකක, ජීවනෝපාය, යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.214,970,484 ක් වැයකිරීමට ඉලක්ක කළද ප්‍රගති වාර්තාව අනුව වියදම රු.77,405, 822 ක් වන අතර ගෘහස්ථ ආර්ථික ඒකක, ජීවනෝපාය, යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු. **214, 970, 484** ක් වැය කිරීමට ඉලක්ක කළද, ප්‍රගති වාර්තාව අනුව තත්‍ය වියදම රු. **77,405,822** ක් වූ අතර වියදමේ ප්‍රතිශතය 36% ක් විය.

(iv) සභාපති / අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 ජූලි 06 දිනැති දිවිනැගුම උපදෙස් අංක එස්ඩීඒ/2011/2 දරණ චක්‍රලේඛ ලිපියේ 04 ඡේදය පරිදි දිවිනැගුම වැඩ සටහන යටතේ නිවාස ආශ්‍රිත සංචාරක නවාතැන් පොළවල් ඇතිකිරීම සඳහා දැනුම ලබාදීමටත්, ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රතිපාදන ලබාගෙන ආංශික කළමනාකරු යටිතල පහසුකම් විසින් කටයුතු කළ යුතු බව දක්වා ඇතත් සංචාරක සංවර්ධන අධිකාරියේ සහාය නොලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක වී නොතිබුණි.

(v) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් (සංවර්ධන) ගේ 2011 නොවැම්බර් 24 හා අංක MED/RE/R2/SDA/GEN/2011 දරණ ලිපියෙන් අධිකාරියේ ගාල්ල, මාතර හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල 2011 වර්ෂයේ සංවර්ධන සැලැස්මෙහි අත්‍යාවශ්‍ය යටිතල හා වාරිමාර්ග ව්‍යාපෘති 33 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මුල් සැලැස්මෙහි ඇතුළත් ප්‍රමුඛතාවයෙන් අඩු ව්‍යාපාතිවලින් රු. 11,696,742 ක මුදලක් මාරුකිරීමට අනුමැතිය ලැබී තිබුණි. මෙම අනුමැතිය ලද ව්‍යාපෘතිවලින් රු.3,954,027 ක් වටිනා ව්‍යාපෘති 11 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 4.2.1 බත්තරමුල්ල - පැලවත්ත රුහුණු පොළ ව්‍යාපෘතිය

අධිකාරිය, දක්ෂිණ ප්‍රදේශයේ නිෂ්පාදකයින්ගේ කෘෂි සහ සත්ව නිෂ්පාදන, මැටි භාණ්ඩ, කළුගල් භාණ්ඩ නිපපාදන සඳහා සාධාරණ මිලක් ලබාදීමේ අරමුණින් රුහුණු නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් අගනුවර ආරම්භ කිරීමට බත්තරමුල්ල පැලවත්ත සුනිල් මාවතේ, ඉඩමක් 2005 ජූලි 27 දින නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරාගෙන තිබුණි. 2006 නොවැම්බර් 02 දින ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සමග ඉඩම සංවර්ධනය සඳහා රු. 2,254,230 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඒ සඳහා රු. 4,164,920 ක් වැයකර තිබුණි.

මේ සම්බන්ධව නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ඉඩම) ගේ 2005 ජූලි 27 හා අංක 10/8/2291 දරණ ලිපිය පරිදි සැලසුම් අංක 3/2005 හි ලොට් අංක 01 ට අයත් අක්කර 01 ක භූමි භාගය සඳහා ලිඛිත ඔප්පුවක් ලබාදී නොතිබුණි. තවද නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට එළඹීම සඳහා රු 204,400 ක් ගෙවා ඇතත් පාර්ශවකරුවන් අතර ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ආ) ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් මීටර් 09 ක් පළල යකඩ පාලමක් ඉදිකිම සඳහා 2007 පෙබරවාරි 21 දිනැතිව රු 2,443,828 ක් වටිනා ඇස්තමේන්තුවක් (වැට්බදු සහිත) ඉදිරිපත් කර තිබූ අතර පාලම ප්‍රවාහනය සහ ආරක්ෂා කිරීම වෙනුවෙන් රු. 160,000 ක් ගෙවා තිබුණද පාර්ශවකරුවන් අතර ගිවිසුම්ගත බැදීමක් ඇතිකරගෙන නොතිබූ අතර පාලම ඉදිකිරීමද සිදුව නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය දක්වා දරණ ලද වියදම්තුල අධිකාරියේ ලොරි රථ 07 ක් අළුත්වැඩියා කිරීම හා හම්බන්තොට ගොවි ගැටළු විසදීම සඳහා වැයකල රු. 464,485 ක මුළු වියදම් ගණනය කිරීමේදී අත්හැර තිබුණි.

(ඇ) දක්ෂිණ සංවර්ධන අධිකාරිය පිළිබඳව 2007 පෙබරවාරි 27 දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේදී යෝජිත පොළ පිහිටි අක්කර 01 ක ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරාදීමටත් එය ආගමික කටයුතු අමාත්‍යාංශයට පවරා දී අධිකාරිය වැයකල මුදල ආපසු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලබාගැනීමටත් තීරණය කර තිබුණද, 2012 පෙබරවාරි 24 දින වන විටද එම අමාත්‍යාංශය කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි.

(ඉ) 2012 මාර්තු 02 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විට අධිකාරිය විසින් සංවර්ධනය කර තිබූ ඉඩම බාහිර පාර්ශවයක් විසින් පරිහරණය කරමින් තිබූ අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ හෝ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ලිඛිත අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

(ඊ) දක්ෂිණ ප්‍රදේශයේ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීමේ අරමුණින් ආරම්භ කළ රුහුණු පොළ ව්‍යාපෘතිය 2012 පෙබරවාරි 24 දින වන විටද ක්‍රියාත්මක නොවූයෙන් අයිතිය නිසි ආකාරයෙන් පවරා නොගෙන ඉඩම සංවර්ධනය සඳහා වැයකල රු. 4,164,920 ක ආයෝජනය ඵලරහිත වී ඇති බව නිරීක්ෂණය විය.

### 4.2.2 නිල්වලා ගඟ ව්‍යාපෘතියේ යකඩ පාරුව

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) නිල්වලා ගඟ යටතේ ක්‍රියාත්මක වූ විදේශීය සමාගමකට අයත් (ප්‍රංශයේ බෙක් සමාගම) අත්හැර දමා ගිය පාරුවක් අධිකාරි පනතේ 12 (ඇ) ,13 (ඇ), (ඌ), (ඒ), (ඩ), සහ (ක) වගන්තිවල බලතල ප්‍රකාරව පවරාගෙන තිබුණි.

(ආ) 2007 ජනවාරි 31 දිනැති ගිවිසුම මගින් මෙම යකඩ පාරුව අලුත්වැඩියා කර භාවිතා කිරීමට ආයතනයකට පවරා දී තිබූ අතර, ගිවිසුම පරිදි පාරුව රැගෙන යාමට නොහැකිවීම මත සිදුවූ පාඩුව සඳහා රුපියල් මිලියන 158 ක වන්දි ඉල්ලා 2011 ජූනි 09 දින අංක HV/civil/2001/2011/MR දරන නඩුව අධිකාරියට එරෙහිව පවරා තිබුණ.

(ඇ) අධිකාරියේ පනත උපයෝගී කරගෙන අධිකාරියේ කටයුතු සඳහා කිසිදු සම්බන්ධයක් නැති යකඩ පාරුවක් බාහිර පුද්ගලයෙකුට අධිකාරිය වගකීමට ලක් කරමින් ලිඛිත ගිවිසුමක් මගින් පවරා දීමට හිටපු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්) ගේ අභිමතය පරිදි සිදුකළ අවිධිමත් ක්‍රියාකලාපය හේතුවෙන් අධිකාරිය වන්දි ගෙවන තත්වයට පත්ව් තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්‍ෂමතා

**4.3.1** අධිකාරියේ එක් එක් අංශයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරීක්‍ෂණයන් පහත දැක්වේ.

| අංශය | | අඩුපාඩු පිළිබඳ නිරීක්‍ෂණය |
|---|---|---|
| ඉඩම් අංශය | | රු. 100,000 ක වියදම් ඉලක්කයක්වූ මී මැඩුම සති සයිඩ් කථගල් ව්‍යාපෘතිය සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට නොහැකි වීමත්, ප්‍රතිලාභී උනන්දුව නොමැතිවීමත් හේතුවෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. |
| ධීවර අංශය | (i) | ධීවර නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබූ අතර, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මත්ස්‍ය ඇසිත්තන් ඇගිල්ලන් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය, බක්මීගහ වැව මත්ස්‍ය පැටව් තැන්පත් කිරීමේ රු 20,000 ක ව්‍යාපෘතිය ධීවර ජනතාවගේ ආදායම් වැඩිදියුණු කිරීමේ රු.330,000 ක ව්‍යාපෘතිය යනාදී ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොතිබුණි. |
| | (ii) | මිරිදිය මත්ස්‍ය පොකුණු ඉදිකිරීම හා මත්ස්‍ය ඇසිත්තන් ඇගිල්ලන් දක්වා ඇඩි කරන රු. **380,000** ක් වටිනා පොකුණු ඒකක දෙකක් පිහිටුවීමට ඉලක්ක කළද එය ඉටුවී නොතිබූ අතර, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය මගින් මිලදී ගන්නා ලද මත්ස්‍ය ඇගිල්ලන් ප්‍රවාහනය කිරීම සඳහා රු. **10,000** ක් අධිකාරිය මගින් වැය කර තිබුණි. |
| | (iii) | සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ධීවර හා සෞඛ්‍ය අංශයේ රු 1,425,000 ක වියදම් ඉලක්කයක් වූ අතර, එකී සැලැස්මේ ප්‍රගති වාර්තාව අනුව කිසිදු වියදමක් දරා නොතිබුණි. |
| කෘෂිකර්ම අංශය | (i) | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්ම පරිදි නව වැඩ හා අඛණ්ඩ වැඩ 485 ක් ඉටුකිරීම වෙනුවෙන් රු.69,650,000 ක වියදම් ඉලක්කයක් වූ අතර, ප්‍රගති වාර්තාව අනුව නව වැඩ හා අඛණ්ඩ වැඩ 293 ක් සඳහා තථ්‍ය වියදම රු 19,981,329 ක් වූයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉටුවී නොමැති බව නිරීක්‍ෂණයවිය. |
| | (ii) | බීජ හා පැළ සැලසුම් මධ්‍යස්ථාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික්කවල කුඩා ප්‍රමාණයේ දේශීය සැපයුම්කරුවන් 150 ක් ස්ථාපිත කිරීමට රු. 1,500,000 ක වියදම් ඉලක්කයක් වූ අතර, ඉහත කී දිස්ත්‍රික්ක හතරේ ප්‍රතිලාභීන් 100 කට රු. 911,146 ක් පමණක් වැයකර තිබුණි. |
| | (iii) | කුකුළන් ඇඩිකිරීමේ මධ්‍යස්ථාන/වාණිජ කුකුළු ගොවිපල මධ්‍යස්ථාන 50 ක් පිහිටුවීමට රු 1,250,000 ක්වූ වියදම් ඉලක්කයෙන් ප්‍රතිලාභීන් 31 ක් පුහුණු කිරීම, කුඩුතැනීම හා උපාංග ලබාදීම දිනක් වයසැති කුකුළු පැටවුන් ලබාදීම යනාදී කාර්යයන් සඳහා මධ්‍යස්ථාන 33 ක් වෙනුවෙන් රු. 697,792 ක් පමණක් වැයකර තිබුණි. |

(iv) එළු අභිජනන ව්‍යාපෘති/වාණිජ එළු ගොවිපල මධ්‍යස්ථාන 25 ක් පිහිටුවීමට රු. 1,250,000 ක් වූ වියදම් ඉලක්කයෙන්, ප්‍රතිලාභීන් 10 ක් පුහුණු කිරීම, මඩු තැනීම යන කාර්යයන් සඳහා මධ්‍යස්ථාන 10 ක් වෙනුවෙන් රු.120,705 ක් පමණක් වැයකර තිබුණි.

(v) ගව අභිජනන ව්‍යාපෘති/වාණිජ ගව ගොවිපල මධ්‍යස්ථාන 20 ක් පිහිටුවීමට රු. 2,000,000 ක් වූ වියදම් ඉලක්කයෙන් ප්‍රතිලාභීන් 24 දෙනෙකු පුහුණු කිරීම, මඩු තැනීම සඳහා ද්‍රව්‍ය ලබාදීම යන කාර්යයන් සඳහා මධ්‍යස්ථාන 20 කට රු. 633,664 ක් පමණක් වැයකර තිබුණි.

මානව සම්පත් සංවර්ධන හා පුහුණු අංශය

මානව සම්පත් සංවර්ධන හා පුහුණු අංශය මගින් දිවිනැගුම වැඩ සටහනේ ප්‍රගතිය පිළිබඳ විස්තරාත්මක දත්ත පද්ධතියක් සකස් කර සංයුක්ත තැටියක් පිළියෙල කළ යුතු වුවද, 2012 ජුලි 05 දින වන විටද එය ( සී ඩී තැටිය) පිළියෙල වී නොතිබුණි.

කර්මාන්ත අංශය

**(අ) බට කර්මාන්තය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව කර්මාන්ත අංශයේ බට කර්මාන්ත ව්‍යාපෘතිය වෙනුවන් මාතර දිස්ත්‍රික්කයේ පලොල්පිටිය හා බටුවිට ග්‍රාම නිලධාරි කොට්ඨාශවල බට කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් හා සේවා සැපයීමට රු. 500,000 ක් වැය කිරීමට ඉලක්ක කළද, ප්‍රගති වාර්තාව අනුව වියදම රු. 50,758 ක් විය .

**(ආ) බිබුලෙගොඩ මැටි කර්මාන්තකරුවන්ගේ ජීවනෝපාය නංවාලීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බිබුලෙගොඩ ගම්මානයේ මැටි කර්මාන්තයේ යෙදෙන කර්මාන්තකරුවන් වෙනුවෙන් අධිකාරිය හා පුද්ගල දායකත්වය පිළිවෙලින් රු. 335000 ක් හා රු. 321,000 ක් වැය කිරීමට තිරණය කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු ඉටුකර නොතිබුණි.

### 4.3.2 ආශ්‍රිත සමාගමක අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනතේ 13 (ඉ) වගන්තිය පරිදි, අධිකාරියේ කර්තව්‍ය කිරීමට අදාල යම් කටයුතු සම්බන්ධයෙන් අධිකාරියේම දෙපාර්තමේන්තු හෝ නියෝජ්‍යායතන පිහිටුවීමට ප්‍රතිපාදන සළසා තිබුණි. ඒ අනුව, වෙනත් නමකින් පොදු සමාගමක් ලෙස තිබි 2007 අංක 07 සමාගම් පනත පරිදි, 2009 නොවැම්බර් 17 දින සිට සී/ස දක්ෂිණ සංවර්ධන මූල්‍ය සමාගම ලෙස ව්‍යාපාරික නාමය වෙනස් කර පොදු සමාගමක් ලියාපදිංචි කර තිබුණි.

අධිකාරිය රුහුණු 2001 වෙන්චර් කැපිටල් සමාගමේ රු. මි. 60 ක් වූ කොටස් ප්‍රාග්ධනයෙන් එකක් රු. 10 සාමාන්‍ය කොටස් දශ ලක්ෂයක රු. 10,000,000 ක් යොදවා තිබුණි. මෙයට අමතරව, විවිධ ණය යොජනා ක්‍රම සඳහා රු. 35,000,000 ක් ද ලබාදී තිබුණි. එමෙන්ම, 1999, 2000, 2001 වර්ෂවල පොදු සමාගමේ කාර්ය මණ්ඩල වැටුප් හා වෙනත් වියදම් වශයෙන් රු. 6,858,958 ක් දරා තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ)

(i) පොදු සමාගම පාඩු ලැබීම හේතුවෙන්, වර්ෂ 1997 සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 14 ක කාල පරිච්ඡේදය තුළ ආයෝජිත මුදල් සඳහා ලාභාංශ හෝ පොලී මුදලක් ලැබී නොතිබුණි.

(ii) මුලින් තිබූ වෙන්චර් කැපිටල් සමාගම විසින් අධිකාරිය නියම කර තිබූ කාර්යයන්ට පටහැනිව ණය ලබාදී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(iii) අධිකාරිය රුහුණ 2001 වෙන්චර් කැපිටල් සමාගම සමග අත්සන් කළ ගිවිසුම් කොන්දේසි පරිදි, ණය යෝජනා ක්‍රම සඳහා ලබාදුන් මුදල් ආපසු ගෙවිය යුතු විය. ඒ අනුව, රු. 35,000,000 ක මුදලින් රු. 12,000,000 ක් ප්‍රතිචක්‍රීය අරමුදල් බවට පත්කර තිබූ අතර, එම මුදල හා ආපසු අයවී තිබූ රු. 1,927,480 ක මුදල අඩුකළ පසු, රු. 21,072,520 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවීමට තිබුණි.

(iv) අධිකාරිය විසින් ණය යෝජනා ක්‍රම සඳහා රුහුණ 2001 වෙන්චර් කැපිටල් සමාගම වෙත ණය මුදල් ලබාදීමේදී අත්සන් කරන ලද කිසිදු ගිවිසුමක අයෝජනයට ලැබිය යුතු පොලී මුදලක් පිළිබඳ සටහන් කර නොතිබුණි.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල විස්තරය පහත දැක්වේ. ඒ අනුව, තනතුරු 21 ක පුරප්පාඩු පැවතුණි.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක | 17 | 12 |
| ද්විතියික | 190 | 176 |
| ප්‍රාථමික | 80 | 78 |
| | 287 | 266 |

## 4.5 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී පෙට්‍රල් මෝටර් රථ 02 ක්, ඩීසල් මෝටර් රථ 10 ක්, ඩීසල් කැබ් රථ 19 ක්, බවුසර් 04 ක්, ලොරි රථ 07 ක් සහ වෑන් රථ 02 ක් අධිකාරියේ ප්‍රවාහන ඇණිය සතුවිය. වාහන උපයෝජනය පිළිබඳ වැදගත් දත්ත විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2011 | 2010 |
|---|---|---|
| ඉන්ධන වියදම රු | 5,665,334 | 5,864,104 |
| අලුත් වැඩියා හා නඩත්තු වියදම රු | 7,640,625 | 3,925,256 |
| රියදුරු වැටුප්, බටා හා අතිකාල රු | 13,720,449 | 4,653,934 |
| මුළු පිරිවැය රු. | **27,026,408** | **14,443,294** |
| ධාවනය කර ඇති මුළු දුර කිලෝමීටර | 565,615 | 518,560 |
| පරිභෝජනය කර ඇති ඉන්ධන ලීටර් ** | 70,489 | 65,720 |
| ඉන්ධන ලීටරයකට ධාවනය කළ සාමාන්‍ය දුර කි.මී | 8.02 | 7.89 |
| කිලෝමීටරයකට ඉන්ධන සඳහා සාමාන්‍ය වියදම රු. | 10.1 | 11.3 |
| කිලෝමීටරයකට අලුත්වැඩිය හා නඩත්තු සාමාන්‍ය වියදම රු. | 13.5 | 7.56 |
| කිලෝමීටරයකට රියදුරු පාරිශ්‍රමක සඳහා සාමාන්‍ය වියදම රු. | 24.25 | 8.97 |
| කිලෝමීටරයක් සඳහා සමස්ථ සාමාන්‍ය වියදම රු. | 47.78 | 27.85 |

**පරිභෝජනය කර ඇති ඉන්ධන ප්‍රමාණය තුල බාහිර ආයතන විසින් අතිරේකව වැයකල ඉන්ධනද ඇතුළත්ව ඇත.

## 4.6 වෙනත් පුද්ගල හා රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව අධිකාරිය සතු වාහන පහත සඳහන් පුද්ගලයන් වෙත මුදාහැර තිබුණි.

| වාහන අංකය | වාහන වර්ගය | වාහනය පරිහරණය කරන පුද්ගලයාගේ තනතුර |
|---|---|---|
| 300-0546 | මෝටර් රථය | උපදේශක |
| 57-5713 | ඩබල්කැබ් රථය | ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධීකරණ නිලධාරි |

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරිය තම කටයුතු මෙහෙයවීම සඳහා 2008 සිට 2012 දක්වා කාල පරිච්ජේදය සඳහා ගාල්ල, මාතර, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල හා කොලොන්න, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ අංශ අටක් යටතේ රුපියල් මිලියන 2,127.74 ක් වැය කිරීමට සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ අතර, 2008 නොවැම්බර් 17 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති රුස්වීමකදී අධිකාරියට දෙන ලද නියෝගයක් පරිදි, එකී සැලැස්ම අතහැර දමා 2009 වර්ෂයේ සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික සවිය ගමනැගුම වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් පවති.

(ආ) 2012 සිට 2015 දක්වා කාල පරිච්ජේදය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩ සටහනට අනුව, සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණි.

(ඇ) ආයතනයේ අරමුණුවල ඇතුලත් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබූ අතර, ඊට අදාල සැලසුම් සැකසීමටද සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයතුල කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(i) නිශ්පාදනශීලීත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් සහ රැකියා අවස්ථා ජනනය කිරීම අරභයා වූ සංවර්ධන ව්‍යාපෘති නම් කළ ප්‍රදේශ තුළ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ii) නම් කළ ප්‍රදේශයේ සමස්ථ සංවර්ධන සැලැස්මෙන් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමුඛත්ව පදනමක් මත සවිස්තරව අධ්‍යයනය කිරීම.

(iii) යම් නිශ්චිත ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා විදේශීය අරමුදල් සපයා ගැනීමට අදාල අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

2011 වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති තීරණය කිරීමේදී අධිකාරියේ සියලු අංශ සැලකිල්ලට ගෙන නොතිබුණි. ආයතනයේ අරමුණුවලට පරිබාහිරව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, ඉලක්ක කරා ළගාවී නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමේදී අංක PED/12 හා **2003 ජූනි 02** රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාර වගකීම් පවරා ඇති නිලධාරින් නිශ්චිතව දක්වා තිබිය යුතු වුවද, 2011 ක්‍රියාකාරි සැලැස්මෙහි එසේ වගකිවයුතු නිලධාරීන් නිශ්චිතව නොදක්වා වගකියන අංශය පමණක් දක්වා තිබුණි.

## 5.3 අයවැය ලේඛණමය පාලනය

ඇස්තමේන්තුගත වෙනත් ආදායම්වල සියයට සියයක අවාසි සහගත තත්වයක් හා සංවර්ධන හා ප්‍රාග්ධන වියදම්වල ඇස්තමේන්තු ගත කර තිබූ වියදම් දරා නොතිබීමත්, ඇතැම් ඇස්තමේන්තුගත සංවර්ධන වියදමට වඩා ඉතා අඩු වියදම් ප්‍රමාණයක් වීමත් මත අයවැය ලේඛණය සඵල කලමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇති බවක් නිරීක්‍ෂණය  නොවීය.

## 5.4 පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම

(අ) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2007, 2008 සහ 2009 වර්ෂවලට අදාල ගිණුම් සම්බන්ධව විගණකාධිපතිවරයාගේ වාර්තා සම්බන්ධයෙන් 2011 ඔක්තෝබර් 25 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ තීරණ හා නියමයන් අදාල අධිකාරිය වෙත නිකුත් කර තිබූ අතර, 2012 මාර්තු 15 දින වන විට එම තීරණ සම්බන්ධයෙන් විවිධ ආයතන හා පුද්ගලයන් වෙත ලිපි ගනුදෙනු කිරීම පමණක් සිදුව තිබුණි.

(ආ)

(i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2012 පෙබරවාරි 15 දිනැති අංක  MED/AQ/5/7/2012 දරණ ලිපියෙන් අධිකාරිය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල  වාර්තාවේ සඳහන් හෙළිදරව් කිරීම් හා නියමයන් පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක කළයුතු බවත්, හදුනාගෙන ඇති අක්‍රමිකතා නැවත ඇති නොවීම සඳහා නිලධාරීන් වෙත වගකීම පැවරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් තීරණය කර, 2012 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩලයද අනුමත කර ඇති බවත් දන්වා තිබුණි.

(ii) තවද හදුනාගෙන ඇති කරුණු සම්බන්ධයෙන් රජයට කිසියම් අලාභයක් සිදුව ඇත්නම් එය අයකර ගැනීමටත්, අක්‍රමිකතාවයක් සිදුවී ඇත්නම් විනයානුකූලව කටයුතු කිරීමටත්, වගකිවයුතු නිලධාරියා/නිලධාරීන්ගේ නම් ලිපිනයන් වරද නිවැරදි කිරීමට මෙතෙක් යොදා ඇති ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, අධිකාරියේ සභාපතිවරයා වෙත දන්වා තිබුණද, සභාපතිවරයාගේ 212 පෙබරවාරි 17 දිනැති ලිපියෙන් විධිමත් පරිදි විස්තර සපයා නොතිබූ බව නිරීක්‍ෂණය විය.

## 06. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයා වෙත වරින් වර දන්වා යවන ලදී. අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු පද්ධති හා පාලන ක්‍ෂෙත්‍ර පහත දැක්වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණය මුදල් සහ ආදායම් රැස්කිරීම
(ඇ) පැරණි ණයගැති සහ ණයහිමි ශේෂ
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ) රාජ්‍ය ව්‍යවසාය කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පසු විපරම.

**එච්. ඒ. එස්. සමරවීර**
**විගණකාධිපති**

## ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව වාර්තාව

| වත්කම් | සටහන | 2011 වර්ෂය රු | 2011 වර්ෂය රු | 2010 වර්ෂය රු | 2010 වර්ෂය රු |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල යන්ත්‍ර හා පිරියත (ලියාහල අගය) | 1 | 145,819,537 | | 149,475,797 | |
| ආයෝජන (දිගු කාලීන) | 2 | 43,097,520 | | 43,913,183 | |
| වෙනත් මූල්‍ය වත්කම් | | - | 188,917,057 | - | 193,388,981 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 3 | 660,385 | | 533,010 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ආදායම් | 4 | 34,366,341 | | 37,222,492 | |
| ඉදිරියට ගෙවීම් | 5 | 979,842 | | 2,021,007 | |
| මුදල් හා මුදල් සමාන වත්කම් | 6 | 5,570,258 | 41,576,826 | 61,478,247 | 101,254,757 |
| **මුළු වත්කම්** | | | **230,493,883** | | **294,643,737.42** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 15,081,083 | | 26,493,104 | |
| උපචිත වියදම් | 8 | 39,891,644 | | 25,462,192 | |
| කෙටිකාලීන ණය ගැනීම් (බැංකු අයිරා) | | - | 54,972,727 | - | 51,955,296 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | | - | | - | |
| ණය ගැනීම් | | - | | - | |
| විලම්භිත ආදායම් | | - | | - | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 34,808,657 | 34,808,657 | 23,268,505 | 23,268,505 |
| **මුළු වගකීම්** | | | **89,781,384** | | **75,223,801** |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | **140,712,499** | | **219,419,936** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | | | |
| සමුච්චිත අරමුදල | EC | 140,712,499 | | 219,419,936 | |
| සංචිත | | - | 140,712,499 | - | 219,419,936 |
| සමුච්චිත අලාභ | EC | | - | | - |
| | | | **140,712,499** | | **219,419,936** |

මෙම මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන, අංක 67 සිට 91 දක්වා වන පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසකි.

මීට අදාල විගණන වාර්තාව අංක 51 සිට 61 දක්වා වන පිටුවල දැක්වේ.
වරහන්තුල දැක්වෙන සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවලට සහ ගිණුම් ප්‍රමිතවලට අනුකූලවන සේ පිළියෙල කර ඇති බවට සහතික කරමි.

.....................................................

**අධ්‍යක්ෂ (මුදල් හා පාලන)**
**ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරිය**

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
මෙම මූල්‍ය ප්‍රකාශනය ඇතුළු සියළු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබමි.

.........................................................

**සභාපති/අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරිය**

**දිනය** :- 2012-02-24

**ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය**

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව**

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම්** | | | |
| පුනරාවර්තන ලැබීම් | | 107,600,000 | 105,632,000 |
| වෙනත් ආදායම් | **9** | 7,073,581 | 5,896,379 |
| | | 114,673,581 | 111,528,379 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | **10** | 102,982,593 | 87,740,681 |
| ගමන් වියදම් | **11** | 2,379,175 | 2,218,317 |
| සැපයුම් හා පාරිභෝගික සේවා | **12** | 5,348,518 | 4,429,865 |
| නඩත්තු වියදම් | **13** | 12,170,101 | 9,292,973 |
| කොන්ත්‍රාත් සේවා | **14** | 3,778,800 | 3,865,199 |
| ක්ෂයවීම් | **01** | 11,074,248 | 10,766,528 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | **15** | 3,346,529 | 1,887,641 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | 141,079,964 | 120,201,203 |
| **කාල පරිච්ජේදය සඳහා මෙහෙයුම් වියදම්වල අතිරික්තය/(ඌණතාවය)** | | **(26,406,382)** | **(8,672,824)** |

මෙම මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන, අංක 67 සිට 91 දක්වා වන පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සමග සමගාමීව කියවිය යුතුය.

මීට අදාල විගණන වාර්තාව අංක 51 සිට 61 දක්වා වන පිටුවල දැක්වේ.

වරහන්තුල දැක්වෙන සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

## ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය

## 2011-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ

| | සමුච්චිත අරමුදල | සමුච්චිත අඩුවීම/වැඩිවීම | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය (මෙහෙයුම් ප්‍රතිඵලයට පෙර)** | **167,118,881** | **-** | **167,118,881** |
| ගිණුම් ප්‍රතිපත්ති වෙනස්වීම් | - | - | - |
| සංශෝධිත ශේෂය | 167,118,881 | - | 167,118,881 |
| වත්කම් ආගනනයේ වැඩිවීම | - | - | - |
| ආයෝජන නැවත ආගනනයේ අඩුවීම | - | - | - |
| විනිමය පරිවර්තනයන්ගේ වෙනස්වීම | - | - | - |
| මූල්‍ය සමාලෝචනය තුල හඳුනාගත නොහැකි ශුද්ධ ලැබීම් හා පාඩු | - | - | - |
| කාලපරිච්ඡේදයේ අතිරික්තය/ඌණතාවය | - | (26,406,382) | (26,406,382) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **167,118,881** | **(26,406,382)** | **140,712,499** |

| සමුච්චිත අරමුදල | උපලේඛණ | | | එකතුව |
|---|---|---|---|---|
| **2011-01-01 දිනට ශේෂය** | | **-** | **219,419,936** | |
| එකතු කළා: 2009-01-01 දිනට නොනිමි වැඩ | | | 17,189,233 | |
| 2010-01-01 දිනට සංවර්ධන වැය | | | 1,754,939,136 | |
| | | | **1,991,548,305** | - |
| සමුච්චිත අරමුදල සඳහා පෙර වර්ෂ ගැලපීම් | | | (1,726,239) | |
| | | | **1,989,822,066** | |
| 2011 වසර සඳහා අරමුදල් ලැබීම් | | - | 119,102,000 | |
| සාමාන්‍ය වැඩසටහන් | | | 50,000,000 | |
| විශේෂ ව්‍යාපෘති | | - | **2,158,924,066** | 2,158,924,066 |
| 2011-12-31 දිනට සමුච්චිත සංවර්ධන වැය | (උපලේඛණය - 22) | උපලේඛණය -20 | | (1,991,513,537) |
| නොනිමි වැඩ | (උපලේඛණය 20) - | උපලේඛණය -16 - | - | (291,648) - |
| **2011-12-31 දිනට සමුච්චිත අරමුදල (මෙහෙයුම් ප්‍රතිඵලයට පෙර)** | | | | **167,118,881** |

මෙම මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන, අංක 67 සිට 91 දක්වා වන පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සමග සමගාමීව කියවිය යුතුය.

මීට අදාල විගණන වාර්තාව අංක 51 සිට 61 දක්වා වන පිටුවල දැක්වේ.

වරහන්තුල දැක්වෙන සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

## ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරිය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අතිරික්තය/ඌණතාවය | (26,406,382) | (8,672,824) |
| **මුදල් නොවන වෙනස්වීම්** | | |
| | 11,074,248 | 10,766,527 |
| ක්ෂයවීම් | 12,362,617 | 2,418,712 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 17,189,233 | 8,803,513 |
| පෙර වර්ෂ ගැලපීම් - නොතිම් | (1,726,239) | (548,954) |
| - සමුච්චිත අරමුදල | (1,093,516) | (4,480,769) |
| - සමුච්චිත ක්ෂය | (49,590) | 328,372 |
| - සමුච්චිත සංවර්ධන වැය | 3,017,431 | (39,193,277) |
| ගෙවිය යුතු වටිනාකම් වැඩිවීම (අඩුවීම) | - | (230,440) |
| දේපළ උපකරණ පිරියත විකිණීමේ ලාභ/(පාඩු) (වාහන) | 913,790 | (884,020) |
| වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම/ (අඩුවීම) | - | - |
| ලැබිය යුතු වටිනාකම්වල වැඩිවීම | 2,856,152 | 21,149,136 |
| වෙනත් අසාමාන්‍ය අයිතම | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **18,137,742** | **(10,544,025)** |
| **ආයෝජන ක්‍රියාකාරම්වල මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන වියදම් | (235,480,884) | (246,473,154) |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | (6,483,097) | (23,541,790) |
| ස්ථාවර වත්කම් (ගොඩනැගිලි අත්පත් කරගැනීම්) | (255,126) | (10,869,990) |
| ස්ථාවර වත්කම් (වාහන) | (122,800) | (118,000) |
| උපකරණ හා පිරියත මිලදී ගැනීම් | (507,375) | (23,275,188) |
| ආයෝජන | 815,663 | 300,000 |
| මෝටර් සයිකල් සහ වාහන හුවමාරු | - | 237,912 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(242,033,618)** | **(303,740,210)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - සාමාන්‍ය වැඩසටහන් | 119,102,000 | 233,230,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන - විශේෂ ව්‍යාපෘති | 50,000,000 | 156,510,033 |
| නොතිම් වැඩ | (291,648) | (17,189,232) |
| පාරිතෝෂික ගෙවීම් | (822,466) | (966,029) |
| | **167,987,887** | **371,584,772** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම** | (55,907,989) | 57,300,537 |
| **ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ වල ශේෂය** | 61,478,247 | 4,177,710 |
| **අවසාන මුදල් හා මුදල් සමාන දෑ වල ශේෂය (සටහන් 06)** | **5,570,258** | **61,478,247** |

මෙම මූල්‍ය ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන, අංක 67 සිට 91 දක්වා වන පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සමග සමගාමීව කියවිය යුතුය.

මීට අදාල විගණන වාර්තාව අංක 51 සිට 61 දක්වා වන පිටුවල දැක්වේ.

වරහන්තුල දැක්වෙන සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති හා
# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් - 2011

## 01. වාර්තාකරන ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන, 1996 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියට අදාලවේ. එම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, මාතර, වල්ගම - උතුර, මාතොටගම, අංක 15 දරන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 සංස්ථාපිත තොරතුරු

### 1.2.1. දැක්ම

අපගේ දැක්ම වනුයේ, "තරුණ තරුණියන්හට ආකර්ශණීය හා අභියෝගාත්මක ඉඩප්‍රස්ථා සලස්වමින්, වේගවත්ව වර්ධනයවන ආසියානු පැසිෆික් කලාපයට, පිවිසුම් මාර්ගයක් ලෙස මෙම ප්‍රදේශය විවෘත කරමින්, පාරිසරික ලෙස ධරණීය සහ සංස්කෘතිකමය වශයෙන් උද්දීපනය වූ පරිසරයක්තුළ, ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වූ දක්ෂිණ ලංකාවක් නිර්මාණය කිරීමයි"

### 1.2.2. මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ, "අභියෝගාත්මක ඉඩප්‍රස්ථාවන් ලබාදෙන පරිසරයක් සහ උසස් ජීවන තත්වයක්තුළ, ප්‍රදේශයේ සම්පත් හා අවශ්‍යතා සියුම්ව හඳුනාගනිමින් හා පුද්ගලික අංශයේ හා රේඛීය නියෝජිතායතනවල සම්බන්ධීකරණයෙන්, සැලසුම් කිරීමෙන් හා සංවර්ධනය කිරීමෙන්, ඉලක්කගත මට්ටමේ ඒක පුද්ගල ආදායම් මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වෙමින්, ප්‍රදේශයේ දළ දේශීය නිෂ්පාදනයේ වේගවත් වර්ධනයට දායක වීමයි."

### 1.2.3 බල ප්‍රදේශය

1996 අංක 18 දරන ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරි පනතේ 3 (1) වගන්තියට අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ, 2001-12-20 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළමු කොටසේ, 1 අනු කොටසට අනුව, මෙම අධිකාරියේ බලප්‍රදේශය වන්නේ, ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් වසම් දෙක ඇතුළත් භූමි ප්‍රදේශයයි.

### 1.2.4 කාර්ය මණ්ඩල තොරතුරු

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | - | 03 |
| තෘතික මට්ටම | - | 90 |
| ද්විතික මට්ටම | - | 95 |
| ප්‍රාථමික මට්ටම | - | 78 |
| එකතුව | - | **266** |

## 02. ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා දකුණු සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන, පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව මෙන්ම, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතවල මගපෙන්වීමට අනුව සහ ඓතිහාසික පිරිවැය සංකල්ප පදනමට පිළියෙල කරනු ලැබ ඇත. තවද, ඓතිහාසික පිරිවැය, මැනීම් පදනම ලෙසින් භාවිතා කරනු ලැබ ඇත. එමෙන්ම, ගිණුම් කාලයට අදාල ආදායම් සහ වියදම්, උපචිත පදනමට, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලැබ ඇත. අදාල සහ යෝග්‍ය තැන්හිදී, ආදායම් සහ වියදම් පිළිබඳ පැහැදිලිකිරීම් සටහන් මගින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

### 2.2 වාර්තාකරන කාලය

මූල්‍ය ප්‍රකාශනවලට අදාල වාර්තා කිරීමේ කාලය වන්නේ, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයයි.

### 2.3 ගිණුම් අනුමත කිරීම

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2012-02-24 දින මෙම අවසාන ගිණුම් අනුමත කරනු ලැබ ඇත.

## 03. වත්කම් සහ එම වත්කම් අගය කිරීමේ පදනම්

### (අ) ජංගම වත්කම්

ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ශේෂ පත්‍රයේ දක්වා ඇති වත්කම් අතරට අතැති මුදල් ශේෂ, බැංකු ගිණුම්වල ශේෂ සහ අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයට අදාල කාලය තුළදී හෝ වාර්තාකරන දිනයේ සිට වර්ෂයක් තුළදී යන කාල දෙකෙන් අඩු කාලයක් තුළදී මුදල් වශයෙන් උපලබ්ධි වෙතැයි අපේක්ෂිත අනෙකුත් ජංගම වත්කම් අයත් වේ.

### (ආ) දේපල, යන්ත්‍ර සහ උපකරණ

#### (i) හඳුනාගැනීම සහ මැනීම

දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන්, පිරිවැයට / ප්‍රත්‍යාගණිත වටිනාකමට අගය කොට, එම වටිනාකමෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවලට අදාල පාඩු වටිනාකම අඩුකොට ශුද්ධ පොත් අගයට පෙන්නුම් කරනු ලබයි. පිරිවැයට, වත්කම පවරාගැනීමට අදාලව ඍජුව ආරෝපනය කළ හැකි වියදම ඇතුළත් වේ. ස්ව ඉදිකිරීම් පිරිවැයට, ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය සහ එම වත්කම අපේක්ෂිත ප්‍රයෝජනයට යොදාගත හැකි තත්වයට පත්කරලීමට අදාල ඍජුව ආරෝපනය කළ හැකි අනෙකුත් පිරිවැය, යම් යම් වත්කම් අයිතමයන් ගැලවීමේ සහ ඉවත්කිරීමේ සහ එම අයිතමයන් අදාල ස්ථානවල ස්ථාපිත කිරීමේ පිරිවැය ඇතුළත් වේ. ඉඩම්, අදාල පරිදි, ඒවායේ පිරිවැයට හෝ රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකමට අගය කොට පෙන්නුම් කරනු ලැබ ඇත.

දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයක කොටස්වලට වෙනස් වූ ජීවිත කාලයක් ඇති විට ඒවා දේපල, යන්ත්‍ර සහ උපකරණවලින් වෙන්වූ අයිතමයන් ලෙස (ප්‍රධාන උපාංගයන් ලෙස) ගිණුම්ගත කරනු ලැබ ඇත.

දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් බැහැරකිරීමේදී ඇතිවන ලාභ හෝ අලාභ, එම බැහැරකිරීම් ආදායම, දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන්හි වර්තමාන වටිනාකම් සමග සැසඳීමෙන් නිශ්චය කරනු ලබන අතර, එම ලාභ හෝ අලාභ, ප්‍රාග්ධන/සංවර්ධන ආදායම් ගිණුමේ ශුද්ධ වටිනාකම ලෙසින් හඳුනාගනු ලැබ ඇත.

### (ii) ආනුසංගික පිරිවැය

දේපල, යන්ත්‍ර සහ උපකරණවල කොටසක් ප්‍රතිශ්ඨාපනය කිරීමේදී, එම කොටස, එහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට ගලාඒමේ හැකියාවක් ඇතිවිට සහ එම කොටසේ පිරිවැය විශ්වාසදායී ලෙස අගය කළ හැකි විටදී, එම ප්‍රතිශ්ඨාපන අගයට හඳුනාගනු ලැබ ඇත. එලෙස ප්‍රතිශ්ඨාපනය කරන අයිතම් කොටසේ වත්මන් අගය හඳුනාගනු ලබන්නේ නැත. දේපල, යන්ත්‍ර සහ උපකරණවල දෛනික සේවා කිරීමේ පිරිවැය, ඒවා දරන කාලයට අදාල ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබ ඇත.

### (iii) ක්ෂයවීම්

එක් එක් බාණ්ඩ සඳහා වත්කම් ක්ෂයවීම් පිළිබඳ සමස්ථ ආයතනයේ ප්‍රතිපත්තිය වන්නේ, මිලදී ගත් වර්ෂය සඳහා මුළු වර්ෂයට ක්ෂය කිරීම සහ ඉවත් කරන වර්ෂයේ ක්ෂය නොකිරීමත්ය. වත්කම්වල පිරිවැය පදනම් කොට ගෙන, පහත දැක්වෙන ප්‍රතිශතයන් යටතේ, අදාල වත්කම් ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලීබඩු හා වෙනත් උපකරණ | 10% |
| විදුලි උපකරණ | 20% |
| මෝටර් රථ වාහන | 20% |
| සන්නිවේදන උපකරණ | 15% |
| පුහුණු උපකරණ | 25% |
| නාම පුවරු | 10% |

## 04. වෙළඳ හා අනෙකුත් තොග

විවිධ පාරිභෝගික ද්‍රව්‍ය සහ විවිධ බඩු වට්ටෝරු තොග මීට ඇතුළත් වේ. කෙසේවුවද, එම තොගවලින් බොහොමයක් කාර්යාල ලිපි ද්‍රව්‍ය හා අඩු වටිනාකම් සහිත බඩු වට්ටෝරු තොග වේ. එම තොග, පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි වටිනකාම යන වටිනාකම්වලින් වඩා අඩු වටිනාකමට අගය කරනු ලැබේ. ව්‍යාපාරික සාමාන්‍ය කටයුතුවලදී අදාල වන විකුණුම් මිලෙන්, අදාල තොග තවදුරටත් සම්පූර්ණ කිරීමට අදාල ඇස්තමේන්තුගත පිරිවැය සහ ඒවා අලෙවි කිරීමට අදාල පිරිවැය අඩුකිරීමෙන් පසු, ශුද්ධ උපලබ්ධි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.

ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ මූලධර්මයට අනුව, අදාල තොගවල පිරිවැය ගණනය කරනු ලබන අතර, එම පිරිවැයට, අදාල තොග අත්කරගැනීමට අදාලව දරන ලද වියදම් සහ අදාල තොග පවත්න් ස්ථානයට ගෙන ඒමට සහ එම තත්වයට පත්කිරීමට අදාලව දරන ලද වියදම්ද ඇතුළත් වේ.

## 05. ලැබිය යුතු ආදායම්

ලැබිය යුතු ආදායම්, ඒවා උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වටිනාකම්වලින්, බොල් ණය සහ ලැබේයැයි සැක සහිත ලැබීම් අඩුකල පසු ලැබෙන ශුද්ධ අගයට පොත්වල ඇතුළත් කොට ඉදිරිපත් කොට ඇත.

## 06. සේවක ප්‍රතිලාභ

### (i) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත අනුව සහ 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත සහ ඊට අදාල සංශෝධන පනත්වලට අනුව, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක සහ සේවක භාරකාර අරමුදලට **3%** ක දායකත්වයක් ලබාදෙනු ලබයි.

### (ii) සේවක ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව, සේවා කාලය එක් වසරක් සම්පූර්ණ වූ සියළු සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික මුදල් වෙනුවෙන් ගිණුම්වල වෙන්කිරීම් කරනු ලැබ, මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබ ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික අරමුදල් ගෙවීම් සම්බන්ධ පනතේ විධි විධාන ප්‍රකාරව, සේවකයෙකු වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් මීට අදාල ගෙවීම් පිළිබඳ වගකීම ඇතිවේ. එම වගකීමට සමාන අරමුදලක් බාහිරව ඇතිකර නැති අතර, එවැනි වටිනාකමක් අන්‍යආකාරයෙන් අගයකිරීමක් හෝ සිදුකර නොමැත.

අධිකාරියේ 266 ක් වූ මුළු සේවක මණ්ඩලයෙන්, 265 ක් වූ සේවක සංඛ්‍යාවක්, විශ්‍රාම පාරිතෝෂික හිමිකම් සඳහා සුදුසුකම් ලබා ඇත. 2011 වර්ෂයට අදාල විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම රු. 12,362,617.45 ක් වන අතර, 2011-12-31 දිනට විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ මුළු වෙන් කිරීම් ශේෂය රු. 34,808,656.95 කි.

## 07. ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම්

සියළු ද්‍රව්‍ය බැඳීම් හා අසම්භාව්‍ය බැරකම් සැලකිල්ලට භාජනය කරනු ලැබ ඇත. තවද, අවශ්‍යතැන්හිදී, ඒවාට අදාල ගැලපීම් සහ / හෝ හෙළිදරව්කිරීම් කරනු ලැබ ඇත.

අසම්භාව්‍යයන් යනු, අතීත සිද්ධි හේතුකොටගෙන, පැන නගින, ඇතිවිය හැකි වත්කම් හා බැඳීම්ය. අධිකාරියේ පාලනයෙන් තොර, අනාගත අවිනිශ්චිත සිද්ධීන්වල සිදුවීම හෝ නොසිදුවීම පදනම් කොට ගෙන එම අසම්භාව්‍යයන් තහවුරු කරනු ලබයි.

### 7.1 කුදුරුදූවවත්ත - ගාල්ල

අක්කර 19 රූඩ් 02 පර්චස් 14.1 ක පරිමාව ඇති මෙම ඉඩම, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ පවරාගනු ලැබ, 1998-09-29 දිනැති අංක 1044 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත්කර ඇති ඉඩමකි. මෙම ඉඩම පවරාගැනීම වෙනුවෙන්, ඉඩමේ සිටි පදිංචිකරුවන් 29 දෙනෙකු සඳහා රු.10,869,989.60 ක මුදලක් ගෙවන ලදී. මීට අදාලව ගෙවිය යුතු හිඟ පොළී මුදලේ ඇස්තමේන්තුගත වටිනාකම රු. 6,675,954/-කි.

## 08. ආදායම්

### (i) ආදායම් හඳුනාගැනීම්

අධිකාරියේ ආදායම් ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රදානවලින් සමන්විතය. එම ප්‍රදානවලට, පුනරාවර්තන ප්‍රදාන සහ දිගු කාලීන ප්‍රාග්ධන / සංවර්ධන ප්‍රදාන ඇතුළත් වේ. එම ප්‍රදානයන් හඳුනාගනු ලබන්නේ, පිරිවැයට / සාධාරණ අගයට, මුදල් පදනමට වන ආදායම් වශයෙනි. මීට අදාල වියදම්, උපචිත පදනම මත හඳුනාගනු ලබයි.

අනෙකුත්, පුනරාවර්තන සහ ප්‍රාග්ධන ස්වභාවයේ ආදායම් උපචිත පදනමට හඳුනාගෙන, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරනු ලැබ ඇත. කිසියම් ආදායමක් අයකරගැනීමට අදාලව සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින්නේ නම්, එවැනි ආදායම් හඳුනාගනු ලබන්නේ නැත.

### (ii) කුළී සහ අනෙකුත් ආදායම්

බාහිර ව්‍යවසායකයින්ට සහ ආයෝජකයින්ට දෙනු ලැබ ඇති දේපල සම්බන්ධ කුළී ආදායම්, උපචිත පදනමට හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු ලැබ ඇත.

## 09. අනෙකුත් ගෙවීම්

අනෙකුත් ගෙවීම් පිරිවැයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු ලැබ ඇත.

## 10. වියදම්

### (i) වියදම් හඳුනාගැනීම

අධිකාරිය පවත්වාගෙන යාමට අදාලව සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ඒවා නඩත්තු කිරීමට අදාලව දරනු ලබන සියළු වියදම් වර්ෂයට අදාල ඌණතාවය හෝ අතිරික්තය සොයා ගැනීම සඳහා ආදායමට එරෙහිව ලියා හරිනු ලැබ ඇත.

අධිකාරියේ ආදායම් ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා හෝ අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අදාල වන ස්ථාවර ස්වභාවයේ වත්කම් පවරාගැනීමේ, පුළුල් කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ අරමුණින් දරන ලද වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස හඳුනාගනු ලැබ ඇත.

